**මාසික මහ සභා රැස්වීම් වාර්තාව**

ස්ථානය :- රඹුක්කන ප්‍රාදේශීය සභාව
දිනය :- 2025.08.05
වේලාව :- පෙ.ව. 10.00

**සහභාගිත්වය**

ගරු සභාපති ,
1. ආර්.එම්.එස්.එස්.බි.රත්නායක මැතිතුමා

ගරු උපසභාපති ,
2.ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී/මන්ත්‍රිනී,

3. වයි.ජී.ජයවීර මැතිතුමා
4. ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා
5. ඩබ්.එන්.සුරංජනී සෝමදාස මැතිතුමිය
6. පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා
7. එම්.එන්.මොහම්මදු සුක්රි මැතිතුමා
8. එස්.එම්.ගාමිණී සමරකෝන් මැතිතුමා
9. එන්.ඒ.සුසාන්ත විමලරත්න මැතිතුමා
10. කේ.සී.සරත් කුමාර මැතිතුමා
11. එම්.වී.ප්‍රියන්ත එදිරිසූරිය මැතිතුමා
12. ජේ.පී.පද්මසිරි මැතිතුමා
13. එච්.එස්.කැලුම් කුමාර මැතිතුමා
14. පී.ජී.එස්.සමන් කුමාරි මැතිතුමිය
15. එස්.ඒ.එන්.ක්‍රිෂාන්ත සේනාරත්න මැතිතුමා
16. එච්.අයි.ඩී.හත්නාගොඩ මැතිතුමා
17. එම්.ඒ.ආර්.සමන් කුමාර මැතිතුමා
18. වී.ආර්.ඊ.නිසංසලා වීරබණ්ඩාර මැතිතුමිය
19. එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා
20. ටී.එම්.ටිකිරි බංඩා මැතිතුමා
21. ඒ.කේ.මොහොම්මඩ් අනීස් මැතිතුමා
22. පී.ජී.මල්ලිකා මැතිතුමිය
23. ඒ.ඒ.තරංග නුවන් ප්‍රසන්න මැතිතුමා
24. එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා
25. පී.ජී.එන්.ප්‍රියංජිත් රාජපක්ෂ මැතිතුමා
26. එච්.ජී.එල්.සරත් කුමාර මැතිතුමා
27. කේ.පී.දුමින්ද ප්‍රේමසිරි මැතිතුමා
28. වී.ආර්.නන්දික බණ්ඩාරනායක මැතිතුමා
29. පී.ජී.ආර්.කිත්සිරි සුමනරත්න මැතිතුමා
30. එච්.ආර්.ප්‍රදිපා රංජනී මැතිතුමිය
31. ජී.ඩී.නිරංජලා ජිනදාස මැතිතුමිය
32. එම්.ආර්.එන්.එම්.ජයසුන්දර මැතිතුමිය
33. ඩී.එල්.සී.සිසිර කුමාර මැතිතුමා
34. ඩබ්.ජී.ජයතිස්ස මැතිතුමා
35. ඩබ්.ජී.කරුණාවතී මැතිතුමිය

**නිලධාරී සහභාගිත්වය**

- ආර්.ජී.එස්.නිරෝෂන් මයා - ලේකම්

**ආගම සිහිකිරීම**

රැස්වීමට පැමිණ සිටි සියලුදෙනා තම තමන්ගේ ආගම සිහිකිරීමෙන් අනතුරුව 2025.08.05 දින මහසභා රැස්වීමට සහභාගි වූ නවක මන්ත්‍රීතුමන්ලා හා මන්ත්‍රීතුමියන්ලා ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් සාදරයෙන් පිළිගන්නා ලදි.ඉන් අනතුරු රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලද

**(අ). 2025.07.08 දින පැවති මාසික මහා සභා වාර්තාව සම්මත කිරීම.**

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

2025.07.08 දින පැවැත්වූ මාසික මහා සභා රැස්වීම් වාර්තාව කියවූවා සේ සලකා විරෝධතා හෝ නිවැරදි කිරීම් තිබේ නම් ඉදිරිපත් කරන ලෙස ද එසේ නොමැති නම් 2025.07.08 දින පැවැත්වූ මාසික මහා සභා රැස්වීම් වාර්තාව ලියා ඇති පරිදි සභා සම්මත කරන ලෙස ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

**2025.08.05 දින න්‍යාය පත්‍රය සංශෝධන**

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

**01.යෝජනා - (ඊ):1:iv**

කොම්පෝස්ට් ව්‍යාපෘතිය තුළ ගොඩගැසී ඇති කසල හිරිවඩුන්න හල්පිටිය ප්‍රදේශයට බැහැර කිරීමේ ඇස්තමේන්තුවට 2025/02/27 දින පැවති ප්‍රතිපත්ති හා තීරණ ගැනීමට සහයවීමේ කමිටුව මඟින් අනුමැතිය ලබා දී ඇති අතර එහි පළමු අදියර සිදු කිරීමට ටිපර් රථ හා ස්කැවේටර් යන්ත්‍ර යොදා ගනිමින් රු500,000.00 යටතේ සිදු කිරීමට ලේකම් තීරණ ලබා දී ඇත.නමුත් පළමු අදියර සිදු කරගෙන යාමේදී රු500,000.00 ක් ප්‍රමාණවත් නොවන බව තහවුරු වූ බැවින් පළමු අදියර අවසන් කර ගැනීම සඳහා එම ප්‍රතිපාදන මුදල රු1,000,000.00 ක් දක්වා වැඩි කර ගැනීමට ලෙස සංශෝධන කර යෝජනා කරමි.

02.ගෙවීම් -(ඊ):13:iii

කොම්පෝස්ට් ව්‍යාපෘතිය තුළ ගොඩගැසී ඇති කසල හිරිවඩුන්න හල්පිටිය ප්‍රදේශයට බැහැර කිරීමේ පළමු අදියර කසල පැටවීම හා තුනී කිරීම සහ පස් පැටවීම හා තුනී කිරීම සඳහා යොදවා ගනු ලැබූ ස්කැවේටර් යන්ත්‍රයට අදාළ රු93,060.00 ක කුලී මුදල එහි සැපයුම්කරු වන H.M.I.J.කුරුකුලසූරිය යන අයට ගෙවීම ලෙස සංශෝධන කරමි.

03.ගෙවීම් -(ඊ):13:iv

කොම්පෝස්ට් ව්‍යාපෘතිය තුළ ගොඩගැසී ඇති කසල හිරිවඩුන්න හල්පිටිය ප්‍රදේශයට බැහැර කිරීමේ පළමු අදියරය කසල සහ පස් ප්‍රවාහනය සඳහා කියුබ් 01 ටිපර් රථ යොදවා ගැනීමට අදාළව රු765,000.00 ක කුලී මුදල් ටිපර් රථ සැපයුම්කරු වන H.M.I.J.කුරුකුලසූරිය යන අයට ගෙවීම ලෙස සංශෝධන කරමි.

04. යෝජනා -(ඊ):11

ඉහත අංකය යටතේ යෝජනාවේ මන්ත්‍රීතුමාගේ නම ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.රුක්මන් අනුර කුමාර මැතිතුමා ලෙස සටහන් වී ඇති බැවින් එය ගරු උපසභාපති ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා ලෙස නිවැරදි කර සංශෝධන කරමි.

**2025.07.08 වාර්තාවේ සංශෝධන**

දෙවැනි පිටුවේ සඳහන් 2025.07.08 දින පැවැත්වූ මාසික මහා සභා රැස්වීම් වාර්තාව ලෙස සටහන් වීඇත.එය 2025.06.20 දින ලෙස නිවැරදි විය යුතු බවටත්,තුන්වැනි පිටුවේ ගරු උපසභාපතිතුමා ප්‍රකාශයේ 2025.07.08 දින මහසභා වාර්තාව සංශෝධන සහිතව සභා සම්මත කිරීමට යෝජනා කරන ලදි. ලෙස සටහන් වී ඇත.එහි දිනය 2025.06.20 ලෙස නිවැරදි විය යුතු බවත්,ඒ අනුව 2025.07.08 දිනැති මහසභා වාර්තාව සංශෝධන සහිතව සභා සම්මත විය.ලෙස සටහන් වී ඇත.එහි ද දිනය 2025.06.20 ලෙස නිවැරදි විය යුතු බවත්,ගරු සභාපතිතුමාගේ ප්‍රකාශයේ 2025.07.08 දිනැති මහාසභා වාර්තාව සංශෝධන සහිතව සභා සම්මත වූ බව ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශයට පත් කරන ලදි ලෙස සටහන් වී ඇත. එහි ද දිනය 2025.06.20 ලෙස නිවැරදි විය යුතු බවට සංශෝධන යටතේ ප්‍රකාශ කරන ලදි.

2025.07.08 දින මාසික මහා සභා රැස්වීම් වාර්තාවේ පිටු අංක හතරෙහි සඳහන් අංකය (ඊ):1:i යටතේ යෝජනාවේ පුනරාවර්තන වියදම් වල සභික දීමනා සහ කාර්ය මණ්ඩල වැටුප් ,අනෙකුත් දීමනා රු. ලක්ෂ 70 ක උපරිමය දක්වා ගෙවීම ලෙස සටහන් වී ඇත.එම උපරිමය දක්වා ගෙවීම රු ලක්ෂ 78 ක් ලෙස නිවැරදි කර සංශෝධනය යටතේ ප්‍රකාශ කරන ලදි.

පිටු අංක 05 යටතේ සඳහන් අපිට මාසික දුරකථන හා ඉන්ධන දීමනා රු8000.00 හා රු5000.00 ලෙස ගෙවීම් කර ඇති බව සටහන් වී ඇති බැවින් එය දුරකථන හා ඉන්ධන දීමනා ලෙස රු3000.00 ක් හා රු5000.00 ක් වශයෙන් උපරිමය රු8000.00 ක් මීට පෙර ගෙවීම් කර ඇත.අලුත් නීතිය අනුව ගමන් වියදම්,යැපීම් දීමනා ලෙස රු8000.00 ක උපරිමයකට යටත්ව ගෙවීමට සීමා කර ඇති බවට සංශෝධනය යටතේ ප්‍රකාශ කරන ලදි.

පිටු අංක 05 යටතේ සඳහන් කාරක සභා සාකච්ඡාව වාර්තා ගත නොකරන බැවින් නිලධාරින්ගේ පැහැදිලි කිරිම මහාසභා වර්තාවට ඇතුළත් කළ නොහැකි බැවින් එම කොටස ඉවත් කළ යුතු බවත්,කාරක සභා සාකච්ඡාව නිමකර මහාසභාවක් බවට පත් කිරිම සුදුසු බවට ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු උපසභාපති ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.ලෙස නිවැරදි විය යුතු බවට සංශෝධනය යටතේ ප්‍රකාශ කරන ලදි.

පිටු අංක 15 යටතේ ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් සාකච්ඡා කළ කොටසේ උපාලි රෝහණ මන්ත්‍රීතුමා යනුවෙන් සඳහන් වී ඇත.එය එම්.ජී.ආර්.සමන් කුමාර මන්ත්‍රීතුමා ලෙස නිවැරදි විය යුතු බවට සංශෝධනය යටතේ ප්‍රකාශ කරන ලදි.

පිටු අංක 16 හි සඳහන් තක්සේරු මුදල පිළිබඳ දැන ගැනිමට ඉල්ලා සිටි වර්ෂය 2026 ලෙස සටහන් වී ඇති නමුත් එය 2025 වර්ෂය ලෙස නිවැරදි විය යුතු බවත්,ගරු සභාපතිතුමාගේ ප්‍රකාශයේ එය ලබන වාරයේදී සාකච්ඡා කරන බව ලෙස සටහන් වී ඇති නමුත් එය මේ සභාවාරයේ දී ඉදිරිපත් කරනවා ලෙස නිවැරදි වියයුතු බවත්,මාළු,මස් කඩ සඳහා තරඟකාරිත්වය රු ලක්ෂ 18 කට ඇති වු නමුත් ඉස්සර වෙලා ගියේ දේශපාලන අධිකාරියේ බලපෑම මත ලෙස සටහන් වී ඇති නමුත් එහි මස් කඩ යන වචනය ඉවත් කර දේශපාලන මැදිහත් වීම මත ලෙස නිවැරදි විය යුතු බවට සංශෝධනය යටතේ ප්‍රකාශ කරන ලදි.

පිටු අංක 02 හි සභාවාර්තාව සම්මත කළපසු සංශෝධන ඉදිරිපත් කළ හැකිය.අදහස් ප්‍රකාශ කිරිමට නොහැකි බවත් ඒ ගැන නොදන්නවා නම් විවාද නොකර උප සභාපතිතුමා වාඩි කර ගන්නා ලෙසට ඔබතුමාගෙන් ඉල්ලා සිටි බව සඳහන් වී නොමැති බැවින් එය සඳහන් විය යුතු බවට සංශෝධනය යටතේ ප්‍රකාශ කරන ලදි.

පිටු අංක 03 හි සඳහන් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමාගේ ප්‍රකාශය වාඩි වී සිදු කළ බැවින් එය සභා වාර්තාවට දැමිය නොහැකි බවට සංශෝධනය යටතේ ප්‍රකාශ කරන ලදි.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා**

මා එම අදහස් ප්‍රකාශ කලේ නැගිසිට අවසර ලබා ගෙන බවත්, මට තේරේන ආකාරයට අපව නොමඟ යැවීමක් සිදු කරනවාද යන්න පවසන ලදි.

පිටු අංක 05 හි සඳහන් පැය දෙකක වැඩකට යන්නේ නම් මෙය ගැනිමට නොහැකිය.ලෙස සටහන් වී ඇත.එය මහාජන නියෝජිතයන් සඳහා පැය 24 ක නිශ්චිත කාලයක සේවාවක් සටහන් කරන්නේ කෙසෙද යනුවෙන් ප්‍රකාශ කළ බවට නිවැරදි විය යුතු බව සංශෝධනය යටතේ ප්‍රකාශ කරන ලදි.

හත්වන පිටුවේ සඳහන් පෝස්ට් එකක් දමලා තිබෙනවා යනුවෙන් සඳහන් වී ඇත. එය සමාජ මාධ්‍යවල පෝස්ට්(post) එකක් දමා තිබෙන ලෙස නිවැරදි විය යුතු බවත්,සභා වාර්තාවේ කරුණු අඩුවෙන්ම ඉදිරිපත් වී ඇති සභා වාර්තාව මේ වාර්තාව ලෙස සටහන් වී ඇත එය වැරදි වැඩිම සභා වාර්තාව මේ සභා වාර්තාව ලෙස නිවැරදි වීමත්,දහනම වන පිටුවේ සඳහන් කාර්මික රැස්වීම් ලෙස සටහන් වී ඇත. එය කාර්යාලීය රැස්වීම් ලෙස නිවැරදි විය යුතු බවට සංශෝධන යටතේ ප්‍රකාශ කරන ලදි.

පිටු අංක 34 හි සඳහන් අයිතිකරුගෙන් මේවන විට ප්‍රජා මාර්ගයකට කැමති බවට අත්සන් කර ගෙන ඇති බව ලෙස සටහන් වී ඇති නමුත් එය මාර්ගය පළල් කිරිමට ලිපියක් අත්සන් කර ගෙන ඇති බවට නිවැරදි විය යුතු බවත්,අඩි 60 ක් දිග අඩි 2 ක්උස බැම්මක් නොව අඩි 60 දිග අඩි 2 ක බැම්මක් ලෙස නිවැරදි වීමත්,කිරිවල්ලාපිටියෙත් තිබෙනවා ලෙස සඳහන් වී ඇත එය කිරිවල්ලාපිටියේ සුසාන භූමියේ තිබෙනවා ලෙස නිවැරදි විය යුතු බවට සංශෝධන යටතේ ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා මැතිතුමා**

2025.07.08 දිනැති මහාසභා වාර්තාව ඉදිරිපත් කර ඇති සංශෝධන යටත්ව සභා සම්මත කිරිම සුදුසු බව ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් යෝජනා කරන ලදි.එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි. ඒ අනුව 2025.07.08 දිනැති මහාසභා වාර්තාව ඉදිරිපත් කරන ලද සංශෝධන යටත්ව සභා සම්මත විය.

**(ආ).සභාපතිතුමා විසින් කරන විශේෂ නිවේදන ඉදිරිපත් කිරිම.**

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

1.පරාක්‍රම ප්‍රාථමික විද්‍යාල මාර්ගය වන්වේ කිරිමට තීන්දු කර තිබීම.

2.රෝහල මාර්ගයේ කෝවිල සිට රෝහල දක්වා මාර්ග කොටස වාහන නැවැත්වීම සඳහා සුදානම් කර ඇත.

3.නගරය ආවරණය වන පරිදි CCTV පද්ධතියක් ක්‍රියාත්මක කිරිමට සාකච්ඡා කරමින් සිටින බවට ප්‍රකාශ කරන ලදි.

**(ඇ).සභා රැස්වීමේ නොපැමිණ සිටීමේ අවසරය සඳහා වන යෝජනා**

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එස්.කුමාර රාමනායක මැතිතුමාගේ හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ආර්.ඉන්දික සමන් කුමාර මැතිතුමාගේ නිවාඩු ලබා ගැනිම පිළිබඳ නිවේදන ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් ගරු සභාවට යෝජනා කරන ලදි. සභා රැස්වීමේ නොපැමිණ සිටීමේ අවසරය සඳහා වන යෝජනා ගරු උප සභාපති ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

i. අසනිප බැවින් 2025.08.05 දින පැවැත්වෙන මහ සභාවට සහභාගී විය නොහැකි බව දන්වා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එස්.කුමාර රාමනායක මැතිතුමා විසින් යොමු කර ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් ගරු මහා සභාවට ඉදිරිපත් කරන ලදි.ඒ අනුව 2025.08.05 දින පැවැත්වෙන මහා සභාවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එස්.කුමාර රාමනායක මැතිතුමා සහභාගි විය නොහැකි බැවින් නිවාඩු ලබාදිම සුදුසු බවට ගරු මහා සභාව විසින් අනුමත කරන ලදි.

ii. හදිසි අසනිප තත්වයක නිසා 2025.08.05 දින පැවැත්වෙන මහ සභාවට සහභාගී විය නොහැකි බව දන්වා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ආර්.ඉන්දික සමන් කුමාර මැතිතුමා විසින් යොමු කර ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් ගරු මහාසභාවට ඉදිරිපත් කරන ලදි.ඒ අනුව 2025.08.05 දින පැවැත්වෙන මහාසභාවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ආර්.ඉන්දික සමන් කුමාර මැතිතුමා සහභාගි විය නොහැකි බැවින් නිවාඩු ලබාදිම සුදුසු බවට ගරු මහාසභාව විසින් අනුමත කරන ලදි.

**(ඇ).සංදේශ,පෙත්සම්,පැමිණිලි ඉදිරිපත් කිරිම**

අද දින සංදේශ,පෙත්සම්,පැමිණිලි ඉදිරිපත් කිරිමට නොමැති බව ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

**(ඉ).යථාපරිදි කල්දී ඇති ප්‍රශ්න**

අද දින ඉදිරිපත් කිරිමට කල් දී ඇති ප්‍රශ්න නොමැති බව ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

**(ඊ). යථාපරිදි කල්දී ඇති යෝජනා**

**1.ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

(i) සිට (xv) දක්වා ඇති යෝජනා ගරු සභාපතිතුමන් විසින් සංශෝධන සහිතව ඉදිරිපත් කරන ලදි.එම යෝජනා සංශෝධන සහිතව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

i. කොම්පෝස්ට් අංගන අලුත්වැඩියා කිරිම (ගස කඩා වැටීමෙන් සිදු වූ හානිය)ඇස්තමේන්තු(රු 1,340,000.00) හා ක්‍රියාත්මක කිරිමට සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

රු1,340,000.00 ක ඇස්තමේන්තුව අනුමත කිරිමට තීරණය විය.

ii. මෙම සභාව සඳහා මු.රෙ.71 යටතේ කාර්මික නිලධාරි තනතුරු 05 ක් ඇති කිරිම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

මු.රෙ.71 යටතේ කාර්මික නිලධාරි තනතුරු 05 ක් ඇති කිරිමට අනුමත කිරිම තීරණය විය.

iii. රඹුක්කන ප්‍රාදේශීය සභාව සතු නිෂ්කාර්ය වාහන හා යන්ත්‍ර 09 ක නිරීක්ෂණ ඇතුලත් වාර්තාව අනුමත කිරිමට සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය-

නිෂ්කාර්ය වාහන හා යන්ත්‍ර 09 ක නිරීක්ෂණ ඇතුලත් වාර්තාව අනුමත කිරිම තීරණය විය.

iv. කොම්පෝස්ට් ව්‍යාපෘතිය තුළ ගොඩගැසී ඇති කසල හල්පිටිය ප්‍රදේශයට බැහැර කිරිමේ පළමු අදියරය සඳහා රු500,000.00 ක් යටතේ සිදුකර ලීමට 2025.02.27 දින කමිටු අනුමැතිය(ප්‍රතිපත්ති

හා තීරණ ගැනීමට සහයවීමේ කමිටුව) සඳහා ලේකම් තීරණයක් ලබා දී තිබුණද එම මුදල යටතේ පළමු අදියරය අවසන් කිරිමට නොහැකි බැවින් මෙම කාර්යය අවසන් කිරිමට රු500,000.00 ඉක්මවා ප්‍රතිපාදන සපයා ගැනිමට යෝජනා කරමි.යනුවෙන් සඳහන් වුවත් එහි මුදල් ප්‍රමාණය ප්‍රමාණවත් නොමැති බැවින් එම මුදල රු1,000,000.00 ක් දක්වා සංශෝධනය කර අනුමත කිරිම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම සංශෝධනය සහිතව යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
කසල බැහැර කිරිම සඳහා රු1,000,000.00 ක මුදල අනුමත කිරිම තීරණය විය.

v. රඹුක්කන ප්‍රා/ස සතු අංක 01 කඩකාමරයෙහි බදු අයිතිකරු වන මීගොඩ යද්දෙහිගේ සෝමසිරි මයා 2023/06/07 දින මියගිය බවත්,මෙහි මීළඟ බදු අයිතිය ඔහුගේ නීත්‍යානුකූල බිරිඳ වන ගනේ ආරච්චිගේ නන්දා හේරත් මහත්මිය වෙත ලබා දිමට සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
නීත්‍යානුකූල බිරිඳ වන ගනේ ආරච්චිගේ නන්දා හේරත් මහත්මිය වෙත ලබා දීමට අනුමත කිරිම තීරණය විය.

vi. 2026 /2030 වර්ෂ වලට අදාළ පස්අවුරුදු සැලැස්ම සකස් කිරිම සඳහා යෝජනා මෙහි සඳහන් ආකෘති ප්‍රකාරව ලබා ගැනිම සඳහා ගරු මන්ත්‍රී මණ්ඩලය දැනුවත් කිරිම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
2026 /2030 වර්ෂ වලට අදාළ පස්අවුරුදු සැලැස්මට ලබා දී ඇති ආකෘති ප්‍රකාරව යෝජනා සකස් කිරිම අනුමත කිරිමට තීරණය විය.

vii. පල්පාත පොදු සුසාන භූමියට ආදාහනාගාරයක් ලබා ගැනිමට සම්බන්ධව 2025.07.23 කාර්මික කමිටු වාර්තා අනුමත කිරිම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
2025.07.23 කාර්මික කමිටු වාර්තා අනුමත කිරිමට තීරණය විය.

viii. රඹුක්කන ප්‍රාදේශීය සභාව සතු GG - 2824 අංක දරණ යතුරු පැදිය රක්ෂණය කිරිමට සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

- තෙවන පාර්ශවිය රක්ෂණය රු600.00
- පූර්ණ රක්ෂණය රු5659.29

තව ද ආදායම් බලපත්‍රයට රු6320.00 ක (2020.04.22 සිට මේ දක්වා ) හා දුම් සහතිකයට රු580.00 ක අත්තිකාරම් වශයෙන් ලබා ගැනිම.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -
GG - 2824 අංක දරණ යතුරු පැදිය රක්ෂණය කිරිම අනුමත කිරිමට තීරණය විය.

ix. 2012 අංක 21 දරණ පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 133 වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ ප්‍රාදේශීය සභා අරමුදලින් කරනු ලබන සියලු ගෙවීම් සඳහා වු චෙක්පත් හෝ අණකර සඳහා පළමු අත්සන තැබීමට ප්‍රාදේශීය සභාවේ ලේකම් ආර්.පී.එස්.නිරෝෂන් මහතාට හා දෙවන අත්සන තැබීමට ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරි,පී.ජී.එස්.කුමාරි මහත්මියට බලය පැවරීමට සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -
ඉහත දැක්වු පරිදි චෙක්පත් හෝ අණකර සඳහා අත්සන තැබීමට එම නිලධාරි දෙදෙනාට පැවරීම අනුමත කිරිම තීරණය විය.

x. පළාත් පාලන මාර්ග 2025 ,අත්‍යාවශ්‍ය මහජන ඉල්ලීම් ඉටුකිරිම යටතේ රු500,000.00 ට වැඩි ව්‍යාපෘති සඳහා සහා අරමුදල් ප්‍රමාණවත් නොවන විට දී ප්‍රතිපාදන ලබාදිම සඳහා සබරගමුව ප්‍රධාන අමාත්‍යාංශය වෙත ඇස්තමේන්තු ඉදිරිපත් කරන ලෙස දැනුම් දුන් අතර එම ව්‍යාපෘති අනුමත කිරිමට සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

1. වරාගොඩ හන්දියේ සිට තල්ගහහේන හැඳෙණිය පාර සංවර්ධනය කිරිම -රු2,000,000.00
2. කිරිවන්දෙණිය,ඊරියගොල්ල මාර්ගයේ සම්පූර්ණයෙන් කැඩී ඇති මාර්ගය අලුත්වැඩියා කිරිම -රු1,450.000.00
3. කිවුල්පන ගිණිතිල්ලවල පාර අලුත්වැඩියා කිරිම -රු1,550,000.00

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -
අදාළ ව්‍යාපෘති අනුමත කිරිමට තීරණය විය.

xi. පළාත් පාලන මාර්ග 2025 ,අත්‍යවශ්‍ය මහජන ඉල්ලීම් ඉටුකිරිම යටතේ ඇති ව්‍යාපෘති යෝජනා සහා අරමුදලින්(රු.ලක්ෂයේ ව්‍යාපෘති) ඉටු කිරිම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

1. කාඩවට්ටිය ,වල්පොල වත්තේ ලක්ෂ්මන් ජයරත්න මහතාගේ නිවස අසල ආනන්ද මහතාගේ නිවස ඉදිරිපිට අතර ඇති මාර්ගය සංවර්ධනය කිරිම -රු310,000.00
2. ඉහළගම ප්‍රධාන මාර්ගයේ ගල්වැටිහේන වැරැල්ල දක්වා මාර්ගය සංවර්ධනය කිරිම -රු240,000.00
3. කුරෙම්පොළ මාර්ගය හා මොට්ටප්පුලිය මාර්ගය යා කෙරෙන වෙළ මැද ඇති මාර්ගයේ ඉතිරි කොටස ඉදිකිරිම -රු230,000.00
4. කෙසෙල්වතුගොඩ සිට මල්බෙරිවත්ත දක්වා මාර්ගය සංවර්ධනය කිරිම -රු475,000.00
5. ගබ්බල උතුර වල්පොල පාර සංවර්ධනය කිරිම -රු390,000.00
6. කොටගම,හිරිවඩුන්න ප්‍රධාන මාර්ගයට සම්බන්ධ වන R.M.රත්නායක ජයවර්ධන මහතාගේ නිවස අසලින් ආරම්භ වන හිටිනාවත්ත පාර සංවර්ධනය කිරිම -රු310,000.00
7. දඹරහේන ඔයට බසින ස්ථානයේ පඩිපෙල ඉදිකිරිම -රු400,000.00
8. මුද්දනාව පන්සල් මාර්ගය සංවර්ධනය කිරිම -රු260,000.00

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
අදාළ ව්‍යාපෘති යෝජනා සහා අරමුදලින් ඉටු කිරිම අනුමත කිරිම තීරණය විය.

xii. RE -2261 අංක දරණ ස්ටැන්ඩඩ් ට්‍රැක්ටර් රථයේ ක්ලච් පද්ධතියේ හා සුක්කානම් පද්ධතියේ දෝෂ සඳහා හා අත්‍යවශ්‍ය අනෙක් අලුත්වැඩියා සිදු කිරිම සඳහා (ස්ටාටර් මෝටරය සහ රියදුරු අසුන සකස් කිරිම) මිහිදුපුර තරිදු මෝටර්ස් ආයතනයෙන් ලබාගත් රු208,500.00 ක මිල ඇස්තමේන්තුව අනුමත කිරිම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
රු208,500.00 ක මිල ඇස්තමේන්තුව අනුමත කිරිම තීරණය විය.

xiii. RC – 8186 අංක දරණ ස්ටැන්ඩඩ් ට්‍රැක්ටර් රථයේ ක්ලච් පද්ධතියේ හා බ්‍රේක් පද්ධතියේ පවතින දෝෂයන් හා ප්‍රේෂර් ප්ලේට් ද යෙදීම සඳහා බංගලාවත්ත,වහව,රඹුක්කන කීර්ති මෝටර් අයතනයෙන් ලබාගත් රු179,000.00 ක මිල ඇස්තමේන්තුව අනුමත කිරිම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
රු179,000.00 මිල ඇස්තමේන්තුව අනුමත කිරිම තීරණය විය.

xiv. රඹුක්කන ප්‍රා/සභාව සතු නිෂ්කාර්ය වාහන හා යන්ත්‍ර 09 වර්තමාන තත්වය හා ඒ සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියාමාර්ග වල නිර්දේශයන් ද සහිතව අනුමත කිරිමට යෝජනා කරමි.
මෙම යෝජනාව අංක 03 යටතේ ඇති බැවින් මෙය මුද්‍රණ දෝෂයක් නිසා ඉවත් කරන බවට ගරු සභාපතිතුමන් විසින් පවසන ලදි.

xv. 2025.07.01 දින සිට 2025.07.28 දක්වා උපලේඛන අංක 01 හි සඳහන් වියදම් දැරීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

| දිනය | වවුචර් අංකය | නම | විස්තරය | වටිනාකම(රු.) |
|---|---|---|---|---|
| 2025.07.02 | 701 | kegall distributous (pvt)ltd | ආදාහනාගාරයට 37.5 Kg ලිට්‍රෝ ගෑස් සිලින්ඩර 06 සැපයිම | 105,395.00 |
| | 702 | ඒ.කේ.ඩබ්. පුෂ්ෂ කුමාර | ආදාහනාගාරයට 37.5 Kg ලාෆ් ගෑස් සිලින්ඩර 06 සැපයිම සඳහා ගෙවීම | 105,395.00 |
| | 703 | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් - (ඉංජිනේරු සේවා) | ශ්‍රවණාගාර සංකිර්ණයේ උදේශන සේවා ගාස්තු ගෙවිම | 1,135,241.80 |
| | 704 | ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කොපරේෂන් | SG RV-8542 ට්‍රේලරයේ රක්ෂණ ගාස්තු ගෙවිම | 8,784.52 |
| | 705 | ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කොපරේෂන් | SG-ZA-0108 බොබ් කැට් යන්ත්‍රයේ රක්ෂණ ගාස්තු ගෙවිම | 53,533.69 |
| | 706 | ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කොපරේෂන් | නව වෙළඳ සංකීර්ණ කඩ කාමර 2025/2026 වර්ෂ සඳහා රක්ෂණය කිරිම වෙනුවෙන් ගාස්තු ගෙවිම | 112,203.49 |
| | 707 | යුනයිඩට් මෝටර්ස් ලංකා පී.එල්.සී. | PF-7429අංක දරණ L 200 කැබ් රථය අලුත් වැඩියාව (ඔයිල් ප්‍රෙෂර් ස්විචය අලුතින් දැමීම) | 5,146.10 |
| | 708 | යුනයිඩට් මෝටර්ස් ලංකා පී.එල්.සී | PF-7429 අංක දරණ L 200 කැබ් රථයේ වාර සේවාව කිරිම | 56,665.41 |
| | 709 | යුනයිඩට් මෝටර්ස් ලංකා පී.එල්.සී. | PF-7429 අංක දරණ L 200 කැබ් රථය අලුත් වැඩියාව (ටයිමින් බෙල්ට් මාරු කිරිම) | 173,430.22 |
| | 710 | මුදල් භාරකරු | වාහනවල ආදායම් බල පත්‍ර,යෝග්‍යතා සහතික,දුම් සහතික ලබා ගැනීම සඳහා අත්තිකාරම් මුදල් ලබා ගැනීම | 21,560.00 |
| | 711 | සම්පත් එන්ටප්‍රයිසස් | සෞඛ්‍ය හා සනීපාරක්ෂක ද්‍රව්‍ය සැපයීම වෙනුවෙන් ගෙවිම | 164,439.10 |
| 2025.07.07 | 712 | පි.ජී.එල් .සි. කුමාර | Rw -9023 ට්‍රැක්ටර් ටේලරයේ ටයර්මාරු කිරිම | 600.00 |
| | 713 | පි.ජී.එල් .සි. කුමාර | ZA -0191 බැකෝ යන්ත්‍රයේ අලුත්වැඩියා | 4,400.00 |
| | 714 | මුදල් භාරකරු | වාහනවල ආදායම් බල පත්‍ර,යෝග්‍යතා සහතික,දුම් සහතික ලබා ගැනීම සඳහා | - |

| | | | | |
|---|---|---|---|---|
| | | | 2025.05.23 දින ලබා ගත් අත්තිකාරම් මුදල පියවීම | |
| | 715 | ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කොපරේෂන් | 251-2198 කැබ් රථය,RW-5799 ට්‍රේලරය සඳහා ඉදිරි වසර සඳහා රක්ෂණ ගාස්තු ගෙවීම | 19,781.56 |
| | 716 | එම්.ජේ.ආර්.පීරිස් ඇන්ඩ් සන්ස් ප්‍රයිවට් ලිමිටඩ් | YU-6935 ත්‍රී විල් රථයට බැටරියක් දැමීම | 13,434.30 |
| | 717 | දිනේෂ් ට්‍රාන්ස්පෝට් සර්විස් | වීදි ලාම්පු සැපයීම වෙනුවෙන් ගෙවීම | 402,425.00 |
| | 718 | දිනේෂ් ට්‍රාන්ස්පෝට් සර්විස් | විද්‍යුත් උපකරණ සැපයිම වෙනුවෙන් ගෙවීම | 50,875.00 |
| | 719 | සී/ස විවිධ සේවා සමුපකාර සමිතිය | පෙර පාසල් දරුවන්ට තෑගි ලබා දීමට කවර මිළදී ගැනීම | 1,160.00 |
| | 720 | ඇන්තනිස් ඩිස්ට්‍රිබියුටස් ප්‍රයිවට් ලිමිටඩ් | හාඩ්වෙයාර් උපකරණ සැපයීම වෙනුවෙන් ගෙවීම | 37,527.00 |
| | 721 | එල්.එච්.චන්ද්‍රසේකර ඇන්ඩ් බ්‍රදර්ස් | ලිපි ද්‍රව්‍ය සැපයීම වෙනුවෙන් ගෙවීම | 32,892.50 |
| | 722 | පේපර් ලයින් ප්‍රයිවට් ලිමිටඩ් | ලිපි ද්‍රව්‍ය සැපයීම වෙනුවෙන් ගෙවීම | 50,125.00 |
| | 723 | නිව් ශාස්ත්‍රෝදය ප්‍රින්ටර්ස් ප්‍රයිවට් ලිමිටඩ් | මුද්‍රිත ද්‍රව්‍ය සැපයීම වෙනුවෙන් ගෙවීම | 16,800.00 |
| | 724 | නිව් ජෙනරල් ට්‍රේඩින් | ලිපි ද්‍රව්‍ය සැපයීම වෙනුවෙන් ගෙවීම | 23,483.50 |
| | 725 | නිව් ජෙනරල් ට්‍රේඩින් | ලිපි ද්‍රව්‍ය සැපයීම වෙනුවෙන් ගෙවීම | 570.00 |
| | 726 | මහේල ඉලෙක්ට්‍රිකල්ස් | විද්‍යුත් උපකරණ සැපයිම වෙනුවෙන් ගෙවීම | 22,600.00 |
| | 727 | සෙන්ට්‍රල් ස්ටේෂනරිස් | ලිපි ද්‍රව්‍ය සැපයීම වෙනුවෙන් ගෙවීම | 10,010.00 |
| | 728 | නිව් ශාස්ත්‍රෝදය ප්‍රින්ටර්ස් ප්‍රයිවට් ලිමිටඩ් | මුද්‍රිත සැපයීම වෙනුවෙන් ගෙවීම | 50,325.00 |
| | 729 | සම්පත් එන්ටප්‍රයිසස් | සෞඛ්‍ය හා සනීපාරක්ෂක ද්‍රව්‍ය සැපයීම වෙනුවෙන් ගෙවීම | 11,319.90 |
| 2025.07.08 | 730 | මුදල් භාරකරු | 2025.06.02 සිට 2025.06.30 දක්වා මන්ත්‍රී දීමනාව ගෙවීම | 478,500.00 |
| 2025.07.09 | 731 | මුදල් භාරකරු | අපද්‍රව්‍ය කළමණාකරණ ව්‍යාපෘතියටඅදාළ කම්කරු වැටුප් ගෙවීම | 134,400.00 |
| | 732 | මුදල් භාරකරු | කොන්ත්‍රාත් පදනම මත සේවයේ යෙදවූ කාර්මික නිලධාරි කේ.ඒ.එස්.ඩී.කළුආරච්චි මයා හට ජුනි මස දීමනාව ගෙවීම | 63,300.00 |
| 2025.07.11 | 733 | ජාතික ජල සම්පාදන මණ්ඩලය | 2025.මැයි සිට ජුනි මස දක්වා ජල බිල්පත් ගෙවීම | 130,944.94 |
| | 734 | පෝස්ට් මාස්ටර් ජනරාල් | තැපැල් මුද්දර ගාස්තු අළුත් කිරීම | 30,000.00 |
| | 735 | එස්.ජේ.එස්.සමරසිංහ | ගමන් වියදම් ගෙවීම | 2,776.00 |

| | | | | |
|---|---|---|---|---|
| | 736 | ආර්.ඩබ්.එස්.ඒ. රත්නායක | ගමන් වියදම් ගෙවීම | 3,741.79 |
| | 737 | එම්.ඒ.සී.මාලනී | ගමන් වියදම් ගෙවීම | 660.00 |
| | 738 | කේ.ඒ.ජ්ස්.ඩී.කළුආරච්චි | ගමන් වියදම් ගෙවීම | 654.00 |
| | 739 | කේ.ඒ.ජ්ස්.ඩී.කළුආරච්චි | ගමන් වියදම් ගෙවීම | 654.00 |
| 2025.07.14 | 740 | ජාතික ඉතිරි කිරීමේ බැංකුව | අභ්‍යන්තර හුවමාරු (ස්ථාවර තැන්පතු) | 50,000,000.00 |
| 2025.07.15 | 741 | ජේ.එම්.ජී.එන්.ජයසේකර | ජල සම්බන්ධතාවය ලබා ගැනීම සඳහා තබන ලද ඇප තැන්පතු ආපසු ගෙවීම | 2,000.00 |
| | 742 | එල්.ජී.පී. ගුණසේකර | ජල සම්බන්ධතාවය ලබා ගැනීම සඳහා තබන ලද ඇප තැන්පතු ආපසු ගෙවීම | 2,000.00 |
| | 743 | ජේ.එම්.ටී.ඩී. ජයසුන්දර | ජල සම්බන්ධතාවය ලබා ගැනීම සඳහා තබන ලද ඇප තැන්පතු ආපසු ගෙවීම | 2,000.00 |
| | 744 | එම්.බී.ඒ. විජේරත්න | ජල සම්බන්ධතාවය ලබා ගැනීම සඳහා තබන ලද ඇප තැන්පතු ආපසු ගෙවීම | 2,000.00 |
| | 745 | කේ.කේ.එස්.එස්. දෙඹටපිටිය | ජල සම්බන්ධතාවය ලබා ගැනීම සඳහා තබන ලද ඇප තැන්පතු ආපසු ගෙවීම | 2,000.00 |
| | 746 | එම්.ආර්.පොඩිමැණිකේ | ජල සම්බන්ධතාවය ලබා ගැනීම සඳහා තබන ලද ඇප තැන්පතු ආපසු ගෙවීම | 2,000.00 |
| | 747 | ප්‍රධාන දුම්රිය ගණකාධිකාරි | 2025 ජනවාරි මස නිදහස් දුම්රිය බලපත්‍ර ගාස්තු ගෙවීම | 3,275.00 |
| | 748 | සභාපති,ප්‍රාදේශීය සභාව | 2011 - 2024 ආදායමට නොගත් ගලි තැන්පත් ආදායමට ගැනීම | - |
| | 749 | සභාපති,ප්‍රාදේශීය සභාව | 2025 අප්‍රේල් මස ගලි තැන්පත් ආදායමට ගැනිම | - |
| | 750 | රංජනී බේක් හවුස් | 2025.06.11 හා 2025.06.20 දින පැවැත්වූ මහ සභාවේ සංග්‍රහ කටයුතු සඳහා ගෙවීම | 11,959.00 |
| | 751 | මුදල් භාරකරු | SG-RW-5799 ට්‍රැක්ටර් ටේලරයේ වාර්ෂික ආදායම් බලපත්‍රය ලබා ගැනිමට අතින් වියදම් කල මුදල් ලබා ගැනිම | 1,320.00 |
| | 752 | මුදල් භාරකරු | RC-8186 ට්‍රැක්ටර් ටේලරයේ වාර්ෂික ආදායම් බලපත්‍රය ලබා ගැනිමට අතින් වියදම් කල මුදල් ලබා ගැනිම | 1,200.00 |
| 2025.07.17 | 753 | බ්‍රවුන්ස් ඇන්ඩ් කම්පැනි | RD-4337 ට්‍රැක්ටරයේ සුක්කානම් පද්ධතිය අලුත් වැඩියාව වෙනුවෙන් ගෙවීම | 78,141.67 |
| | 754 | මුදල් භාරකරු | ZA-0108 බොබ් කැට් යන්ත්‍රයේ ආදායම්,බලපත්‍රය,දුම් සහතිකය,යෝග්‍යතා සහතිකය ලබා ගැනීමට අත්තිකාරම් මුදල් ලබා ගැනිම | 8,290.00 |

| | | | | |
|---|---|---|---|---|
| | 755 | මුදල් භාරකරු | ZA-5344, 67-0132, JU-0022, 37-8242, RC 1413, RW-2084, RC1523, RW 2126, RB - 4783 වාහන වල ආදායම්,බලපත්‍රය,දුම් සහතිකය,යෝග්‍යතා සහතිකය ලබා ගැනීමට ගත් අත්තිකාරම් මුදල් පියවීම | - |
| | 756 | එස්.ඩී.එස්. කන්ස්ට්‍රක්ෂන් | බණ්ඩාරනායක ශ්‍රවණාගාරය ඉදිකිරීම් කර්මාන්තයේ තුන්වන බිල්පත ගෙවීම | 5,273,445.93 |
| | 757 | දේශිය ආදායම් දෙපාර්තමේන්තුව | 2025.04.01 සිට 2025.06.30 දක්වා දෙවන කාර්තුවට අදාල මුද්දර බදු ගෙවීම | 34,772.00 |
| 2025.07.18 | 758 | බි.ඒ. අසංක හංස කුමාර | අතිකාල දීමනා ගෙවීම | 7,088.83 |
| | 759 | බි.ඒ. අසංක හංස කුමාර | අතිකාල දීමනා ගෙවීම | 1,143.36 |
| | 760 | බි.ඒ. අසංක හංස කුමාර | අතිකාල දීමනා ගෙවීම | 891.66 |
| | 761 | එච්.ඒ.ජී.එල්. පියසේන | අතිකාල දීමනා ගෙවීම | 12,976.00 |
| | 762 | ඩබ්.ඩබ්. ඩී. වීරක්කොඩි | අතිකාල දීමනා ගෙවීම | 10,935.06 |
| | 763 | එච්.සි.කේ. හෙට්ටිගොඩ | අතිකාල දීමනා ගෙවීම | 11,778.38 |
| | 764 | ඒ.කේ.එස්.ඩී.කලුආරච්චි | ගමන් වියදම් ගෙවීම | 654.00 |
| | 765 | ඒ.කේ.එස්.ඩී.කලුආරච්චි | ගමන් වියදම් ගෙවීම | 2,577.50 |
| | 766 | එස්.ජේ.එස්.සමරසිංහ | ගමන් වියදම් ගෙවීම | 3,576.00 |
| | 767 | එච්.ඩබ්.ඩී.කුලතුංග | ගමන් වියදම් ගෙවීම | 554.00 |
| | 768 | ආර්.එම්.එස්.ඒ.රත්නායක | ගමන් වියදම් ගෙවීම | 5,910.02 |
| | 769 | පී.ජී.සුධර්මා කුමාරි | ගමන් වියදම් ගෙවීම | 554.00 |
| | 770 | වී.ආර්.එන්.ප්‍රේමසිරි | අතිකාල දීමනා ගෙවීම | 3,001.11 |
| | 771 | එස්.ඩබ්.සී.එස්.නන්දන | අතිකාල දීමනා ගෙවීම | 8,493.52 |
| | 772 | ජී.ජී.බී.ඒ.කුමාර | අතිකාල දීමනා ගෙවීම | 7,995.74 |
| | 773 | ජී.ඒ.බන්දුසේන | අතිකාල දීමනා ගෙවීම | 7,622.41 |
| | 774 | පී. ගීත් ප්‍රේම ශ්‍රී | අතිකාල දීමනා ගෙවීම | 3,628.89 |
| | 775 | එස්.ඩබ්.පී.ධර්මසේන | අතිකාල දීමනා ගෙවීම | 6,723.05 |

| | | | | |
|---|---|---|---|---|
| | 776 | ජේ.එන්.එල්.ජයසිංහ | අතිකාල දීමනා ගෙවීම | 4,686.61 |
| | 777 | එච්.ඩබ්.ඒ.අයි.එල්.වීරකෝන් | අතිකාල දීමනා ගෙවීම | 6,497.35 |
| | 778 | එස්.එන්.නන්ද ශ්‍රී | අතිකාල දීමනා ගෙවීම | 6,745.88 |
| | 779 | වී.ඒ.එස්.ප්‍රේමසිරි | අතිකාල දීමනා ගෙවීම | 4,189.55 |
| | 780 | ඩී.ඩබ්.ජී.ඒ.සඳරුවන් | අතිකාල දීමනා ගෙවීම | 4,051.94 |
| | 781 | එස්.ඩබ්.එස්.ශ්‍රියානන්ද | අතිකාල දීමනා ගෙවීම | 3,947.15 |
| | 782 | එස්.ජේ.එස්.සමරසිංහ | අතිකාල දීමනා ගෙවීම | 18,227.67 |
| | 783 | එච්.එන්.ඩී.කුලතුංග | අතිකාල දීමනා ගෙවීම | 3,142.02 |
| | 784 | පී.ජී.සුධර්මා කුමාරි | අතිකාල දීමනා ගෙවීම | 3,823.45 |
| | 785 | ජේ.පී.ආර්.ඩී.ජයසුන්දර | අතිකාල දීමනා ගෙවීම | 6,860.16 |
| | 786 | එන්.ජී.ඒ.කේ.මැදවත්ත | අතිකාල දීමනා ගෙවීම | 5,071.32 |
| | 787 | එම්.එන්.පත්මසිරි | අතිකාල දීමනා ගෙවීම | 6,986.11 |
| | 788 | එන්.ජී.අජිත් ප්‍රියන්ත කුමාර | අතිකාල දීමනා ගෙවීම | 5,212.20 |
| | 789 | ඩබ්.නලීන් පුෂ්පකුමාර | අතිකාල දීමනා ගෙවීම | 7,933.51 |
| 2025.07.21 | 790 | ඩී.ආර්.ආර්.සාලින්ද කුමාර | අතිකාල දීමනා ගෙවීම | 9,525.83 |
| | 791 | කේ.ජී. ධනුක ශ්‍රීමාල් | අතිකාල දීමනා ගෙවීම | 5,705.25 |
| | 792 | අයි.එන්.ආර්.ජයවර්ධන | පස් ප්‍රවාහනය සඳහා මාර්ගය පළුදු වීමට තබන ලද ඇප තැන්පතු ආපසු ගෙවීම | 500,000.00 |
| | 793 | ඩී.එල්.ප්‍රසාද් විමලරත්න | නීතිඥ නඩු ගාස්තු ගෙවීම | 29,000.00 |
| 2025.07.21 | 794 | ලංකා විදුලි බල මණ්ඩලය | 2025 මැයි ,ජූනි මාස වල විදුලි බිල් ගෙවීම | 47,365.80 |
| | 795 | සී/ස විවිධ සේවා සමුපකාර සමිතිය - රඹුක්කන | 2025.05.01 සිට 2025.05.31 දක්වා ඉන්ධන බිල්පත් ගෙවීම | 412,380.50 |
| | 796 | සේවා නියුක්තයන්ගේ භාර අරමුදල | 2004/01 සිට 2021/12 කාලය තුළ සේවා නියුක්ත භාර අරමුදල් මණ්ඩලය වෙත වාර්තා ප්‍රමාද වී යොමු කිරීම වෙනුවෙන් අදාළ අධිභාර මුදල් ගෙවීම | 46,138.55 |
| | 797 | එස්.පි චෛතිය වර්ධන | ජල සම්බන්ධතාවය ලබා ගැනීම සඳහා තබන ලද ඇප තැන්පතු ආපසු ගෙවීම | 2,000.00 |

| | | | | |
|---|---|---|---|---|
| | 798 | ඩබ්.ඒ.ජේ.පී.විජේසිංහ | ජල සම්බන්ධතාවය ලබා ගැනීම සඳහා තබන ලද ඇප තැන්පතු ආපසු ගෙවීම | 2,000.00 |
| | 799 | පී.ජී.සෝමාවතී | ජල සම්බන්ධතාවය ලබා ගැනීම සඳහා තබන ලද ඇප තැන්පතු ආපසු ගෙවීම | 2,000.00 |
| | 800 | පි.එල්.අයි.නිල්මිණි සිල්වා | ජල සම්බන්ධතාවය ලබා ගැනීම සඳහා තබන ලද ඇප තැන්පතු ආපසු ගෙවීම | 2,000.00 |
| | 801 | ඩබ්.ජේ.යූ.මධුෂාන් | ජල සම්බන්ධතාවය ලබා ගැනීම සඳහා තබන ලද ඇප තැන්පතු ආපසු ගෙවීම | 2,000.00 |
| | 802 | එච්.ජී.ලයනල් සරත් කුමාර | ජල සම්බන්ධතාවය ලබා ගැනීම සඳහා තබන ලද ඇප තැන්පතු ආපසු ගෙවීම | 25,000.00 |
| | 803 | ප්‍රධාන දුම්රිය ගණකාධිකාරි | 2025 මාර්තු මසට අදාල නිදහස් දුම්රිය බලපත්‍ර ගාස්තු ගෙවීම | 15,250.00 |
| | 804 | ලේබා ස්ටේෂනර්ස් | රඹුක්කන - පුස්තකාලය සඳහා මැයි මස පුවත්පත් මිලදී ගැනීම | 18,830.00 |
| | 805 | ලේබා ස්ටේෂනර්ස් | ඉඹුල්ගස්දෙණිය - පුස්තකාලය සඳහා අප්‍රේල් මස පුවත්පත් මිලදී ගැනීම | 15,250.00 |
| 2025.07.22 | 806 | එස්.සේනක ඉලංගතිලක | නීතිඥ නඩු ගාස්තු ගෙවීම | 38,500.00 |
| | 807 | kegall distributous (pvt)ltd | ආදාහනාගාරය වෙත 37.5 kg ගෑස් සිලින්ඩර 06 ක් සඳහා ගෙවීම | 105,395.00 |
| | 808 | Asian Electricals | විද්‍යුත් උපකරණ සැපයිම වෙනුවෙන් ගෙවීම | 5,000.00 |
| | 809 | Central Stationaries | ලිපි ද්‍රව්‍ය සැපයීම වෙනුවෙන් ගෙවීම | 2,255.00 |
| | 810 | ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය | 2025.06.01 සිට 2025.06.30 දක්වා දුරකථන බිල්පත් ගෙවීම | 10,872.04 |
| | 811 | ජල සම්පාදන හා ජලා පවාහන මණ්ඩලය | 2025 අප්‍රේල් මස ජල බිල්පත් ගෙවීම | 133,172.32 |
| | 812 | සභාපති,ප්‍රාදේශිය සභාව | ලබා නොගත් ජල නල ඇප තැන්පතු ආදායමට ගැනීම | - |
| 2025.07.24 | 813 | 2025 ජූලි මස වැටුප් ගෙවීම | 2025 ජූලි මස වැටුප් ගෙවීම | 7,234,964.36 |
| 2025.07.28 | 814 | c-com EQUIPMET PVT LTD | ZA -0108 බොබ් කැට් යන්ත්‍රයේ පූර්ණ වාර සේවාව සිදු කිරිම | 123,452.86 |
| | 815 | c-com EQUIPMET PVT LTD | ZA -0108 බොබ් කැට් යන්ත්‍රයේ සිදු කරන ලද අළුත් වැඩියා කටයුතු සඳහා ගෙවීම | 694,456.75 |
| | 816 | එස්.එම්.එන්.සී ජයවර්ධන | අලි අනාථාගාරය අවට අනතුරුදායක ගස් ඉවත් කිරිම සඳහා ගෙවීම | 39,975.00 |

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටිකිරි බංඩා තෙන්නකෝන් මැතිතුමා**

වවුචර් අංක 714 /755 මුදලක් සඳහන් වී නොමැති බැවින් මෙම වියදම් අනුමත කිරීමට නොහැකි බවත්,මා ඉදිරිපත් කළ කරුණු දෙක හැර අනෙකු වියදම් ස්ථිර කරන ලෙසට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටිකිරි බංඩා මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු සභාපති මැතිතුමා ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මෙහි වවුචර් අංක 714/748/749/755/812 යන වවුචර් සියල්ලම ගෙවීම් නොවන බවත්,ප්‍රතිපූර්ණය කරන ලද මුදල් වන බැවින් ආදායමට ගැනීමක් ලෙස සඳහන් වන බැවින් මුදල් ප්‍රමාණය සටහන් කර නොමැති බවට ගරු සභාපති මැතිතුමා ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී.එන්.ප්‍රියංජිත් රාජපක්ෂ මැතිතුමා**

අපගේ ප්‍රදේශවල ද සභා අරමුදලින් ලක්ෂ 5 ට අඩු ව්‍යාපෘති සඳහා ඔබතුමා මුදල් වෙන් කර ඇත.නමුත් අපි මන්ත්‍රීවරුන් වශයෙන් යෝජනා ඉදිරිපත් කර එම යෝජනා ද සම්මත වී ඇත.අපි කිසිම කෙනෙකුට තවම මුදල් ලබා දී නොමැති බවත්,ඔබතුමාගේ යෝජනා පමණක් අනුමත වි ඇති බවත් පවසන ලදි.අප යොමු කර ඇති යෝජනාත් මහජනතාවගේ ඉල්ලීම් වන නිසා ඒ ගැනත් සලකා බලන ලෙසට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී.එන්.ප්‍රියංජිත් රාජපක්ෂ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු සභාපති මැතිතුමා ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මෙම යෝජනා මාගේ නොවන බවත්,අපි පළාත් සභාවට යෝජනා 90 ක් පමණ ඉදිරිපත් කර ඇති නමුත් එම යෝජනා වලින් 44 ක් පමණක් අනුමත තර ඇත.මේ යෝජනා ඒ පළාත් සභාවෙන් අනුමත කර ඇති යෝජනා බව ගරු සභාපති මැතිතුමා ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

මෙම වැඩ විෂයන් සඳහා සභාවේ පොදු අරමුදල් වියදම් කරනු ලබන්නේ න්‍යාය පත්‍රයට ඇතුලත් කිරීමෙන් පසුවය.මෙම යෝජනා පළාත් සභාවෙන් අනුමත වීමට අවශ්‍යයි. නමුත් ඔබතුමාලා යෝජනාව ආණ්ඩුකාරතුමියට ඉදිරිපත් කර එතුමිය නැවත ප්‍රාදේශීය සභාවට යොමු කර ඇත. ප්‍රාදේශීය සභාවක පොදු අරමුදල් වියදම් කිරීමට සභාපතිතුමාට බලතල තිබෙන බව පවසන ලදි.මෙම යෝජනා සභාපතිතුමාගේ යෝජනා විදිහට න්‍යාය පත්‍රයට යොමු කර උදාහරණයක් වශයෙන් අහවල් මාර්ගය සංවර්ධනයට ලක්ෂ 05 නැත්නම් ලක්ෂ10 ක් වුණත් වියදම් කිරීමට බලතල ඇත.එයට අපගේ විරුද්ධත්වයක් නොමැති බවට ප්‍රකාශ කරන ලදි. නමුත් මේ යෝජනා වක්‍රව ආණ්ඩුකාරතුමියට ඉදිරිපත් කර නැවත ආණුඩුකාරතුමිය සභාවට යොමු කර ඇත.එම ක්‍රමයට සිදුවිය නොහැකි බව පවසන ලදි.සභාපතිතුමනි මේ යෝජනා න්‍යාය පත්‍රයට ඇතුලත් කර ඇස්තමේන්තු සකස් කර එම ඇස්තමේන්තු මාසික මහසභාවට යොමු කර ක්‍රියාත්මක කිරීම සුදුසු බවත්, පෙන්වා දෙන ලදි.මෙය අනෙක් පැත්තේ ගිහින් මේ පැත්තේන් ඇවිත් ඇති බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මෙම යෝජනා නිවැරදි පැත්තෙන් ගොස් ඇති බවත් අනෙක් පැත්තෙන් නොගිය බවත් පවසන ලදි.ඔබතුමාලා මෙහි ඉතිහාසය පිළිබඳ දන්නා බවත්,අපි පැමිණ තවම මාස දෙකයි. ඒ මාස දෙකට මාස හයක ප්‍රතිඵල තිබෙන බව පවසන ලදි.අපගේ යුතුකම හා වගකීම වන්නේ සංවර්ධන කාර්යයන් සඳහා උරදීමය.අනුර පියරත්න මැතිතුමා පැවසු ආකාරයට ලක්ෂ 5 ක් හරි 10 ක් හරි වෙන් කිරීමට හැකියාවක් ඇත.එහෙත් එසේ නොකර මම සිතාබලා වැඩ කරන බව පවසන ලදි.අපට යෝජනා ආණ්ඩුකාරතුමියගේ

අනුමැතිය සඳහා යොමු කිරිමට අයිතියක් ඇති බැවින් එම යෝජනා අනුමැතිය සඳහා පළාත් සභාවට යොමු කරන ලදි.මුල් කාලයේ සභාවක් නොතිබුණ නිසා ලේකම්තුමාගේ පාලනයක් තිබුණ බැවින් එතුමා විසින් 2025 ට අයවැය වාර්තාවක් සකස් කර මාර්ග සංවර්ධනයට මුදල් වෙන් කර ඇත.එම මුදල් වෙනස් නොකර ඒ අනුව තමා අපි සංවර්ධන කටයුතු කර ගෙන යනු ලබන්නේ යැයි ගරු සභාපති මැතිතුමා ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටිකිරි බංඩා තෙන්නකෝන් මැතිතුමා**

එහෙම නම් සභාපතිතුමා අවශ්‍ය නොවන බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටිකිරි බංඩා මැතිතුමා ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

පළාත් පලන මාර්ග 2025 අත්‍යවශ්‍ය මාර්ග ඉල්ලීම් ඉටුකිරිම යටතේ මේ යෝජනා කිහිපයකට ලක්ෂ 20,14,15 ගණන් වලට මුදල් යොදවා ඇත.මාහට දැන ගැනිමට අවශ්‍යයයි මේ අත්‍යවශ්‍ය මහජන ඉල්ලීම් ඉටුකිරිම යටතේ මෙම මාර්ග වලට ලබා ගැනිමට ප්‍රමඛතාවය ලබා ගැනිම සිදු වුයේ කොහොමද යන්න දැන ගැනිමට අවශ්‍ය බවත්,එය පළාත් සභාවෙන් සිදු වු දෙයක් ද එහෙමත් නැත්නම් මෙම සභාවෙන් වුණු දෙයක්ද යන්න දැන ගැනිමට අවශ්‍ය බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

පළාත් පාලන ප්‍රධාන ඇමතිතුමියගේ සාකච්ජාවට මා සහභාගි විය. එහිදී පළාත් සභාවට මේ යෝජනා ඉදිරිපත් වී ඇති බව සඳහන් කරන ලදි.එම නිසා මේවා පලාත් පාලන වියදම් වන අතර සභාවේ මුදල් නොවන බව ප්‍රකාශ කරන ලදි.එබැවින් මෙම යෝජනා පළාත් සභාවෙන් අනුමත කරන ලද යෝජනා බව ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

පළාත් පාලන මාර්ග 2025 අත්‍යවශ්‍ය මාර්ග ඉල්ලීම් යටතේ ඉටු කිරිම යටතට අපගේ යෝජනා ඉදිරිපත් කිරිමට නොහැකි ද ? අත්‍යවශ්‍ය මාර්ග සඳහා සභාවේ මුදල් යොදවනවානම් විශේෂ අවශ්‍යතාවයක් විදිහට කාලයක් තිස්සේ සිට ඉල්ලීම් කරනු ලබන හා ගාමිණි මන්ත්‍රීතුමා ද සාකච්ඡා කළ අබලන් තිස්ස විද්‍යාල මාර්ගය ද මේ යෝජනා වලට ඉදිරිපත් කර ගැනිමට හැකියාව තිබේ ද යන්න ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

ඔබතුමන්ලා ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීතුමන්ලා නිසා දන්නවා අපට ක්‍රියාත්මක කිරිමට සිදු වන්නේ අනුමත වුණ යෝජනා පමණක් බවයි.මේ යෝජනා සඳහා තීරණ ගෙන අවුරුද්දක් වන නිසා මම තීරණය කළා එම අනුමත වු යෝජනා ක්‍රියාත්මක කිරිමට එහෙම නොවුනොත් විගණනයෙන් ප්‍රශ්න කිරිමක් සිදු වෙනවා මෙම සංවර්ධන වැඩ සටහන් ක්‍රියාත්මක නොවිම පිළිබඳව ඒ දෙයට බැදිලා තමා අපිට වැඩ කරන්නට සිදු වෙන්නේ.පවතින ආණ්ඩුව අපගේ බැවින් මම උත්සහ කරනවා මෙම සංවර්ධන කටයුතු හැකි තරමින් කිරිමට යනුවෙන් ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

(ඊ)2.**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.වී.ප්‍රියන්ත එදිරිසූරිය මැතිතුමා**

i. හලාගිරිය ග්‍රාමනිලධාරි වසමේ කනත්ත අසල සිට කිරිකෝන් ගහ හන්දිය දක්වා පානීය ජල යෝජනා ක්‍රමයක් සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.වී.ප්‍රියන්ත එදිරිසූරිය මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.වී.ප්‍රියන්ත එදිරිසූරිය මැතිතුමා**

හලාගිරිය ප්‍රදේශය සම්පූර්ණයෙන් කඳු සහිත භූමියක් බැවින් ළිං ජලය ලබා ගැනිමට හැකියාවක් නොමැත.වර්ෂා කාලයේදී යම් තරමක ජලය ප්‍රමාණයක් පැවතියත් වර්ෂාව නොමැති කාල වලදි පානීය ජලය ලබා ගැනිමට බොහෝ දුරක් යාමට එම ගම්වාසින්ට සිදු වේ.එම නිසා මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිමට ඔබතුමාගේ විශේෂ අවධානය යොමු කරන ලෙස ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.වී.ප්‍රියන්ත එදිරිසූරිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටිකිරි බංඩා තෙන්නකෝන් මැතිතුමා**

මෙය ජලය සම්බන්ධ ප්‍රශ්නයක් නිසා සභාවට කිරිමට නොහැකි බැවින් ජල සම්පාදන මණ්ඩලයට යොමු කරන ලෙස ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටිකිරි බංඩා මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මාහට වගකිමක් තිබෙනවා.මහජනතාවගේ ප්‍රශ්න සඳහා මැදිහත් වීමට, අපට අයිතියක් නැති බව ප්‍රකාශ කර එහාට මෙහාට යොමු කරනවා යැයි පවසමින් මේ වැනි දේවල් සිදු නොකිරිමට පුළුවන් කමක් නොමැති බවත්, මම මේ ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රී වී සිටින විට බස් නැවතුම්පළ ගැන අදහස් පළ කරන විට හිටපු සභාපතිතුමාත් පවසා සිටියේ අපට ඒක අයිති නැත බවයි.අපට එකේ අයිතියක් නැති වෙන්න පුළුවන් එහෙත් දැන් එම ස්ථානය ජරාජීර්ණ වෙලා තිබෙන්නේ.එම නිසා ඕනෑම යෝජනාවක් ඉදිරිපත් කරන්න.මම බැදිලා සිටිනවා ප්‍රදේශයේ සභාපති විදිහට මේ දේවල් ඉටු කිරිමට,ජල සම්පාදන මණ්ඩලය සමඟ සාකච්ඡා කර මෙය සිදු කරන බවට ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

මෙම යෝජනාව වැරදි නොවන බවත්,යෝජනාව ඉදිරිපත් කර ඇති ආකාරය වැරදි බව පවසන ලදි.බස් නැවතුම්පොළ ගැන සාකච්ඡා කිරිමේ දී එය අපට අදාළ දෙයක් නොවේ.එම ස්ථානයේ තිබෙන වලවල් සඳහා ඔබතුමාට පුළුවන් ද ගල්පස් දමන්නට එය කළ නොහැකිය.මෙහි නිසි ක්‍රමවේදයක් තිබෙනවා.මේ යෝජනාව ඉදිරිපත් කිරිමේ අඩුපාඩුවක් තිබෙනවා.මහජනතාවගේ අවශ්‍යතාවයන් ඉටු කිරිම අරමුණ වුවත්, සභාවට මේ යෝජනාව මේ විදිහට ඉදිරිපත් කළ නොහැකිය.මෙය සිදු කිරිමට හොඳම ආකාරය වන්නේ අදාළ ආයතනය දැනුවත් කර ඒ සඳහා ක්‍රියාමාර්ග ගැනිම සුදුසු බවයි.යෝජනාව අවශ්‍යයි.මෙයට සංශෝධනයක් ඉදිරිපත් කිරිමෙන් මෙතුමාගේ යෝජනාවට වටිනාකමක් හා අගයක් එකතු වෙන බව ප්‍රකාශ කරන ලදි. ඔබතුමා හා අපි එක්කවත්,සභාව එක්කවත් තරහයෙන් නොවේ මේ යෝජනාව ඉදිරිපත් කලේ යැයි ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

ඔබතුමාගේ ප්‍රකාශය නිවැරදිය.එහෙත් මේ සභාවේ යෝජනා ප්‍රතික්ෂේප කිරිමට නොහැකිය.ඊළඟ පියවරක් තිබෙන බව පවසන ලදි.මට ද තේරුම් ගැනිමට පුළුවන්ය. සභාවේ මුදල් වලින් මෙය සිදු කිරිමට නොහැකි බව උදාහරණයක් වශයෙන් සම්බන්ධීකරණ කමිටුවට ද මුදල් නොමැත.එහෙත් එම කමිටුව සඳහා

යෝජනා ඉදිරිපත් වන විට එම යෝජනා ප්‍රතික්ෂේප නොකර පිළිගන්නවා.මම ප්‍රාදේශී සභා මන්ත්‍රී වී සිටින කාලයේ එදා මගේ යෝජනාව හිටපු සභාපතිතුමා පිළිගත්තේ නැති බවත්, මට එවැනි දේවල් කිරිමට නොහැකි බවත් ප්‍රකාශ කලේය.අපි ඒ ක්‍රමය නිවැරදි කර ගනිමු. මේ දේවල් ක්‍රියාත්මක කිරිම සඳහා මට වගකිමක් තිබෙන බව ද ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

ඔබතුමා හිටපු සභාපති අතුල හඳගම මන්ත්‍රීතුමා විසින් ප්‍රකාශ කළ දෙයක් පැවසුවා. අපිට මේක කරන්නට නොහැකි බව සඳහන් කළා චෝදනාත්මක ස්වරූපයෙන් අපි පසුගිය සභාවේ හිටපු මන්ත්‍රීවරු විදිහට ඒ කාරණයට පෙනී සිටිමට අවශයයි.මම පැහැදිවම සඳහන් කිරිමට අවශායි සභාපතිතුමා එතැනදී අපට ගතහැකි ක්‍රියාමාර්ග කිහිපයක්ම අපි ලබා ගත් බව පවසන ලදි.ඔබතුමාලා වගේම අපිත් ආණ්ඩුව සමඟ සම්බන්ධ වී වැඩ කළ බවත්,රටේ තිබෙන ආර්ථික ප්‍රශ්නත් සමඟ සමහර ක්‍රියාමාර්ග ගැනිමට නොහැකි විය.මම මේ ළඟ දී දැක්කා සමාජ මාධ්‍යයෙත් ඔබතුමා ඒ ගැන අදහසක් පළ කර තිබුණ බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා ප්‍රකාශ කරන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
අදාළ සංවර්ධන යෝජනාව ක්‍රියාත්මක කිරිමට අනුමත කිරිම තීරණය විය.

ii. කිරිවන්දෙණිය ග්‍රාමනිලධාරි වසමේ වැලිකන්ද පාසල පාර කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කිරිමට සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.වී.ප්‍රියන්ත එදිරිසූරිය මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එස්.කැලුම් කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.වී.ප්‍රියන්ත එදිරිසූරිය මැතිතුමා**

කිරිවන්දෙණිය වැලිකන්ද පාසල මාර්ගය බොහොම දුෂ්කර මාර්ගයකි.නමුත් නිවාස 100 ක් පමණ ඇති බව පවසන ලදි.පසුගිය කාලයේ මෙය පිළිසකර කර නැති බවත්, මෙය විෂය පථයට අයිති නැති වුණත්,වතුර කාට ද අයිති කියන එක නොවේ.මේක මගේ යෝජනවා සභාපතිතුමනි,මෙය අදාළ අයතනයකට හරි යොමු කර සංවර්ධනය කිරිම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.වී.ප්‍රියන්ත එදිරිසූරිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි එච්.ආර්.ප්‍රදීපා රංජනී මැතිතුමිය**

ප්‍රියන්ත එදිරිසූරිය මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද කිරිවන්දෙණිය ග්‍රාමනිලධාරි වසමේ වැලිකන්ද මහෝකන්ද ප්‍රදේශයේ පාසල පාර කොන්ක්‍රීට් දමා සංවර්ධනය කිරිම සිදු කර ඇත්තේ අවශා තැන් නොවන කඳු පමණක් බව ප්‍රකාශ කළාය.එය එසේ නොවන බවත්,ගරු කනක හේරත් මැතිතුමාගේ ප්‍රතිපාදන යටතේ එම මාර්ගය බොහෝ දුරක් සංවර්ධන ඇති බවත්,ටික දුරක් පමණක් තිබෙන බව පවසන ලදි.මෙම යෝජනාව හොඳයි.මම නැගිසිටියේ බොහෝදුරක් තිබෙනවා හා සංවර්ධන කර නොමැති බවට ප්‍රකාශ කළ නිසා මෙහිදී කනක හේරත් මන්ත්‍රීතුමා සිහිපත් කළයුතුයි.එතුමා කිරිවන්දෙණිය මාර්ගයට ප්‍රතිපාදන ලබා දී තිබෙනවා.මෙම මාර්ගය සංවර්ධන කිරිමට ලක්ෂ 10 ක මුදලක් වැය විය.එම මාර්ගය දුෂ්කරය. ජලය නැත.නිවාසයක්වත් නැති අහිංසක මිනිසුන් සිටින්නේ.මෙම යෝජනාව හොඳ ඔබතුමා පැවසුවාට තව සුළු ප්‍රමාණයක් පමණක් සංවර්ධන කිරිමට තිබෙන බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි එච්.ආර්.ප්‍රදීපා රංජනී මැතිතුමිය විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

මන්ත්‍රීතුමා මෙම මාර්ගය ප්‍රාදේශීය සභා මාර්ගයක් ද? යනුවෙන් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා පවසන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මත භේද වලට තුඩුදෙන කාරණා ඉරිදිපත් නොකරන ලෙසට ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

අදාළ සංවර්ධන යෝජනාව ක්‍රියාත්මක කිරිමට අනුමත කිරිම තීරණය විය.

iii. කිවුල්පන ග්‍රාමනිලධාරි වසමේ පන්සල අසල සිට කළුගල්ල පාර කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කිරිම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.වී.ප්‍රියන්ත එදිරිසූරිය මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.වී.ප්‍රියන්ත එදිරිසූරිය මැතිතුමා**

කිවුල්පන ග්‍රාමනිලධාරි වසමේ පන්සල අසල සිට කළුගල්ල පාර කිසිම දේශපාලන පක්ෂයකට හා මන්ත්‍රීවරයෙකුට ඇස නොගැටුණු ප්‍රදේශයකි.මෙම මාර්ගයේ බයිසිකලයකින් තියා පයින්වත් ගමන් කිරිමට නොහැකිය. මෙම මාර්ගය අවුරුදු 40 ක් පමණ පරණ මාර්ගයකි.එම නිසා මේ සඳහා අවධානය යොමු කරන ලෙසට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.වී.ප්‍රියන්ත එදිරිසූරිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

මෙම මාර්ගය ගම් සභා මාර්ගයක්ද යනුවෙන් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

අදාළ සංවර්ධන යෝජනාව ක්‍රියාත්මක කිරිමට අනුමත කිරිම තීරණය විය.

iv. කිරිවන්දෙණිය ග්‍රාමනිලධාරි වසමේ වැලිකන්ද මහෝකන්ද ප්‍රදේශයට පානීය ජල ව්‍යාපෘතියක් ලබාදීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.වී.ප්‍රියන්ත එදිරිසූරිය මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එස්.කැලුම් කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.වී.ප්‍රියන්ත එදිරිසූරිය මැතිතුමා**

මෙම ප්‍රදේශයට පානීය ජල ව්‍යාපෘතියක් ලබා දීම අවශ්‍යයි.මෙහි කන්ද මුදුනේ සිට ජලය ලබා ගැනිම සිදු වුවත් එය ප්‍රමාණවත් නොවේ.එම නිසා ඒ සඳහා ඔබතුමාගේ අවධානය යොමු කර ලෙස ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.වී.ප්‍රියන්ත එදිරිසූරිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -
අදාළ සංවර්ධන යෝජනාව ක්‍රියාත්මක කිරිමට අනුමත කිරිම තීරණය විය.

**(ඊ)3.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි පී.ජී.එස්.සමන් කුමාරි මැතිතුමිය**

i. නාරංබැද්ද , දුනුකේවල මාර්ගය කාපට් කර කඩිනමින් ඉදි කිරිම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි පී.ජී.එස්.සමන් කුමාරි මැතිතුමිය විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු උපසභාපතිතුමා විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**
සභාපතිතුමනි,මේ පළමුවැනි යෝජනාවේ මාර්ගය කොන්ක්‍රීට් දමා නැද්ද,සාමාන්‍ය මාර්ගයක් ද යන්න දැන ගැනිම සඳහා කරුණු ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා විසින් විමසන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී.එන්.ප්‍රියංජිත් රාජපක්ෂ මැතිතුමා**
මෙම මාර්ගය කාපට් කර ඇති බවත්,තව පොඩි ප්‍රමාණයක් පමණක් තිබෙන බවත්,පවසන ලදි.මෙම මන්ත්‍රීතුමියගේ යෝජනාව හොඳයි. ක්‍රියාත්මක කරන බවට මම බලාපොරොත්තු වෙනවා යැයි ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී.එන්.ප්‍රියංජිත් රාජපක්ෂ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ජී.ඩී.නිරංජලා ජිනදාස මැතිතුමිය**
මෙම දුනුකේවල මාර්ගය 1 km ක් පමණ කාපට් අතුරා ඇති බවත්,800 m ක පමණ ප්‍රමාණයක් ඉතිරි වී ඇති බව පවසන ලදි.ඒ ප්‍රමාණය සංවර්ධනය කරනවා නම් හොඳ බව ද එය ලොකු සහයෝගයක් බවත්,ඉතිරි වී ඇති කොටස අත්‍යවශ්‍ය ස්ථානයක් බව ද ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ජී.ඩී.නිරංජලා ජිනදාස මැතිතුමිය

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -
අදාළ සංවර්ධන යෝජනාව ක්‍රියාත්මක කිරිමට අනුමත කිරිම තීරණය විය.

ii. නාරංබැද්ද ගල්වක්කඩ ළඟ වේල්ලක් ඉදි කිරිම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි පී.ජී.එස්.සමන් කුමාරි මැතිතුමිය විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ඩබ්.එන්.සුරංජනී සෝමදාස මැතිතුමිය විසින් ස්ථිර කරන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -
අදාළ සංවර්ධන යෝජනාව ක්‍රියාත්මක කිරිමට අනුමත කිරිම තීරණය විය.

iii. නාරංබැද්ද නැගෙනහිර වසමේ මඩාමුණ අමුණේ ජලය කෘෂිකර්මාන්තයට යොදා ගැනිම සඳහා අමුණ අලුත්වැඩියා කිරිම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි පී.ජී.එස්.සමන් කුමාරි මැතිතුමිය විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එස්.කැලුම් කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ජී.ඩී.නිරංජලා ජිනදාස මැතිතුමිය**

නාරංබැද්ද ගල්වක්කඩ ළඟ වේල්ලක් ඉදි කිරිමේ යෝජනාවේ ගල්වක්කඩ ඉහළ ද පහළ ද යනුවෙන් අසන ලදි.අත්‍යාවශ්‍ය අමුණ නිසා මෙහි ගල්වක්කඩ ළඟ වේල්ලක් අමුණ ලෙස සංශෝධන වුණොත් හොඳ බව පවසන ලදි.අමුණ සකස් කර වේල්ල සකස් කිරිම සුදුසු බවත්,එම නිසා අමුණ ඉදිරි කර වේල්ල සකස් කිරිම හොඳ බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ජී.ඩී.නිරංජලා ජිනදාස මැතිතුමිය විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මෙතන ගල්වක්කඩ අමුණ ද වේල්ල ද යන එක නොවෙයි. අපි එකට අමුණ වචනය යොදමු ලෙස ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

අදාළ සංවර්ධන යෝජනාව ක්‍රියාත්මක කිරිමට අනුමත කිරිම තීරණය විය.

iv. සනිමේට් වත්ත දෙවෙනි පටුමඟ කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කිරිම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි පී.ජී.එස්.සමන් කුමාරි මැතිතුමිය විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එස්.කැලුම් කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ඩබ්.ජී.කරුණාවති මැතිතුමිය**

නාරංබැද්දේ පී.ජී.එස්.සමන් කුමාරි මන්ත්‍රීතුමිය කළ යෝජනාවට මම පොඩි වෙනසක් කිරිමට ඉල්ලා සිටින ලදි.සනිමේට් වත්ත දෙවෙනි පටුමඟ කොන්ක්‍රීට් අතුරා දෙන ලෙස සඳහන් කළ කාරණයට කොන්ක්‍රීට් අතුරන් නැතිව කාපට් දමා සංවර්ධන කිරිම හොඳ බව ප්‍රකාශ කරන ලදි. කොන්ක්‍රීට් දැමූ පසු ඊට වඩා වේගයෙන් කැඩුණු බව පවසන ලදි.මෙම මාර්ගයේ යාම අපහසු බවත්, යෝජනා ඉදිරිපත් කළ මන්ත්‍රීතුමියට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ඩබ්.ජී.කරුණාවති මැතිතුමිය විසින් ස්තූතිය ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

ගැටළුවක් තිබෙනවා නාරංබැද්ද නැගෙනහිර වසමේ මඩාමුණ අමුණ සකස් කිරිමේ යෝජනාව ඉදිරිපත් කළාද යන්න.සාමාන්‍යයෙන් කොන්ක්‍රීට් එකක ආයු කාලය වසර එකක් බව පවසන ලදි. මේ සම්බන්ධයෙන් අපට තොරතුරු ලබා දෙන ලෙසට ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

අදාළ සංවර්ධන යෝජනාව ක්‍රියාත්මක කිරිමට අනුමත කිරිම තීරණය විය.

**(ඊ)4.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එන්.කේ.සේනාරත්න මැතිතුමා**

i. වලල්ගොඩ ග්‍රාමනිලධාරි වසමෙහි රඹුක්කන - මාවතගම ප්‍රධාන මාර්ගයට සම්බන්ධව ආරම්භ වන වළල්ගොඩ විහාරස්ථානය දෙසට ඇති මාර්ගයේ කොටසක් අබලන් වී ඇති අතර ,එම මාර්ගයේම ඇළ මාර්ගය හරහා ඇති බෝක්කුවෙහි ප්‍රමාණය කුඩා බැවින් එම මාර්ගය අලුත්වැඩියා කර බෝක්කුව වෙනුවට පාලමක් දැමීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එන්.කේ.සේනාරත්න මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ජේ.පී.පද්මසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එන්.කේ.සේනාරත්න මැතිතුමා**

වලල්ගොඩ විහාරස්ථානයට යන මාර්ගයේ ආරම්භක ස්ථානයේ කාලයක සිට කැඩී ගොස් ඇත.කොන්ක්‍රීට් කර තිබුණත් වාහනයකට ගමන් කිරිම නොහැකි ලෙස කැඩී ඇත. එම මාර්ගයේම ඇළ මාර්ගය හරහා බොක්කුවක් දමා තිබුණත් මාර්ගය කැඩී ගොස් ඇති බැවින් බොක්කුවට වඩා ඇළ මාර්ගය පළල් වී ඇත.එබැවින් වර්ෂා කාලයේදී ජලය පිටාර ගැලිමෙන් මාර්ගය අවහිර වෙන බවත්, වල්ලගොඩ ගම්වාසින්ගේ අත්සන් යුතු ලිපියක් එම සංවර්ධන යෝජනාවට ලබා දි ඇති බවත් පවසන ලදි.එම නිසා මෙම මාර්ගය සංවර්ධනය කිරිම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එන්.කේ.සේනාරත්න මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

එතුමා ඉදිරිපත් කළ යෝජනාව වටිනවා.එම මාර්ගය අබලන් වී ඇත්තේ මෑතක දී නොවේ ටික කාලයක සිටය. මේ පාලම අබලන් වී ඇති බව අපිට ද මතකය.කලින් සභාවේ හිටපු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සුමිත් රණවීර මැතිතුමාද මේ පාලම සකස් කිරිමට විවිධ අවස්ථාවලදී විවිධ යෝජනා හා ක්‍රියා මාර්ග ඉදිරිපත් කළා. නමුත් එම ක්‍රියා මාර්ග ක්‍රියාත්මක කිරිම නොහැකි වී තිබුණා ආර්ථික හා දේශපාලන වටපිටාව මත නමුත් මේතුමා ඉදිරිපත් කළ යෝජනාව මේ අවස්ථාවේදී හරි සිදු කර ගැනිමට පුළුවන් නම් එහි සිටින ගම්වාසින්ට විශේෂ සහනයක් බව පවසන ලදි.අපි ද විවිධ අවස්ථාවල දී මේ මාර්ගයේ ගමන් කර ඇත.ඒ අවස්ථා වලදී අපහසුතාවයට ලක් වී ඇත.මෙම යෝජනාවට අදාළ නැතත් මම කාරණයක් සඳහන් කිරිමට කැමති බව පවසන ලදි.එනම් මාවනැල්ල ප්‍රධාන මාර්ගයේ සිට වලල්ගොඩ පැත්තට යන විට ප්‍රධාන මාර්ගය ආරම්භ වන ස්ථානයේ මම හිතන ආකාරයට ජල සම්පාදන මණ්ඩලයෙන් වෙන්න ඇති මාර්ගය පළුදු කර ඇත.එම ස්ථානයේ දැන් ගැට්ටක් වැනි කාණුවක් වගේ හැදිලා තිබෙන බව පවසන ලදි.එම කොටස අදාළ ආයතන දැනුවත් කර සකස් කර ගැනිමත්,එසේ නොමැති වුවහොත් අනතුරු සිදුවිය හැකිය.මා ද මෝටර් බයිසිකලයෙන් ගමන් කරන විට අනතුරට ලක්විමට ගිය බැවින් ඒ ගැන අවධානය යොමු කර සංවර්ධය කිරිම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටිකිරි බංඩා තෙන්නකෝන් මැතිතුමා**

සති පොළට යන මාර්ගයයේ වාහනයකින් තියා පයින්වත් ගමන් කිරිම නොහැකි වන තරම් වලක් සැදි ඇත.මෙම සංවර්ධන කටයුතු කරන ගමන් ප්‍රධාන පාරේ වලවල් ටික වසා දෙන ලෙසට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටිකිරි බංඩා මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

- **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

එතුමාගේ කාරණය ගැන අවධානය යොමු කරන බවත්,ජල සම්පාදන මණ්ඩලයට වෙත යොමු කර පිළිසකර කිරිම කරන බවට පවසන ලදි. ටී.එම්.ටිකිරි බංඩා මැතිතුමාගේ කාරණය යෝජනාවකට ලක් වී ඇත.මේ

වසරේ කිරිම පුළුවන් වෙයි කියලා හිතන්නේ නැති බවත්.ඊළඟ වසරට යොමු කර ඇති බව පවසන ලදි.සතිපොළ ළඟ තාවකාලකව පිළිසකර කිරිම යන්ත්‍රසූත්‍ර නොමැති බවත් එම යන්ත්‍ර සූත්‍ර කැඩී ගරාජයේ ඇති බවත් පවසන ලදි.අධිවේගී මාර්ගය එක්ක සාකච්ඡා කර එය සිදු කිරිමට සියලු කටයුතු කිරිමට සූදානම් කර ඇති බවට ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -
අදාළ සංවර්ධන යෝජනාව ක්‍රියාත්මක කිරිමට අනුමත කිරිම තීරණය විය.

ii. ගොඩගන්දෙණිය ග්‍රාම නිලධාරි වසමෙහි ටැංකි දෙක අසලින් ඇති මාර්ගයේ කොටසක ඉවුරු ඛාදනයට ලක්ව පහළට ගැළවී ගොස් ඇති අතර පැති බැම්මක් ඉදිකර කැඩී ඇති කොටස් සංවර්ධනය කිරිම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එන්.කේ.සේනාරත්න මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එන්.කේ.සේනාරත්න මැතිතුමා**

මෙම මාර්ගයේ කොටසක ඉවුරු ඛාදනයට ලක්ව පහළට ගැළවී ගොස් ඇත. දැනට මාස කිහිපකට උඩ දී ත්‍රී රෝද රථයක් එම ඉවුරේන් පහලට පෙරලී ගොස් තිබුණා එහි ඡායා රූ සමඟම ගම් වාසින් විසින් ඉදිරිපත් කර ඇත.ඒ වගේ ම මේ මාර්ගයේ ගැසට් පත්‍රය ද යොමු කර ඇති බැවින් හැකි ඉක්මනින් මෙම මාර්ගය සංවර්ධන කටයුතු සිදු කිරිම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එන්.කේ.සේනාරත්න මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

එම මාර්ගය සංවර්ධන කිරිම කටයුතු කරන බවට ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -
අදාළ සංවර්ධන යෝජනාව ක්‍රියාත්මක කිරිමට අනුමත කිරිම තීරණය විය.

iii. ගොඩගන්දෙණිය, මුවපිටිය අතුරු මාර්ගයේ අබලන් වී ඇති කොටසක් ප්‍රතිසංස්කරණය කර ගැනිම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එන්.කේ.සේනාරත්න මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.අයි.ඩී.හත්නාගොඩ මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එන්.කේ.සේනාරත්න මැතිතුමා**

ගරු සභාපතිතුමනි, මෙම මාර්ගය දැනට අවුරුදු දෙකට පමණ පෙර පොඩි කොටසක් අබලන් වී තිබුණත් දැන් එය සාමාන්‍යයෙන් අඩි 3 ක පමණ කොටසකට විශාල වී ඇත.මේ තත්වයේ තිබිය දී සුළු මුදලකින් අපට සකස් කර ගැනිම හැකි බවත්,තව දීර්ඝ කාලයක් සිටියොත් විශාල මුදලක් යෙදවීමට සිදු වන බව පවසන

ලදි.ඒ නිසා මෙම සංවර්ධන කටයුත්ත හැකි ඉක්මනින් සිදු කිරිම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එන්.කේ.සේනාරත්න මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

ඒ යෝජනාව ක්‍රියාත්මක කරන බවට ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

**(ඊ)5.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.පී.පද්මසිරි මැතිතුමා**

i. ගංගොඩ දුම්රිය පිවිසුම් මාර්ගය ප්‍රතිසංස්කරණය කිරිම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.පී.පද්මසිරි මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ඒ.සුසාන්ත විමලරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.පී.පද්මසිරි මැතිතුමා**

ගංගොඩ දුම්රිය ස්ථානයට යාමට ප්‍රධාන මාර්ගය තිබුණත්,අතුරු මාර්ගයෙන් පඩි පෙළ දිගේ දුම්රිය ස්ථානය ගමන් කිරිම සිදු කර තිබෙන්නේ.අයහපත් කාලගුණයක් සමඟ එහි බැම්ම කඩා වැටීම නිසා මාර්ගය අබලන් තත්වයට පත්ව ඇත.පඩි පෙළ ආරම්භක ස්ථානයේ නිවසකට බැම්ම කඩා වැටිම නිසා එහි ආරම්භයේ පිහිටි නිවසට පස් ගොඩ ගැසී ඇති බැවින් එම නිවසට එය අවහිරයක් හා මාර්ගයට ද අවහිර වී ඇත.මෙහි පාසල් ළමුන් සහ අවට ගම්වාසින් ගමන් ගන්නා මාර්ගයකි.එම නිසා මෙම මාර්ගය සංවර්ධනය කිරිම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.පී.පද්මසිරි මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

දුම්රිය ස්ථානයට ගමන් කිරිම අඩි පාරක් තිබුණු බවට පවසන ලදි.ලක්ෂ 25 ක මුදලක් මධ්‍යම රජයේ වියදම් කර පඩිපෙළ සංවර්ධනය කර ඇත.අත්වැල ප්‍රතිසංස්කරණය කිරිම හොඳ බව ද පවසන ලදි. ජේ.පී.පද්මසිරි මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා පඩි පෙළ ආරම්භක ස්ථානයේ පිහිටි නිවසට බැම්මක් කඩා වැටී එම ස්ථානයේ පස් ගොඩ ගැසි තිබෙන බවත්,එය ඉවත් කිරිමේ මාර්ගයේ ගමන් කිරිමට පුළුවන් වන බව පවසන ලදි.එහෙත් එම පස් ගොඩ ගැසී තිබිමෙන් මාර්ගයේ ගමන් කිරිම පුළුවන් බවත්,අනිත් එක මන්ත්‍රීතුමා දුම්රිය ස්ථානයට ගමන් කිරිමට ප්‍රධාන මාර්ගයක් තිබෙනවා.එක මම හිතන ආකාරයට ලක්ෂ 20 ක් වියදම් කර සකස් කර ඇත.තව මීටර් 15 ක 20 ක ප්‍රමාණයක් සකස් කිරිමට ඇත.එම කොටස කොන්ක්‍රීට් කර දුම්රිය ස්ථානයට වාහනයක් ගමන් කිරිමට පුළුවන් අකාරයට සකස් කර දිමට කටයුතු කරනවා නම් හොඳ බවට යෝජනා කරන බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.පී.පද්මසිරි මැතිතුමා**

ගංගොඩ දුම්රිය ස්ථානයට ප්‍රධාන මාර්ගයෙන් ගමන් කිරිමේදී 800 m ක පමණ දුරක් පවතින බැවින් මෙම මාර්ගය තමා එම ස්ථානයට ගමන් කිරිමට තිබෙන කෙටි මාර්ගය .මෙහි අත්වැල සකස් කිරිම සිදු කළ යුතුය. එහෙත් එයට විරුද්ධ අය ද සිටින බවට ප්‍රකාශ කරන ලදි.අවධානයක් තිබෙනවා පැති බැම්ම නැති එක ඔබතුමා ඉදිරිපත් වී අත්වැලත් සමඟ පැති බැම්ම ඉදිකර දීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.පී.පද්මසිරි මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා

මේ යෝජනා ක්‍රියාත්මක වුණොත් මහජනතාවගේ සුභසිද්ධියට වෙන දේවල් නිසා පියරත්න මන්ත්‍රීතුමාගේ යෝජනාවත් සම්බන්ධ කර ගෙන ක්‍රියාත්මක කරමු. යැයි ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

අදාළ සංවර්ධන යෝජනාව ක්‍රියාත්මක කිරිමට අනුමත කිරිම තීරණය විය.

ii. සතිපොළ භූමියේ නඩත්තුව හා පරිපාලන කටයුතු ප්‍රාදේශීය සභාවට පවරා ගැනිම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.පී.පද්මසිරි මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව එම්.ඒ.ආර්.සමන් කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

❖ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.පී.පද්මසිරි මැතිතුමා

සභාව සතු සතිපොළ මේ වන විට ටෙන්ඩර් පදනම මත ලබා දී ඇත.නමුත් පොළ භූමියේ නඩත්තු කටයුතු,පොළෙහි රක්ෂණ මුදල,විදුලිය,වැනි දේවල් ප්‍රාදේශීය සභාවේ මහජන මුදලින් ක්‍රියාත්මක වේ.එම ටෙන්ඩර්කරු සතිපොළ දවසට මුදල් එකතු කිරිම පමණක් සිදු කරනු ලබයි.මෙම ටෙන්ඩර්කරු විසින් මුදල් එකතු කර ගෙන යම්කිසි මුදලක් වාර්ෂිකව අපට ලබා දීම සිදු කරයි.සභාවේ සේවකයෙක් මේ කාර්ය සඳහා යෙද වුවහොත් මෙයින් සභාවට වැඩි මුදලක් ලබා ගැනිමට පුළුවන් බව පවසන ලදි.දැනටත් පොළ භූමියේ කසල ඇදිම හා පිරිසිදු කිරිම සිදු කරනු ලබන්නේ සභාවේ සේවකයන් මගින්ය.එම නිසා මේකට සංශෝධන ගෙනවිත් මේ ගැන අවධානය යොමු කර ඉදිරි වර්ෂය සඳහා ටෙන්ඩර් කැඳවනවා නැද්ද යන්න තීරණ කිරිම හා සභාවේ පාලනය මතට ලබා ගන්නවාද යන්න තීරණය කර එසේ ක්‍රියාත්මක කිරිම හොඳ බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.පී.පද්මසිරි මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා

ඉතිහාසයේ කුමක් වුණාද යන්න නොදන්නා බවත්,වර්තමානයේ මම එනවිට මන්ත්‍රීතුමා පැවසූ දේ මටත් පෙනුනා යැයි පවසන ලදි.නමුත් දැන් පරිපාලනය නඩත්තුව සභාව විසින් සිදු කරන බව පවසන ලදි.සති පොළ භූමිය ටෙන්ඩර් දී තිබුණත් ගිවිසුම අනුව එම පුද්ගලයා කටයුතු නොකළ බවත් ප්‍රකාශ කරන ලදි.සති පොළ,කෙසෙල්කැන් පොළ,පින්නවල රථගාල,පොදු වැසිකිළිය යන ස්ථාන ගිවිසුම් ප්‍රකාරව ලබාදී ඇත.මම ලේකම්තුමාගේ පරිපාලනයෙන් බැහැර නොවුණ බව ප්‍රකාශ කරන ලදි.

❖ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා

මේ යෝජනාව ගැන මන්ත්‍රීතුමා සඳහන් කාරණය ඔබතුමා සඳහන් කළා අපේ ක්‍රියාපටිපාටියට අනුකූලව සිද්ධ වන බව එහෙම වෙනවා නම් වටිනවා.අපි ටෙන්ඩර් කර දෙන විට සභාවට අවශ්‍ය අකාරයට ගිවිසුම් ගත වී ඇත.ඒ ආකාරයට සිදු වෙනවා මිස මේතුමා සඳහන් කළ ආකාරයට දැන් අඩු පාඩු තිබෙන බව පවසමින් හැම දේම සභාවට පවරා ගෙන සිදු කිරිමට ගියොත් ප්‍රශ්නයක් වෙන බව පවසන ලදි.මාළු,මස් කඩ දෙකත් අපිට අරගෙන කිරිමට සිදු වෙයි.සභාවේ සේවකයන් යොදවා ගෙන කිරිම යෝජනා කරන විට ඔබතුමාලා අභ්‍යන්තරයෙන් සාකච්ඡා කර මේවා ගෙනවා නම් හොඳ බව පවසන ලදි.නැතිනම් මහ සභාව ඇතුලේදී විශාල ප්‍රශ්නයකට මුහුණු දීමට සිදු වෙයි.මේක සුභදව යන වැඩක් නිසා හොඳයි.අපිට මතකයි

උපසභාපතිතුමා පැවසුවා ගිය සභාවාරයේදී අපි අභ්‍යන්තරයෙන් සාකච්ඡා කර ගෙනා යෝජනා ඉදිරිපත් කරන බවත්.මම මතක් කරන්න නම් මෙ යෝජනාව විනාඩි 5 කට කාලය සිමාව කරන යෝජනාවේදී. එම නිසා මම සඳහන් කරන්නේ මේකත් අභ්‍යන්තරයෙන් සාකච්ඡා කර ඉදිරිපත් කළා නම් හොඳ බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු උපසභාපති ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා**

මා විසින් එසේ ප්‍රකාශ නොකළ බවට ගරු උපසභාපති ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මෙම යෝජනාව ක්‍රියාත්මක කිරිම සුදුසු බවට සභාවට ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

අදාළ යෝජනාව ක්‍රියාත්මක කිරිමට අනුමත කිරිම තීරණය විය.

iii. රඹුක්කන නගර සැලැස්මට අනුව විදුලි පද්ධතිය ,ජල පද්ධතිය,දුරකථන රැහැන් පද්ධතිය හා ගිනි නිවිමේ පද්ධතිය පොළොව අභ්‍යන්තරයේ උමං මාර්ගයක් මඟින් සැපයීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.පී.පද්මසිරි මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව එස්.ඒ.එන්.කේ.සේනාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.පී.පද්මසිරි මැතිතුමා**

මෙම යෝජනාව සංකීරණ යෝජනාවකි.මෙය ආයතන කිහිපයක් එකතු වී සංවර්ධනය කිරිමට අවශ්‍ය යෝජනාවකි.රඹුක්කන නගරයේ අවකාශය ගොඩක් වැඩිය.ගස් ඉදිරි වැටිමෙන් දුරකතන රැහැන් වලින් අනතුරු සිදුවන ප්‍රමාණය වැඩිය. ඒ වගේම අපගේ අවධානයට ලක් වෙනවා දුරකතන රැහැන්උඩින් යන නිසා අවකාශය ඇහිරිලා තිබෙනවා.නමුත් නගර සැලැස්ම හා ඉදිරියේදී අධිවේගී මාර්ග පිවිසුම සම්බන්ධ වෙනවා.රඹුක්කන කෑගල්ල මාර්ගය සංවර්ධන වෙනවා.මේ සැලසුම් නාගරික සංවර්ධන සැලැස්මෙත් යෝජනා වී ඇත.මේ යෝජනා මේ දක්වා ක්‍රියාත්මක නොවිමට යම්කිසි බලපෑමක් තිබෙන බව පවසන ලදි.මම පෞද්ගලිකව එම නිලධාරින් සමඟ කථා කරන විට ඔවුන් පවසා සිටියේ මේ සියලුම සැලසුම් 2023,2033 ට සකස් කර ඇති බවත්, එම සැලැස්ම ක්‍රියාත්මක නොවුණ බව පවසන ලදි.අදාළ ආයතන දැනුවත් කර අපි මේක සභාවෙන් පටන් ගෙන ඉහළට යන්නට ඕනෑ.මහජන නියෝජිතයන් හරහා යොමු කිරිමෙන් පසුව ක්‍රියාත්මක කිරිමට පුළුවන.මෙම කාර්මික සැලැස්ම අලුත්වැඩියා කිරිමට සිදු වුවහොත් බාධාවකින් තොරව පැනල් එක දීගේ සියලු කටයුතු කර ගෙන යාමට පුළුවන්ය.දැන් පවතින ආකාරයට වතුර ලයින් එක අලුත්වැඩියාවන් සිදු කරනවා නම් මාර්ගය පළුදු කිරිමට සිදු වෙන බවත්,.දුරකතන,විදුලිය අලුත්වැඩියාවන් සිදු කරනවා නම් වාහන නවත්වමින් එම කටයුත්ත සිදු කළ යුතු බවත් පවසන ලදි.එම නිසා මහජනතාවට බාධාවක් වන මේ දේවල් මඟහැර ගැනිමට පුළුවන් මේ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරිමෙන් බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.පී.පද්මසිරි මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ජී.එල්.සරත් කුමාර මැතිතුමා**

පද්මසිරි මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කළ යෝජනාව සාර්ථක යෝජනාවක් බවත්,ගරු සභාපතිතුමා මෙම සැලැස්ම නගර සංවර්ධන සැලැස්ම යටතේ තිබෙන බව පවසන ලදි.මේය කරනවාට අපි විරුද්ධ වෙනවා නොවෙයි.අපට ප්‍රතිපාදන සකස් කර ගැනිම සිදු වන බවත්,එම නිසා රඹුක්කන නගර සංවර්ධන සැලැස්ම ඉක්මන් කිරිමේන් මේ සියලුම ප්‍රශ්න වලට විසඳුම් ලැබෙන බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ජී.එල්.සරත් කුමාර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

අපි නගර සැලැස්ම ක්‍රියාත්මක කරමු.ආණ්ඩුවත් සමඟ එකතු වී වැඩ කිරිම හොඳ බවත්,වැඩිදුර උපදෙස් සහ කාර්මික කමිටුවේ සාකච්ඡා කිරිම හොඳ බවත් ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

සභාපතිතුමනි,මෙතුමාගේ කථාවේදී සඳහන් කළා මේක ක්‍රියාත්මක කරන විට යම් බලපෑම් වගයක් තිබෙන බවට සඳහන් කළා.එම බලපෑම් මොනවද කියලා දැන ගනිමට අවශ්‍ය බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.පී.පද්මසිරි මැතිතුමා**

එකෙන් අදහස් කලේ මෙච්චර කාලයක් ක්‍රියාත්මක නොකිරිමට හේතුව පැවති දේශපාලන අධිකාරිය නිසාය.රඹුක්කන මාවනැල්ල මාර්ගය තවමත් ඒ තත්වයේ පැවතිමට හේතුව එදා තිබුණ දේශපාලන අධිකාරියේ බලපෑම මතයි.එහි කොටසක් සකස් කිරිමත්, අනෙක් කොටස සකස් නොකිරිමට හේතුවට ප්‍රශ්න කරන්නේ තිබුණු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.පී.පද්මසිරි මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ජී.එල්.සරත් කුමාර මැතිතුමා**

මාවනැල්ල රඹුක්කන මාර්ගය සංවර්ධනය කිරිම විශාල ව්‍යාපෘතියකි.එහි උඩින් දුම්රිය මාර්ගය ගමන් කරයි.ඒ වගේම පන්සල ළඟ සිට නුවර හන්දිය දක්වා මාර්ගය ගිලා බසිනවා.ඒ නිසා විකල්ප මාර්ගයක් වශයෙන් නුවර හන්දියේ සිට කඩිගමුව දක්වා පර විශාල කිරිම සිදු කලේ.නගර සැලැස්මට අනුව මෙම මාර්ගයේ ඉරි ගසා තැනින් තැන කාපට් දමා ගැටි දමා තිබෙන බව ප්‍රකාශ කරන ලදි.සී.ජී.ආර්.එකයි මාවනැල්ලයි අතර තිබෙන ප්‍රමාණය අඩුය. එහෙත් අපිට සී.ජී.ආර්.එකයි ඒ කොටස වැඩි කිරිමට නොදුන් නිසා සංවර්ධන යෝජනාව පසු වුණ බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ජී.එල්.සරත් කුමාර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඒ.තරංග නුවන් ප්‍රසන්න මැතිතුමා**

පද්මසිරි මැතිතුමා ප්‍රකාශ කළා යම්කිසි කෙනෙක් අකමැති බව,සමීර මන්ත්‍රීතුමා විමසුවා කවු ද යනුවෙන් නමුත් දේශපාලන හස්තයක් තිබුණේ නැති බව පවසන ලදි.මේ යෝජනාව හෙට වුණත් කිරිමට පුළුවන්.ඔබතුමා පැවසු ආකාරයට මේ යෝජනාව රඹුක්කන නගර සැලැස්මේ තිබෙනවා.මේකට විදුලි බල මණ්ඩලයට මුදල් ගෙවනවා නම් පොළොව යටින් විදුලිය ලබා දීමට පුළුවන.ජල සම්පාදන මණ්ඩලයට,ටෙලිකොම් එකට මුදල් සභාවෙන් ගෙවනවා නම් පොළොව යටින් ගෙනියන එක හෙට වුණත් කරන්නට පුළුවන.අපි මේ දෙවල් වලට සහයෝගය දෙනවා.නගර සැලැස්මේ තිබෙනවා නම් මේක ක්‍රියාත්මක කිරිම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඒ.තරංග නුවන් ප්‍රසන්න මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

සභාපතිතුමනි,යෝජනාවක් සම්මත කර අවසන් කර පසු නැවත විවාදයට ලක් කිරිම නෙහැකිය.එය ව්‍යවස්ථාවට අනුව සුදුසු නැති බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

අපට මේක ක්‍රියාත්මක කිරිමේදී ප්‍රශ්න ටිකක් තිබෙනවා.අපේ ආණ්ඩුවට දේශපාලන සංහිඳියාවක් තිබෙන බව ප්‍රකාශ කරන ලදි.මේ යෝජනාවට උදව් කරන ලෙසත් එහි ඉස්පිලි,පාපිලි වලට තර්ක නොකර ලෙසත්,මන්ත්‍රීවරුන්ට පවසන්නේ විවාද වලට තුඩු දෙන කාරණා සකච්ඡා නොකරන බවට ප්‍රකාශ කරන ලදි. බලපෑම් තිබෙන්නටත් ඇති නොතිබෙන්නටත් ඇති.ඉතිහාසයේ එහෙම තමා දේශපාලනයේ ලොකු ප්‍රශ්න තිබෙන බව පවසන ලදි.මන්ත්‍රීතුමා එක ලේන්එකක ඔක්කොම Line යැවීමට නොහැකිය.විශේෂයෙන් ජලය හා විදුලිය යැවීමට නොහැකිය.මෙහි තාක්ෂණික ගැටළු පවතිනවා. අපි මේකට තාක්ෂණික කමිටුවෙන් උපදෙස් ගැනිම සුදුසු බවට ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

මෙතුමා කළ යෝජනාවේ සඳහන් කළා 2023,2033 සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක කරන බවට මේ 2023,2033 සංවර්ධන සැලැස්මට 2023 දී යෝජනා සකස් කළා නොවෙයි.ඊට කලින් යෝජනා සකස් කර අදාළ කටයුතු සිදු කලේ.එතකොට මේතුමා සඳහන් කරනවා.මැවනැල්ල මාර්ගයේ සංවර්ධන කටයුතු සිදු වී නොමැති ආකාරය ගැන.අපි මේ අලුත් දේශපාලන සංස්කෘතියකට හුරුවෙමින් පවතින්නේ.ඔබතුමා මේ සභාව බොහොම යහපත් අකාරයට කර ගෙන යනු ලබනවා.එතකොට මේතුමා සඳහන් කරනවා කලින් මේ දේවල් සිදු වී නොමැති බවට යහපත් දේශපාලන සංස්කෘතිය ව්‍යාකූල තත්වයට පත් කර ගැනිමට තමා හදන්නේ යනුවෙන් පවසන ලදි.සංවර්ධන සැලැස්ම අනුව හෝ නැතුව හෝ සංවර්ධන කටයුතු කිරිමට.අඩු පාඩු තිබෙන්නට පුළුවන් ඒ වුණත් චෝදනාත්මක ස්වරූපයෙන් එක එක පුද්ගලයන් ඉලක්ක කර ගෙන සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක නොවුණ බවට ප්‍රකාශ නොකරන ලෙස පවසන ලදි. අපි සුහදව වැඩ කරන්නට ඕනැ.ඔබතුමා කලින් ප්‍රකාශ කළ ආකාරයට ජනාධිපතිතුමා,අගමැතිතුමිය,කැබිනට් මණ්ඩලය ආන්ඩුකාරතුමිය,2/3 කේ බලය,මහ සභාව තිබෙනවා බොහෝම අපූරුවට ක්‍රියාත්මක කර ගෙන යාමට පුළුවන.අපෙන් බධාවක් නොමැති බව පවසන ලදි. මේ කාරණා උඩ දී චෝදනාත්මක ස්වරූපයෙන් කථා නොකරන ලෙසත්,මොක ද මට මතකයි නගරය මොන ආකාරයට ද තිබුණේ.සභා ගොඩනැඟිල්ල පවා තිබුනේ කොතැන ද නගරය මැදය.සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක වෙලා තිබෙනවා. පරණ දේවල් සොයා ඒවට ඇඟිල්ල දික් කිරිමට වැඩක් නැති බවත්,මේතුමා ඉදිරිපත් කළ යෝජනාව ක්‍රියාත්මක කිරිමට පුළුවන් නම් හොද බව පවසන ලදි. රඹුක්කන නගරයේ ක්‍රියාත්මක කිරිම සිදු කරනවා නම් විපක්ෂයක් විදිහට අනිවාර්යෙන් සහයෝගය ලබා දෙන බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -

අදාළ යෝජනාව ක්‍රියාත්මක කිරිමට අනුමත කිරිම තීරණය විය.

**iv.** නගරයට ඩිජිටල් දැන්වීම් පුවරු 03 ක් ස්ථාපිත කිරිම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.පී.පද්මසිරි මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ඒ.සුසාන්ත විමලරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.පී.පද්මසිරි මැතිතුමා**

ඩිජිටල් දැන්වීම් පුවරු 03 ක් රඹුක්කන නගරයේ,ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,වහව හන්දිය ඇතුළු ස්ථාන වල ස්ථාපිත කිරිම සුදුසු බව පවසන ලදි.උපකාරක පංති පවත්වන ගුරුවරුත් තාප්ප වල දැන්වීම් ඇලවීම සිදු කර ඇත ප්‍රාදේශීය සභාව මැදිහත් වී එම දැන්වීම් ඉවත් කිරිම සිදු කළ යුතුය.ඒ වගේම වෙළඳසැල් වල දැන්වීම් පළ කිරිමට පුළුවන්.ඒ වගේම පරිසර පිරිසිදු වෙනවා.සභාවට අදායමක්ද ලැබෙන බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.පී.පද්මසිරි මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

මෙම යෝජනාව ගිය සභා වාර වලදීත් කිහිපවතාවක් ඉදිරිපත් වුණා.යෝජනාවක් විදිහට හොඳ යි.නමුත් මේවා ක්‍රියාත්මක කිරිමේදී එන ප්‍රායෝගික ගැටළු ගැන අවබෝධවක් නොමැති වීම නිසා වෙන්න ඇති මේ ඩිජිටල් දැන්වීම් පුවරු තුනක් ස්ථාපිත කරනවා යනුවෙන් සඳහන් කලේ.නඩත්තු කිරිම සිදු කරන්නේ කවුරුන් ද යනුවෙන් පවසන ලදි.දැනට එක ඩිජිටල් තීරයක් පාවිච්චි කර ඇත.එකට යන වියදම අධික බැවින් එම ඩිජිටල් තීරය දැන් නැතුව ඇති.වියදමට සාපේක්ෂව අදායමක් නොලැබේ.තීර තුනක් ස්ථාපික කරනවා කියන්නේ ඒවා නඩත්තු කිරිමට සිදු වෙනවා.දැන්වීම් ලබා ගැනිමට අවශ්‍යයි.අදායමක් ලබා ගැනිමට අවශ්‍යයි.ඒවා කිරිමට අමාරු බව පවසන ලදි.රඹුක්කන නගරය කියන්නේ කුඩා නගරයක් එම නිසා කියන තරම් සුන්දර නැති බවත්.මේ යෝජනා අවබෝධයෙන් ඉදිරිපත් කරන්නේ නම් හොඳ බවත්,මේ වටිනා කාලය නිස්කාරණයේ පාවිච්චි නොකර ලෙසත්,මේගැන ඔබතුමාගේ අවධානය යොමු කරන බව සිතින බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.පී.පද්මසිරි මැතිතුමා**

අපි නගරය සංවර්ධන කරනවා නම් ඉතාමත් හොඳ වැඩපිළිවෙළවල් කිරිමට අවශ්‍යයි.මොක ද එදා හිටපු තැන සිටිමට අවශ්‍ය නැත.අවුරුදු 50 හේ හිටපු තැනම සිටිමට අවශ්‍ය නැත.නවීන ලෝකයත් එක්ක ඉස්සරහට යන්න ඕනෑ.අපි යම් දෙයක් අතහරිනවා නම්,මහ හරිනවා නම් ඒ බැරිකම, මේක යෝජනාවක් අකාරයට ගෙන ඒ සම්බන්ධයෙන් ඇති ආයතන දැනුවත් කර උපදෙස් ලබා ගෙන ක්‍රියාත්මක කිරිම සුදුසු බවත්,ඉස්සර වේලා අවශ්‍ය මේක ක්‍රියාත්මක කිරිමට පුළුවන් ද බැරි ද යන එක තීරණය කිරිම හා මෙය කොයිතරම් දුරකට සාර්ථක වෙනවාද යන්න තිරණය කිරිමය.විගණනයෙන් තීරණය ඇත්තේ ක්‍රියාත්මක කිරිමට බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.පී.පද්මසිරි මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මේ යෝජනාව හොඳයි.එහෙත් තාක්ෂණික ගැටළු පවතිනවා.ඩිජටල් දැන්වීම් පුවරු මඟින් මාර්ගයේ අතුරු සිදු වන නිසා ආණ්ඩුවේ ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන තිබෙනවා අකර්ෂනීය දැන්විම් පුවරු ඉවත් කිරිමට මේ අකාර්ශණිය දැන්විම පුවරු මාර්ග අනතුරු වලට බලපාන බව මීට මාස හයකට උඩ දී සමීක්ෂණ කර තිබෙනවා ඒ අනුව තහවුරු වී ඇත. එහෙත් අපි මේ යෝජනාව භාර ගනිමු .කාර්මික කමිටු වෙන් උපදෙස් ලබා ගැනිමට බව ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

සභාපතිතුමා සඳහන් කරපු කාරණාව ගැන අදහස් දැක්වීමට තමා මම කාලය ඉල්ලා සිටියේ.අපට ආරංචි වී තිබෙන අකාරයට ඔබතුමාලාගේ ආණ්ඩුවෙන් දැනට ක්‍රියාත්මක කිරිමට අරමුණු කර ගෙන තිබෙනවා ඩිජිටල් දැන්වීම් පුවරු ඉවත් කිරිමට.එහෙම තිබිය දී ආණ්ඩුව විසින් මෙවැනි යෝජනා ගෙන ඒම සුදුසු නැත. අපි ඉදිරිපත් කළා නම් කමක් නැත.මොක ද අපි විපක්ෂයේ නිසා.රට එක තැනකට ,නගරය එක තැනට කියලා මේ වගේ යෝජනා ආණ්ඩුවක් විදිහට ගෙන එනවා නම් බොහෝම දුර්වල තැනක තිබෙනවා කියලා තමා අපිට දැනේනනේ යනුවෙන් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මෙම යෝජනාව පළමුව කාර්මික කමිටුවට යොමු කර විශ්ලේෂනයක් කර ගනිමු යනුවෙන් ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

අදාළ යෝජනාව ක්‍රියාත්මක කිරිමට අනුමත කිරිම තීරණය විය.

**(ඊ)6.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ජී.ලයනල් සරත් කුමාර මැතිතුමා**

i. අංක 21 B ,උඩුගම,ගොනදැවල,වසමේ පුංචි වැලිකන්ද ,මහ වැලිකන්ද මාර්ගයේ පානිය ජලය ලබා දිම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ජී.ලයනල් සරත් කුමාර මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි පී.ජී.මල්ලිකා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ජී.ලයනල් සරත් කුමාර මැතිතුමා**

මීට වසරකට කලින් මුළු ගොන්දැවල වසම ආවරණය වන පරිදි 1.8 km ජල ව්‍යාපෘතියක් සිදු කළ නමුත් උඩුගම ප්‍රධාන මාර්ගයේ කන්ද උඩට ඇදිමක් සිදු නොවුන නිසා එතැනින් නතර කර ගොන්දැවල කන්ද ආවරණය කර ජල ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරන ලදි. පුංචි වැලිකන්ද ,මහ වැලිකන්ද ජනපද සඳහා වතුර ලබා ගැනිම සඳහා ඇස්තමේන්තු සකස් කර කිලෝමීටර් 08 ක පමණ දුරක් සඳහා ජලය ලබා දීමට හැකි විය.එහෙත් මහ වැලිකන්ද ජනපදයේ මාර්ගය ළඟ අයට ජලය ලබා ගැනිම පුළුවන් වුණ නමුත් දුර පිහිටි නිවාස සඳහා ලබා ගැනිමට නොහැකි විය.මෙහි තව පවුල් 12 කට පමණ ජලය ලබාදිමට ඇත.මෙම ව්‍යාපෘතිය පිටතට දෙනවා නම් විශාල මුදල් වැය වේ.මේකට ජල සම්පාදනයෙන් ඇස්තමේන්තු සකස් කර කරනවා නම් ලක්ෂ 22 ක් යන බව පවසන ලදි.එහි ජනතාව අපට දැනුම් දී ඇත්තේ මිනිස් ශ්‍රමය යොදා ගෙන ගල්වැලි හා කාණු කැපිම සිදු කර ගන්න බවයි.එම නිසා පළාත් සභාවේ ප්‍රතිපාදන වලින් හරි කොහොම හරි ලක්ෂ දෙකක මුදලක් ලබා දෙන ලෙස ඉල්ලා සිටින බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ජී.ලයනල් සරත් කුමාර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු උපසභාපති ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා**

සභාව ඝෝෂාකාරි වීම නිසා කරුණු පැහැදිලි නැත.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

ජලය ,ඩිජිටල් වැනි දේවල් මහජනතාවට අයිති දේවල්ය. කාර්මික කමිටුවට යොමු කර වාර්තාවක් ලබා ගැනමට අවශ්‍ය බවට ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

අදාළ යෝජනාව ක්‍රියාත්මක කිරිමට අනුමත කිරිම තීරණය විය.

ii. අංක 20 කඩිගමුව වසමේ නාගොල්ලාගම මාර්ගයේ පානීය ජලය ලබා දිම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ජී.ලයනල් සරත් කුමාර මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.පී.එස්.දුමින්ද ප්‍රේමසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ජී.ලයනල් සරත් කුමාර මැතිතුමා**

මාවනැල්ල,රඹුක්කන ප්‍රධාන මාර්ගයේ කඩිගමුව,නාගොල්ලාගම මාර්ගයේ යකඩ පාලම තිබෙන තැනට පවුල් 05 ජලය ලබා දීමට ඇත.ප්‍රධාන මාර්ගයෙන් ජලය ගිහින් තිබුණත් ඒ මිනිස්සුන්ට වතුර නැත.ඒ ටිකට ජලය ලබා දීමට පුළුවන් වුණෝත් අපි කාටවත් මහජනතාවගෙන් කිසිම දෙයක් අහන්නට සිදු වන්නේ නැති බව පවසන ලදි.අපි මහජනතාවගේ අවශ්‍යතාවයන් ඉටු කළ යුතුය.එම නිසා මේකට ඇස්තමේන්තු සකස් කර ලබා දෙන ලෙසත් ඉල්ලා සිටින අතර ම ඔබතුමාට ප්‍රතිපාදන දීමට නොහැකි නම් පළාත් සභාවට යොමු කර ආණ්ඩුකාරතුමියගේ අනුමැතිය මේ සඳහා ලබා ගෙන කරන ලෙසත්,මේ සඳහා සුළු මුදලක් වැයවෙන බැවින් අපිට ලොකු වැඩ කිරිමට නොහැකි නම් පොඩි වැඩක් හරි කරලා බලමු යැයි ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ජී.ලයනල් සරත් කුමාර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

ඔබතුමා මාහට තොරුතුරු ලබා දීම සුදුසු බවත්, එම තොරතුරු කාර්මික කමිටුවට යොමු කර මෙම කටයුත්ත කර දෙන ලෙස පවසන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

අදාළ යෝජනාව ක්‍රියාත්මක කිරිමට අනුමත කිරිම තීරණය විය.

**(ඊ)7.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා**

i. සති පොළ භූමියේ තිබෙන රෙදි කඩ කාමර වෙනුවට නව රෙදි කඩ කාමර ඉදි කිරිම හා එයට සම්බන්ධ ළමා උද්‍යානය ඇති දැනට සවි කර නොමැති ඔන්චිල්ලා ආදි උපකරණ සවි කිරිම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා**

සතිපොළ භූමිය ඉතාමත් අවිදිමත් අකාරයට පවතින රෙදි කඩ ඉදි කිරිමට සිදු කළ යුතු බව පවසන ලදි.ආණ්ඩුකාර අනුමැතිය ලැබිලා ඇති බැවින් සතිපොළ භූමිය විදි තුනකට කොටස් කර සකස් කිරිමත්,එළවළු විකුණන ස්ථානයට ඉදිරිපිට ළමා උද්‍යානය අතර තිබෙන කොටසේ ප්ලාස්ටික්,මැටි වළං එම ස්ථාන සකස් කිරිමත් සිදු කරනු ලබයි.එයින් මහජනතාවට එකම විදියකින් එළවළු, ප්ලාස්ටික්,මැටි වළං ලබා ගැනිමට හැකිවන බව පවසන ලදි.ඉඩ මදි වීමක් සිදු වුවහොත් කොටසක් තාවකාලිකව ලබා ගැනිමට සැලසුම් කර ඇත. මාර්ගය ආසන්නයේ පිහිටි රෙදි කඩ වලට මාළු කඩවල වතුර ගලා ගෙන යන බැවින් එම රෙදි හිමියන් සමඟ කථා කර එතැනින් ඉවත් කර දිම සිදු කළයුතු අතර එම රෙදි කඩ ඉවත් කිරිම කලින් රෙදි කඩවෙනත් ස්ථානයක ස්ථාපන කළ යුතුය.ඊළඟට ළමා උද්‍යානය ඉදි කිරිම සිදු කළ යුතුය.එහි වැට සකස් කර ඔන්චිල්ලා සවිකළ යුතුය.අපි එම වැඩ කොටස සභාවෙන් හරි සවිකර සෙල්ලම් කිරිමට හැකිවන ආකාරයට සකස් කරන බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

මෙතුමා රෙදි කඩ පිළිබඳ ඉදිරිපත් කළ යෝජනාව ගිය සභාවාරයේදී ඔබතුමා ඉදිරිපත් කළා නේද යනුවෙන් පවසන ලදි.පොළ භූමියේ ඇති රෙදි කඩ පිළිබඳව නැවත එම යෝජනාව සාමන්‍යයෙන් පනතේ අකාරයට ඉදිරිපත් කළ නොහැකිය.සංශෝධන නොව රෙදි කඩ පිළිබඳ ගෙන ආ යෝජනාවක් නැවත ඉදිරිපත් කිරිමක් වෙන්නේ මගේ දැනුමේ හැටිය යනුවෙන් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

එම යෝජනාවේ සංශෝධයක් ඉදිරිපත් කලේ.රෙදි කඩ වල තිබෙන ප්‍රශ්න සාකච්ඡා කරන විට කඩහිමියන් විසින් පැවසුවේ හරියට කඩ නැති බවත්,තැන්තැන්වල තිබෙන නිසා පාරිභෝගිකයන්ගේ පැමිණිම අඩුය.විදුලිය නැත.එම නිසා ඔවුන් එක්ක එකතු වී සාකච්ඡා කර ඉහත සාකච්ඡා කළ අදහස් වලට පැමිණි බව පවසන ලදි.මා විසින් මේ කාරණාව කාර්මික කමිටුවට භාර කර විධිමත් සැලැස්මකට අනුව ඉදිරිපත් කරන ලෙස දැනුවත් කළා.ඒ වගේම සෙල්ලම් මිදුල ආවරණය කර සකස් කිරිම හොදයි යනුවෙන් පවසන ලදි.නාගරික සංවර්ධන අධිකරියේ පවසන්නේත් එම සෙල්ලම් මිදුල එම ස්ථානයට නොගැළපෙන බවයි.එහෙත් නාගරික සංවර්ධන අධිකාරියට ද අදහසක් නෑ මේක කොතන ස්ථාපනය කරන්නේ කියලා.එම නිසා අපි එකත් සකස් කිරිමට සුදානම් කරගත් බව පවසන ලදි.එම සෙල්ලම් මිදුල සකස් කිරිම හා තීන්ත ගැමට කොන්ත්‍රාත් පදනම මත කරන බවත්,සවි කිරිම සඳහා සභාවේ සේවකයන් යොදවා ගන්නා බවත්,ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.කේ.එම්.අනීස් මැතිතුමා**

උපාලි රෝහණ මැතිතුමාගේ යෝජනාවට මම ද අදහස් කිහිපයක් ඇතුළත් කිරිමට කැමතිය.අපි කාර්මික කමිටුවේ සාකච්ඡා කළ පරිදි සතිපොළ භූමිය ආරක්ෂිතව හා අලංකාර ලෙස සකස් කර යම් කිසි පිළිවෙළකට කිරිමට කාර්මික කමිටුවේදී ප්‍රකාශ කළා.ගරු සභාපතිතුමනි පළමුවෙන්ම සකස් කිරිමට අවශ්‍ය වන්නේ විදුලි පද්ධතියයි.සති පොළෙන් අපිට ලොකු අදායමක් ලැබෙන දෙයකි.මෙහි දී පළමුවෙන්ම දැනුවත් කළේ.විදුලි පද්ධතිය සකස් කර දෙවනුව සතිපොළ භූමියේ පිහිටා ඇති වෙළඳ කුටි සකස් කිරිමය.එම සති පොළ ඉතාමත් අක්‍රීය තත්වයක පවති.උඩ ස්ථානයක සිට බැලු විට ඉතාමත් අවලස්සනට පෙනෙන බව පවසන ලදි.සතිපොළ භූමියේ හැටි පොළ දසවට බලන එක තමා හොඳ එවිට අඩුපාඩු දැනගැනිමට

පුළුවන.ව්‍යාපාරිකයන්ගේ හා පාරිභෝගිකයන්ගේ සියලුම වාහන එම සතිපොළ භූමිය ඇතුලෙහි නවත්වා ඇත.ඒ වගේම එම පොළ ඇතුලෙහි වලක් ඇති වී තිබෙනවා.වර්ෂා කාලයේ දී ජලය එම වලමැදින් ගලා බසින බවත් පවසන ලදි.වාහන සති පොළ ප්‍රදේශයෙන් ඉවත් කර වෙත් තැනක ස්ථාපනය කිරීම සුදුසු බවත් පවසන ලදි.ඒ වගේම සති පොළ සඳහා ආරක්ෂාවක් නොමැති බවත්,වෙන සියලුම දේවල් සති පොළ භූමිය තුළ සිදු වන බවත් ප්‍රකාශ කරන ලදි.එම නිසා අරක්ෂක වැටක් ඉදි කර සවිකර පොළ දසවසට කලින් දවසේ පාන්දර තුනට හෝ හතරට විවෘත කිරීම සිදු කරන්නේ නම් හොඳ බවත්,බඩු රැගෙන එන්නේ උදේ හයත්, හතත් අතර නිසා එම වේලාවට විවෘත කිරීම සුදුසු බව පවසන ලදි.විශේෂයෙන් සභාවට අදායමක් ගෙවනවා නම් අපි මැදිහත් වී වියදම් කර පිළිවෙළකට සකස් කිරීම කළයුතු බව ප්‍රකාශ කරන ලදි.ඒ වගේම සති පොළ තුළ පිහිටි ළමා උද්‍යානය එයට නුසුදුසුය.එම නිසා එකටත් යම්කිසි දෙයක් කිරීම සුදුසු බවත්,සභාවේ ප්‍රතිපාදන වෙන් කරලා හෝ වෙනයම් විදිහකින් ලැබෙන ප්‍රතිපාදන වලින් හරි ඒකත් පිළිවෙළකට කරන්නේ නම් හොඳ බව පවසන ලදි.ගරු සභාපතිතුමනි,ඔබතුමා මැදිහත් වී අලංකාර සති පොළක් හැටියට මෙම සති පොළ පත් කිරීමට කටයුතු කරන ලෙස ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.කේ.එම්.අනීස් මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

සති පොළෙහි ආරක්ෂාව සඳහා පළාත් මාර්ග පොදු පහසුකම් සේවා යටතේ ලක්ෂ 2 ක් ලැබී ඇත.ලොකු ප්‍රමාණයකින් කිරීමට නොහැකි බවත්,යම්කිසි ප්‍රමාණයක් කිරීම හැකි වන බවත් පවසන ලදි.කවුරුත් පවසන දෙයක් තමා සෙල්ලම් මිදුල තිබෙන ඇත සුදුසු නැති බව.දැන් වියදම් කර සකස් කර ඇති බැවින් එයින් වැඩක් ගැනීමට අවශ්‍ය නිසාත්, එහි සෙල්ලම් බඩු ක්ෂය වෙනකම් ළමයින් සෙල්ලම් කිරීමට අවස්ථාව ලබා දෙන අදහසින් මෙම යෝජනාව ඉදිරිපත් කළේ.මම හිතන ආකාරයට අපිත් නාගරික සංවර්ධන අධිකාරියත්, සියලුම ආයතනත් සෙල්ලම් මිදුල එතන දැමීමට කැමති නැත.නමුත් මේ අවස්ථාවේ ඉවත් කිරීම සිදු කරනවාට වඩා හොඳයි.සෙල්ලම් මිදුලට යම් දෙයක් කිරීම.තාක්ෂණය අවශ්‍ය නැති බවත් පවසන ලදි.ප්‍රාදේශීය සභාවේ මේකට ගැළපෙන සේවකයන් සිටිනවා.නව නගර සැලැස්ම ඉදිරිපත් වුණාට පසුව කඩ ටිකයි.රථගාලයි පිටුපසට ගන්ට බලන විට නාගරික සංවර්ධන අධිකාරිය විසින් අපට රථගාලක් සකස් කර දී ඇත.එහෙත් එය තවම භාවිතා කිරීම නෙහැකිය.මුදල් පාස් කර ඇත.එහෙත් අපිට තාම එය උදාකර ගැනීමට හැකි වී නැත.එයට හේතුව දැන් තිබෙන අක්‍රමවත් පොළ නිසා.අපි උත්සහ කරනවා පොළ හා සෙල්ලම් මිදුල ක්‍රමවත් කිරීම,මේ අදහසින් තමා යෝජනවා කාර්මික කමිටුවෙන් සාකච්ඡා කර සභාවට ඉදිරිපත් වුණේ.මෙයට ලොකු වියදමක් යන වැඩක් නොවේ.කඩහිමියන් පොරොන්දු වුණා ඔවුන් ළඟ තිබෙන ලී කණු යොදා කඩ ටික සකස් කර ගැනීමට.මැද මාර්ග ටික සකස් කිරීමට අපිට පොඩි වියදමක් දැරීමට සිදු වෙන බවත් ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

අදාළ යෝජනාව ක්‍රියාත්මක කිරීමට අනුමත කිරීම තීරණය විය.

ii. නගරයේ පවත්වා ගෙන යනු ලබන රූපලාවන්‍යා ස්ථාන ,කාය වර්ධන මධ්‍යස්ථාන නියාමනය කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ඩබ්.එන්.සුරංජනි සෝමදාස මැතිතුමිය විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා**

දැනට බියුටි සැලුන්වල ප්‍රශ්නයක් වෙලා තිබෙනවා.එම ප්‍රශ්නය විශේෂයෙන්ම රට පුරා ප්‍රධාන නගරවල දැනට පවතිනවා. රූපලාවන්‍ය ආයතන වල ක්‍රීම් වර්ග මේවා සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලියාපදිංචි නැති ප්‍රමාණයක් රටට ඇවිත් තිබෙනවා.විශේෂයෙන්ම මාධ්‍ය හරහා මේවා දිනෙන් දින ප්‍රචාරණය වීමක් ද සිදු වෙනවා.සභාවේ සිටින මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු හා ඔවුන්ගේ දැනුම ප්‍රමාණවත් නොමැති නම් ඒ සම්බන්ධ දැනුම ඇති පිරිසක් සමඟ එකතු වී නියාමනය කිරීම සුදුසු බවට පවසන ලදි.ඒ වගේම පළපුරුදු හා සහතික ලබාගෙන නොමැති කාය වර්ධන මධ්‍යස්ථාන වලට ගොස් තරුණ පිරිස් නොයෙක් දේවල් වලට ලක් වී ඇත.සමහර කාය වර්ධන මධ්‍යස්ථාන පවතිනවා සභාවේ අනුමැතියක් නොමැති ඒවා විශේෂයෙන් එම ආයතන නියාමනය කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

මෙතුමා සඳහන් කරනවා කාය වර්ධන මධ්‍යස්ථාන නියාමනය කිරීමට අවශ්‍ය බව,දැනට ප්‍රාදේශීය බල ප්‍රදේශය තුළ නගරයට ආසන්නවම හරි අරගෙන ඔබතුමාට සඳහන් කිරීමට පුළුවන් ද එවැනි කායවර්ධන මධ්‍යස්ථාන කොපමණ ප්‍රමාණයක් පවතිනව ද යනුවෙන් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා**

රඹුක්කන නගරයේ කාය වර්ධන මධ්‍යස්ථාන තුනක් පවතින බවත්,කිරිවල්ලා පිටියේ එක ආයතනයක් තිබෙන බවත්,ඒ වගේම අපි නොදැනුවත්වම තව ඇති බව.පවසන ලදි.එම මධ්‍යස්ථාන කාය වර්ධන ශක්තිමත් කිරීමට හොඳ බවත්,ඒ වුණත් ඒවා නියාමනය කිරීම හොඳ බවත්, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.කේ.එම්.අනීස් මැතිතුමා**

රූපලාවන්‍ය ආයතන පත්වාගෙන යන්නේ එම පුද්ගලයන් මහන්සි වී පාඨමාලාවට ගොස් සහතික ලබා ගෙන එම ආයතන විවෘත කරන ලදි.කාය වර්ධන මධ්‍යස්ථානය අදාළ අංශ වලට ගොස් සහතික ලබා ගෙන ඇත්නම් ප්‍රශ්නයක් නොමැති බව පවසන ලදි.කාය වර්ධන හෝ රූලාවන්‍ය ආයතන වලට අදාළ නිලධාරින් යොමු කර පරීක්ෂා කිරීමට ප්‍රශ්නයක් නොමැති බවත් පවසන ලදි.එසේ කිරීමෙන් නිසියාකාරව පිළිවෙළකට යන්න පුළුවන්.ඒ වුණත් රඹුක්කන ලියාපදිංචි නොවුණ මිනින්දොරු මහත්වරු සිටිනවා.අපි වගකීමෙන් මහජනතාව වෙනුවෙන් කථා කිරීම වටිනවා.නමුත් අපි මෙතනට ඇවිත් කඩාකප්පල් කිරීමක් සිදු කරනවා නම් එය හොඳ නැති බවත්, සභාවෙන් යම්කිසි වැඩ පිළිවෙලක් කරනවා නම් පරීක්ෂා කර නිත්‍යානුකූල ලියාපදිංචි ආයතන පවත්වාගෙන යාමට අවසර දෙනවා නම් හොඳ බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.කේ.එම්.අනීස් මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

අපගේ මහජන පරීක්ෂණ මහතුන් සමඟ බලපත්‍ර කමිටුවෙන් උපාලි රෝහණ මන්ත්‍රීතුමාගේ ඒ යෝජනාව සාකච්ඡා කිරීම යොමු කිරීම සුදුසු බව ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
අදාළ යෝජනාව ක්‍රියාත්මක කිරිමට අනුමත කිරිම තීරණය විය.

iii. ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන පිවිසුම් ගේට්ටුව සඳහා පුද්ගලික ආරක්ෂක සමාගමක සේවය ලබා ගැනිම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනා ගරු උප සභාපතිතුමා විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා**

ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන ගේට්ටුවට දැනට සේවය සපයන්නේ කාන්තාවන්ය.පහළ මහලේ බැංකු දෙකක් තිබෙන නිසා ඔවුන්ට වාහන හසුරුවා ගැනිමට තරමක් අපහසුය.එම නිසා අරක්ෂක සමාගමකට යොමු කර ඔවුන්ගේ සේවාව සපයා ගැනිම සුදුසු බවත්,ඔවුන් සේවය කරන්නේ නිල ඇඳුමින් නිසා බාධාවකින් තොරව සේවාව සැපයිම සිදු කළ හැකිය. අපගේ නිලධාරින්ට නිල ඇඳුමක් නොමැති බැවින් මෙය කිරිම ද අපහසුය.ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ආරක්ෂාව සපයන්නේ පෞද්ගලික අංශයෙන් ඔවුන් එක හරියට සැලසුම් කර ගේට්ටුවෙන් උඩට වාහන වලට යන්නට නොදී හොඳ සේවාවක් සපයනවා. පෞද්ගලික ආරක්ෂක සමාගමක සේවාව ලබා ගතහොත් දැනට බිම් මහලේ ද බැංකු දෙකක් ක්‍රියාත්මක වෙනවා.එහි ඉතිරි කිරිමේ බැංකුවේ පමණයි.ආරක්ෂක නිලධාරියෙක් සිටින්නේ.අනෙක් බැංකුවේ ආරක්ෂක නිලධාරියෙක් නොමැති බවත්, යම් එහෙකින් ප්‍රශ්නයක් වුණොත් සභාවේ ගොඩනැගිල්ලක් ලබා දී ඇති බැවින් වගකිමට සිදුවේ.ඒ වගේම සභාවට ද යම්කිසි පාලනයක් නියාමනයක් තිබෙන්නට අවශ්‍යයි.එම නිසා පෞද්ගලික ආරක්ෂක සමාගමක සේවාව ලබා ගතහොත් සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ජී.එල්.සරත් කුමාර මැතිතුමා**

මෙය සාර්ථක යෝජනාවක් වගේම සභාවට වැය බරක් දැරිමට සිදු වෙනවා. පෞද්ගලික ආරක්ෂක මණ්ඩලයක් ගන්නනෙ නම් අඩුම තරමින් දෙදෙනෙක් ලබා ගතහොත් මාසයකට ලක්ෂයකටත් වඩා වියදම් යන බව ප්‍රකාශ කරන ලදි.පැය 24 ක සේවයකි.ඒක සභාවට තමා දරන්නට වෙන්නේ.මෙතන බැංකු තිබෙනවා කියලා සඳහන් කළාට බැංකු කුලියට දීලා තිබෙන්නේ.අපි බැංකු වලට ආරක්ෂාව සැපයිමට බැදිලා නැත.බැංකු වල ආරක්ෂාව බැංකු විසින් සපයා ගතයුතු බවත් පවසන ලදි.අපේ සභාවේ ආරක්ෂාව සඳහා සභාවේ මුරකුරුවන් දෙදෙනෙක් පාවිච්චි කිරිම සුදුසු බවත්, නැත්නම් සභාවට තවත් ලක්ෂයක මුදලක් මාසයක දරන්නට වෙනවා. පෞද්ගලික ආරක්ෂක සේවාවක් ලබා ගන්නේ නම් ඒ ගැන කල්පනා කිරිම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ජී.එග්.සරත් කුමාර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

මෙතුමාගේ යෝජනාව ධනාත්මක එකකි.මම අදහස් කළේ සේවකයන්ට නිල ඇඳුම් ගිය වර්ෂයෙත් ලබාදී නොමැත. නිල ඇඳුම් අනුමත වි ඇත.මුරකරුවන් සඳහා ටී ෂර්ට් එකක් හා බොටමක් ලබා දීමට අනුමත වී ඇති අතර ගිය වර්ෂයේ ලබා දීලත් නැත.මේ වර්ෂයේ දීලත් නැත.එසේ රජ්‍ය සේවකයන් සඳහා නිල ඇඳුම් ලබාදීම ප්‍රමාද විම හේතුව කුමක් ද යනුවෙන් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා පවසන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

ප්‍රමාද විමට හේතුව තමා අපේ තිබුණ අකාර්ෂක්ෂමතාවය හෙට ටෙන්ඩර් එකක් විවෘත කරනවා. මම පැමිණාට පසුව මුලින්ම නිල ඇඳුම් යෝජනා කළේ.අපට මුකරුවන් ලබා ගැනිමට නොහැකිය.හිඟයක් නොමැති බැවින් රාත්‍රි මුර සේවය සඳහා මුකරුවන් දෙදෙනෙක් සිටිනවා.ඉන් එක් මුරකරුවෙක් සවස 6.00 ට පැමිණ උදේ 6.00 ට සේවය අවසන් කරනු ලබයි. එතකොට උදේ 6.00 සිට 7.00 වෙන තුරු මුරකරුවෙක් නොමැත.සවසට වෙනත් සේවයක යෙදී සිටින වැඩ ක්ෂේත්‍ර කාන්තා කම්කරුවන් දෙදෙනෙකු යොදලා ඇති බවත්,එම දෙදෙනා සවස 4-5ත් අතර සේවය අවසන් කරනු ඇත.සවස 6.00 සිට මුකරුවෙකු නොමැත.සවසට මා හට මුරකිරිමට සිදුව ඇත.ඒක මම ආඩම්බරයෙන් පවසන බව ද ප්‍රකාශ කරන ලදි.ඒ ආකාරයට ආරක්ෂණ සේවාව සිදු වන්නේ.ලයනල් මන්ත්‍රීතුමා පවසන ආකාරයට ලක්ෂයක් වියදම් වෙනවා.දැනුත් ලක්ෂයක් අපරාදේ යනවා අපිට අර දෙදෙනා වෙනත් වැඩකට යෙදෙවා ගැනිම නොහැකි විම නිසා ඒ වගේම කොම්පෝස්ට් එකට සේවකයෝ මදි, එළයේ වැඩ කිරිමට සේවයන් මදි.අපිට මදි වුණාට ගැනිමට නොහැකිය ලබා ගන්නා ප්‍රමාණය පිරි පවතින බැවින් එම නිසා අපිට ඒ දෙන්නා වෙන වැඩකට යොදවා ගැනිමට හැකි වෙනවා තවත් ලක්ෂයක් ලබා දි පෞද්ගලික ආරක්ෂක සේවාවලබා ගැනිමේන් බව පවසන ලදි.ලේකම්තුමා විසින් මේ සඳහා ප්‍රතිපාදන වෙන් කර ඇත. පෞද්ගලික ආරක්ෂක සේවාව ලබා ගන්නේ බැංකු ආරක්ෂාවට නොවේ.ඒවා අපේ දේවල්ය.එය මේ පරිශ්‍රයේ තිබෙන්නේ.සුසාන භූමියෙත් ඔය ප්‍රශ්නය තිබෙනවා.දැන් එහි සේවකයන්ට නිල ඇඳුමක් ලබා දී ඇත.එයට මිනිසුන් පැමිණි පසු අදාහනාගාරයේ සිටින සේවකයන් සොයා ගැනිමට නොහැකි විම නිසා.උපාලි රෝහණ මහතාගේ යෝජනාව කාලෝචිතයයි.දැන් තිබෙන සැබෑ තත්වය මම මේ පැහැදිලි කළේ.දැන් සිටින්නේ මුරකරුවන් නොවේ.වැඩ ක්ෂේත්‍ර කම්කරුවන්ය .ඒ අයගෙන් තමා දැනට මුරසේවාව සිදුවන්නේ.CCTV පද්ධතිය,ආලෝක පද්ධතිය එනවා.එතකොට බොහොදුරට මුරකරුවන් නැති වෙන්නට ඉඩ ඇත.අපේ කාර්යාල පරිශ්‍රයට මුරකරුවෙක් සිටිය යුතුය.වාහන තිබෙන නිසා ආරක්ෂාව තිබිය යුතුය.විදුලි අංශයේ අය නීතී දමලා වැඩ ගැනිමට නොහැකිය වගේම මුරකරුවන් නොවන අය සේවයේ යෙදවිමෙන් නීතිමය ප්‍රශ්න එන බව ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
අදාළ යෝජනාව ක්‍රියාත්මක කිරිමට අනුමත කිරිම තීරණය විය.

iv. බොරළුව වැව අවට ශුද්ධ පවිත්‍ර කොට මාර්ගය අසල තිබෙන ඉඩම් කොටසේ අවට ගම් වාසින්ගේ කෘෂි භෝග අලෙවි පොළක් පවත්වා ගෙන යාමට සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එන්.කේ.සේනාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා**

බොරළුව වැව අවට ශුද්ධ පවිත්‍ර කිරිම කලින් සිදු කර ඇති බවට පවසන ලදි.එහෙත් එහි පස් ඉවත් නොකර වැව වටේ තිබෙන බවත්,එම පස් ගැල වී නැවත වැවට වැටීම සිදු වන බවත් පවසන ලදි.වැවයි මාර්ගයයි අතර අඩි 20 ක පමණ පළල ඉඩම් කොටසක් ඇති බව පවසන ලදි. බොරළුව හන්දිය ළඟට වටේ ශුද්ධ කර ගැනිමෙන් හොඳ ඉඩම් කොටසක් ලබා ගතහැකිය. ඒ වගේම වැව සම්බන්ධ කර මාර්ග හතරක් ඇති බැවින් එහි හතර මං හන්දියක් ඇත.අලවත්ත,බොරළුව,ඊරියගොල්ල,ඇත්වටේ,කිරිවල්ලාපිටිය මේ හැම තැනම එම

මං සන්ධියට සම්බන්ධ වේ.විශේෂයෙන් ඊරියගොල්ලේ තිබෙනවා කෘෂි භෝග මෙම භෝග අලෙවි කිරිමට ස්ථානයක් නොමැත.සමහර විට කිරිවල්ලාපිටියට රැගෙන යාම සිදු කරනු ලබයි.එහෙත් එම ස්ථානයේ එළවළු කඩවල් දෙකක් පමණක් ඇත.ඒවගේම නගරයට එළවළු ගෙන එම සිදු කරන්නේ නම් ත්‍රී රෝද රථයක් ලබා ගැනිමට සිදු වන බවත්,එම රථයට රු250.00 ක පමණ මුදලක් වැය වේ. එම නිසා බොරළුව වැව ළඟ ඉඩම් කොටස ශුද්ධ පවිත්‍ර කර පොඩි පොළක් වගේ ඇති කරනවා නම් හොඳ බවත්,විශේෂයෙන් ජනතාවගේ ආර්ථික මට්ටම ශක්තිමත් කිරිමට පුළුවන. ඉන්පසුව අපට වැඩි දියුණු කර ගැනිමට හැකි බව ප්‍රකාශ කරන ලදි.විශේෂයෙන් පොල්,තැඹිලි වැන දේවල් අලෙවි කර ගැනිම හොඳ අලෙවිපොළක් පවත්වාගෙන යාමට හැකි බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මෙම යෝජනාව කාලෝචිතයි.අපිට සක්‍යතා වාර්තාවක් සමඟ ඉදිරිපත් කරන ලෙසත්,කාර්මික කමිටුවට ඉදිරිපත් කර කමිටුවේ සාකච්ඡා කර කිරිමත්,මෙහි අපවාර ගොඩක් සිදු වන නිසා අපට එයත් බේරා ගැනිමට හැකි වන බවත්, ගරු සභාපති ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටිකිරි බංඩා තෙන්නකෝන් මැතිතුමා**

ඉඩම සභාවට අයිති එකක් ද කියලා දැන ගැනිමට කැමති බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටිකිරි බංඩා මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

එකට තමා සක්‍යතා වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස දැන්වා සිටියේ. එයින් සියලුම කරුණු අනාවරණය වෙන බව **ගරු සභාපති** ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් පවසන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -
අදාළ යෝජනාව ක්‍රියාත්මක කිරිමට අනුමත කිරිම තීරණය විය.

v. කිරිවල්ලා පිටිය පොදු සුසාන භූමියේ පහළ කොටසේ දේහයන් තැන්පත් කිරිම සඳහා ගොඩනැඟිල්ලක්((Porler) -සියලු පහසුකම් සහිත) ඉදි කිරිම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී ඩබ්.එන්.සුරංජනී සෝමදාස මැතිතුමිය විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා**

විජයමන්නාහේන මාර්ගයේ ඉහළ කොටස අදාහනාගාරය තිබෙන බවත්,දේහයන් භූමදානය කරන පහළ කොටසේ අක්කර 2 කට වැඩි භූමි ප්‍රමාණයක් ඇති බවත්,මෙතෙක් එහි දේහයන් තැන්පත් කරන බවත් පවසන ලදි.මම මේ යෝජනාව ගෙන ඉදිරිපත් කලේ.සමහර ගෙවල් වල දූව හෝ පුතාගේ රැකියා කරන ස්ථානයෙන් මරණයට සහභාගි වීමේදී ගෙදර දේහය තබා ගැනිමටවත් ඉඩකඩ නැති නිවාස තිබෙනවා.කැම දිමට ගිය විට ළඟ පිහිටි නිවාසයේ හිමිකරු සමඟ තරහය. එතකොට මල්ශාලාවක තැන්පත් කිරිමට සිදු වෙනවා.මේ දෙය කිරිමෙන් සභාවය ආදායමක් එන බවත් පවසන ලදි.එම නිසා පර්චස් 10 ක පමණ

කොටසක් ගෙන හොඳ මල්ශාලාවක් සකස් කර දේහයන් තැන්පත් කිරිමට ස්ථානයක් සකස් කර දුන්නොත් විශේෂයෙන් වටින බව පවසන ලදි.ඒ වගේම අපිට මෙක වැඩිදියුණු කර ගැනිමට පුළුවන් ප්‍රාදේශිය සභාවට ආදායමක් එන ලෙසට දෙමහල් ගොඩනැගිල්ලක් බවට පත් කර යටි මහලේ මිණී සාප්පුවත්.ඒක අපිට සහනදායි ලෙස ලබා දිමට පුළුවන්ය.ඒ වගේම භූමදානය කරන කොටසේ පොලිතින් වැනි දේවල් විශාල වශයෙන් පවතින බැවින් සභාව මඟින් කුණු රෝලක් සාදා ඒකට සවි කිරිමට පුළුවන්ය. සභාවේ සේවකයන් දෙතුන් දෙනෙකු යොදවා වල කැපිමට පුළුවන් වන බැවින් මල් ශාලාවක් ඉදිරිකිරිමෙන් ඈත සිටින අයට ප්‍රවාහනය කිරිමට යන වියදම අඩු වී මෙන් වැය බර ද අඩු වේ.දැනටත් ව්‍යාපාරිකයන් දෙදෙනෙක් මේ සඳහා දායකත්වය දක්වන වන බවට පොරොන්දු වී ඇති බවත් පවසන ලදි.සමහර නිවාස වලට ගමන් කිරිමට මාර්ගයක් නැත.එම නිසා සභාව මඟින් පොදු ස්ථානය මෙයට සකස් කර ගැනිමටත්, සභාවට ආදායමක් ලැබෙන නිසාත් මේ යෝජනාව ඉදිරිපතත් කළ බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටිකිරි බංඩා තෙන්නකෝන් මැතිතුමා**

දැනට ශාලාවක් තිබෙන බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටිකිරි බංඩා මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා**

දැනට තිබෙන්නේ දේහයන් තැන්පත් කිරිමට නොවේ.ගරු මන්ත්‍රීතුමා ඒක හදිසි අවස්ථාවක දේහය ගෙන විත් තබන ස්ථානයකි.මේකෙන් අදහස් කරන්නේ දේහය තබන්නට පුළුවන් උදේ සිට රාත්‍රිය දක්වා එතකොට හෝටල් එකක් ලෙස ආහාර ලබාදිමට පුළුවන. රඹුක්කන තිබෙන්නේ එක් මල්ශාලාවක් පමණක් බවත්, ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

දැන් බොහෝමයක් නිවෙස් වල මරණයක් වුණාම ඉඩ මදි තත්වය ඇති විමෙන් ප්‍රශ්න මතු වී තිබෙනවා.ඒ වගේම රැකියාවේ තත්වයත් සමඟ අපහසු බැවින් පෞද්ගලික මල්ශාලා වල දේහයන් තැන්පත් කිරිම සිදු කරනවා.ඔය කාරණාව ගැන පවසමින් තමා සුසාන භූමිය අසල ඒ වගේ ස්ථානයක් සකස් කරමු ලෙස පවසන්නේ.ඒ කාරණාව මන්ත්‍රීතුමා පවසන ආකාරයට සභාවට ආදායමක් එන අතර ව්‍යාපාරිකයන්ගේ මං කොල්ල කෑම නතර කර ගැනිමට පුළුවන් බවත් පවසන ලදි.දේහයක් තැන්පත් කිරිම යනුවෙන් අදහස් කරන්නේ භූමදානය කිරිමට ළං වී විනාඩි 5 ක් 10 ක් තබන එක නොව දවසක් තිබ්මය. ලක්ෂිත මල් ශාලාවේ වගේ යනුවෙන් ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වී.ආර්. නන්දික බණ්ඩාරනායක මැතිතුමා**

උපාලි රෝහණ මන්ත්‍රීතුමා ඉදිරිපත් කරන ලද යෝජනාව කාලෝචිතයි.මම එතුමාට ස්තුතිවන්ත වෙනවා.ඒවගේ දෙයක් කල්පනා වීම පිළිබඳව එතුමා සඳහන් කළ ආකාරයට රඹුක්කන නගරයේ තිබෙන්නේ ලක්ෂිත මල් ශාලාව පමණයි.එයට සතියකට දේහයන් 2 ත්3 ත් අතර ප්‍රමාණය තැන්පත් කරනු ලබයි.මම ඒකට විරුද්ධ වෙනවා නොවෙයි.මේ සඳහා එතරම් ඉල්ලුමක් තිබෙන බව පවසන ලදි.එම මාර්ගයත් ඉඩ මදි තත්වයක් ඇත. ව්‍යාපාරිකයන් දෙදෙනෙක් ඉදිරිපත් වී සහය දැක්විමක් කරන බවටත්, මෙතුමා ප්‍රකාශ කළා.මේ යෝජනාව හොඳයි.ඔබතුමාලාගේ කාලයේ කරනන්ට පුළුවන් නම් හොඳ බවත් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වී.ආර්. නන්දික බණ්ඩාරනායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

සභාපතිතුමනි,මන්ත්‍රීතුමන්ලා යෝජනා ඉදිරිපත් කර සභාපතිතුමා අවසාන ප්‍රකාශයෙන් පසු සභිකයන්ට එම යෝජනාව පිලිබඳ අදහස් ඉදිරිපත් කිරිමට නොහැකි.අවසාන ප්‍රකාශ ඔබතුමාගේය ඉන්පසුව අදාළ යෝජනාවට අදහස් දැක්වීමට නොහැකි බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මන්ත්‍රීතුමා මම ඒ පිලිබඳ නොදැන නොවේ.නමුත් ප්‍රජාතාන්ත්‍රික අයිතිය ගැන සලකා මම එහෙම සිදු කළේ.මෙතන ගොඩක් නවක මන්ත්‍රීවරුන් සිටින බවත්,මට නැත්නම් අවසාන ප්‍රකාශය ඉදිරිපත් කර අවසන් කිරිමට පුළුවන්ය.එහෙත් මම එසේ නොකර සිතුවා තව පොඩි අවස්ථාවක් දුන්නොත් හෙඳ බව අපගේ තිබෙන ප්‍රජාතන්ත්‍රවාදි ගුණය අවභාවිතා නොකර එතුමන්ලාගේ දැනුවත් කිරිම් යනාදිය කිරිම අවස්ථාව ලබාදිම සුදුසු බව ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

අදාළ යෝජනාව ක්‍රියාත්මක කිරිමට අනුමත කිරිම තීරණය විය.

**(ඊ)8.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා**

i. ඉඹුල්ගස්දෙණිය කොට්ඨාශය හා ඒ ආසන්න ප්‍රදේශවල පවතින ගෘහ කර්මාන්තය සහ නිර්මාණය කරන ලද ගෘහ කර්මාන්තය සඳහා වෙළඳපලක් නිර්මාණය කිරිම සුදසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.පී.පද්මසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී.ජයවීරමැතිතුමා**

මම මේ යෝජනාව ඉදිරිපත් කිරිමට අදහස් කළේ.නව රජයේ රාජ්‍යපතිපත්තියේ එක් අවස්ථාවක් ලෙස සඳහන් කළ හැකිය ග්‍රාමිය ජනතාවගේ දිළිඳු බව තුරන් කිරිම.ඒ සඳහා අපට කරන්නට පුළුවන් උපරිම ශක්තිය ධෛර්ය රාජ්‍ය ප්‍රතිපත්තිය සඳහා ලබාදිමට සුදානම් බව පවසන ලදි.එම කටයුත්ත සඳහා ප්‍රදේශයේ දේශපාලන අධිකාරිය හා මහජන නියෝජිතයා වශයෙන් යෝජනා කරන්නේ අපගේ නිවෙස්වල සිටින කාන්තාවන් බොහොමයක් පොඩි පොඩි ගෘහාශ්‍රිත දේවල් කිරිමට පුළුවන් අය සිටිනවා.පොල් ආශ්‍රිත ඉරට සම්බන්ධ කර ගැනිමෙන් දේවල් කරන කාන්තාවන් ප්‍රදේශයේ සිටිනවා.මෙම නිර්මාණයන් අලෙවිකර ගැනිම සඳහා කොට්ඨාශය කුළ අලෙවි මධ්‍යස්ථානයක් සකස් කර ගැනිමට අවශ්‍ය බව පවසන ලදි.සභාවේ උපකාරය මේ සඳහා ලබා ගැනිමට හැකි නම් හොඳ බවත්,එසේ නැතිනම් වෙන වැඩපිළවෙළක් සකස් කර දෙන ලෙසත් පවසන ලදි.ගෘහනියන්ට නිකරුණේ කාලය ගත නොකර හැකියාව තිබෙන අයට කර ගැනිමට අවස්ථාවක් සැලසේන බවත්,ඔවුන්ට යම් ආර්ථික හැකියාවක් ලබාගත හැකි බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී.ජයවීරමැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටිකිරි බංඩා තෙන්නකෝන් මැතිතුමා**

ඒ සඳහා භූමියක් සොයා ගනු ලබන්නේ කෙසේ ද යනුවෙන් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටිකිරි බංඩා තෙන්නකෝන් මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී.එන්.ප්‍රියංජිත් රාජපක්ෂ මැතිතුමා**

යෝජනාව හොඳයි.අපගේ සභාවේ පුස්ථකාල භූමිය ඒ සඳහා ඉඩ තිබෙන බවත්,ඒකට අවහිරියක් නොවී සතියකට සැරයක් හෝ මසෙකට සැරයක් පොළ භූමියක් වගේ සකස් කර ගැනිමට හැකියාවක් ඇති බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී.එන්.ප්‍රියංජිත් රාජපක්ෂ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මෙතුමා මා සමඟ මේ පිළිබඳ සාකච්ඡා කළා පුස්ථකාලය ඉදිරිපිට පොඩි ඉඩම් කොටසක් තිබෙනවා. දැනට එම කොටසේ බත් කඩයක් කර ගෙන යනවා.අපි හැමදාම එම ස්ථානයට නොයන බැවින් පාර අයිනේ ගැලපෙන බව පවසන ලදි.ඇතුළට ගියොත් ගැටළුවක් වන නිසා පාර අයිනේ අඩි 15 ක පමණ කොටසේ බත් කඩයට අවහිරයක් නොවන පරිදි සකස් කිරිම සුදුසු බවත් ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -

අදාළ යෝජනාව ක්‍රියාත්මක කිරිමට අනුමත කිරිම තීරණය විය.

ii. ඉඹුල්ගස්දෙණිය පුස්තකාල භූමියේ පවතින ළමා උද්‍යානය අවට දූ දරුවන්ට පරිහරණය සඳහා විවෘත කිරිම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී.ජයවීරමැතිතුමා**

මෙම යෝජනාව මා පළමුව ඉදිරිපත් කළ යෝජනාව හා සමඟ සම්බන්ධතාවක් පවතිනවා.මේවන විට පුස්තකාලය සම්බන්ධයෙන් කාර්මික කමිටුව කැඳවලා සාකච්ඡා කිරිම සිදු කිරිමත්,පුස්තකාලයට මීට පෙර ද යෝජනාවක් ඉදිරිපත් කළා පුස්තකාලය භාවිතා කිරිම සඳහා නැවත නවීකරණය කිරිම.ඒ වගේම අපි හෙට දිනයේ පුස්තකාල පරිශ්‍රයේ ශ්‍රමදානයක් කිරිමට සුදානම් කර ඇත.එම භූමිය ඉතා අලංකාර ලෙස පවත්වාගෙන යාමටත්, එය සිදු කරනු ලබන්නේ කාර්ය මණ්ඩලයේ පරිපාලනයත් සමඟය මෙහෙය වන්නේ ඒ එක්කම ඉදිරිපස තිබෙන ළමා උද්‍යානය දැනට දරුවන් පාවිච්චි කිරිම සිදු කරනු ලබයි.නමුත් ඒක පුස්තකාලය සමඟ ආකර්ෂණීය බවත් ඇති වී නොමැත.එම නිසා ඒ ස්ථානයේ ආකර්ෂණීය තත්වයට පත්කර ගැනිමට අපට පොඩි කාලයක් ගත වෙන බවත් පවසන ලදි.කාර්මික කමිටුව සමඟ සාකච්ඡා කර ඉදිරියේදී තවදුරටත් ප්‍රතිසංස්කරණය කිරිමේ අදහසින් මේ යෝජනාව ඉදිරිපත් කළ බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී.ජයවීරමැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී.එන්.ප්‍රියංජිත් රාජපක්ෂ මැතිතුමා**

මේ යෝජනාව හොඳයි.එම ළමා උද්‍යානයේ පවතින ආම්පණ්න පරණය ඒවා තව ටිකක් අලුත්වැඩියා කර ගැනිම සුදුසු බවත්,ඔන්චිල්ලාවේ ආරක්ෂාව ගැන සොයා බලා අලුත්වැඩියා කර දරුවන්ට පාවිච්චිය කිරිම සඳහා ලබා දිම සුදුසු බවත්,කාලයක් ගොස් තිබෙන නිසා අනතුරක් සිදු විය හැකි බවත් පවසන ලදි.එම නිසා

ඒ ගැන අවධානය යොමු කර අපගේ කාර්මික නිලධාරියෙක් යොදවා පරීක්ෂා කර ලබා ගැනිම සුදුසු බවත් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී.එන්.ප්‍රියංජිත් රාජපක්ෂ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

පසුගිය ඉරිදා දිනයේ මම ඉඹුල්ගස්දෙණිය ප්‍රදේශයේ සිටින විට අපි දෙදෙනා කථා කර ගත්තා මේ පිළිබඳව .ඔබතුමා පවසන ආකාරය මගේ මට්ටමින් මම ඒගැන බලපු බව පවසන ලදි.හෙට දිනයේ ගම්වාසින් සමඟ ශ්‍රමදානයක් සූදානම් කර ඇත.මෙහි ආරම්භයක් විදිහට, සෙනසුරාදා දිනයට පාඨකයන් වැඩිපුර පමාණයක් පැමිණෙන බවත්, එහි අඩුපාඩු සකස් කිරිම සිදු කරනු ලබන බවත්, මෙම යෝජනාව භාර ගන්නා බවත් ගරු සභාපතිතුමන් විසින් ප්‍රකාශ කරන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
අදාළ යෝජනාව ක්‍රියාත්මක කිරිමට අනුමත කිරිම තීරණය විය.

**(ඊ)9.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ඩබ්.එන්.සුරංජනි සෝමදාස මැතිතුමිය**

i. රඹුක්කන නගර සීමාවේ විදුලිය විසන්ධි වන අවස්ථාවලදී ප්‍රාදේශීය සභා කාර්යාලයේ රාජකාරි කටයුතු කිරිමේදී අපහසුතාවයන්ට පත්වන බැවින් විදුලිය නොමැති අවස්ථාවලදී අදාළ රාජකාරි කටයුතු අප්‍රමාදව ඉටු කිරිම සඳහා විදුලි උත්පාදන යන්ත්‍රයක්(ජෙනරේටර් එකක්) මිල දී ගැනීමට සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ඩබ්.එන්.සුරංජනි සෝමදාස මැතිතුමිය විසින් යෝජනා කළ අතර එම යෝජනාව එන්.ඒ.සුසාන්ත විමලරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ඩබ්.එන්.සුරංජනි සෝමදාස මැතිතුමිය**

රඹුක්කන නගර සීමාවේ විදුලිය විසන්ධි කරන අවස්ථාවන් කිහිපයකදීම ප්‍රාදේශීය සභා කාර්යාලයේ ක්‍රියාවලියට අපහසුතාවයක් සිදුවු බව මම දුටු බව පවසන ලදි.කිහිපදෙනෙක් ප්‍රකාශ කළා කාර්යාලයට විදුලි උත්පාදන යන්ත්‍රයක් ලබා ගැනිම හොඳ බවට, එම නිසා මම මේ යෝජනාව ඉදිරිපත් කලේ. ජෙනරේටරයක් මිල දී ගැනිම සුදුසු බවත්,අපගේ මහජනතාවගේ සේවාවන් වලදි ඔවුන් ද අපහසුතාවයට පත් වුණ අවස්ථා ඇත.එම නිසා මේ යොජනාව සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ඩබ්.එන්.සුරංජනි සෝමදාස මැතිතුමිය විසින් විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

පසුගිය දවසක මම ද අපහසුතාවයට පත් වුණා විදුලිය බිඳ වැටීම නිසා, කාර්යාලයේ කටයුතු සියල්ලම සිදුවන්නේ පරිගණක ආශ්‍රයෙන් නමුත් අත්‍යවශ්‍ය බිඳ වැටිම් සිදු විය හැකිය.ඒ වගේ අවස්ථාවලදී විදුලි උත්පාදන යන්ත්‍රයක් නොතිබුණ බැවින් කාර්යාලයේ වැඩ කිරිම අපහසු විය. මෙය දිනපතා භාවිතා කිරිම අවශ්‍ය නැති බවත්.නමුත් අවශ්‍ය වෙලාවට ලබා ගැනිමට මිලදී ගෙන තිබිම ප්‍රාදේශීය සභාව කාර්යාලයට ඉදිරියේදී වැදගත් වන බව ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
අදාළ යෝජනාව ක්‍රියාත්මක කිරිමට අනුමත කිරිම තීරණය විය.

ii. වහව කොස්කන්ද වැව දැනට සොරොව්ව අක්‍රීය වී ඇති බැවින් එම වැව පිළිසකර කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ඩබ්.එන්.සුරංජනි සෝමදාස මැතිතුමිය විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී පී.ජී.එස්.සමන් කුමාර මැතිතුමිය විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ඩබ්.එන්.සුරංජනි සෝමදාස මැතිතුමිය**

කෙටි නියඟයක් ඇති වුණ කාල වලදී පවා තල්දැව ප්‍රදේශයේ කුඹුරු වැඩ කරන ගොවිජනතාව අපහසුතාවය පත් වී තිබෙන බවත්,එම නිසා ගම්වාසින්ගේ යෝජනාවක් විදිහට තමා වැවේ සොරොව්ව පිළිසකර කර ගැනිමට ඉදිරිපත් කිරීම සිදු කරනු ලබන බව පවසන ලදි.එම නිසා මේ යෝජනාව ඉදිරිපත් කළ බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ඩබ්.එන්.සුරංජනි සෝමදාස මැතිතුමිය විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටිකිරි බංඩා තෙන්නකෝන් මැතිතුමා**

මෙය ගොවිජන සේවා නිලධාරි වෙත පැවරිය යුතු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටිකිරි බංඩා තෙන්නකෝන් මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මන්ත්‍රීතුමා මේක ජල ප්‍රශ්නයක් එක නිසා අපි භාර ගනිමු. මේකට අදාළ තොරතුරු ලබා දෙන්න ලෙසත්,එනම් අයිතිය කාටද ,කීදෙනෙක් ප්‍රතිලාභ ලබනවද යන තොරතුරු ලබා දෙන ලෙසට ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
අදාළ යෝජනාව ක්‍රියාත්මක කිරිමට අනුමත කිරිම තීරණය විය.

**(ඊ)10.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.රුක්මන් අනුර කුමාර මැතිතුමා**

මගේ නම අනුර කුමාර යනුවෙන් සඳහන් වී ඇත එය අනුර පියරත්න ලෙස නිවැරදි විය යුතු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.රුක්මන් අනුර පියරන්න මැතිතුමා විසින් පවසන ලදි.

i. ගංගොඩ මාකඩ මාර්ගයේ සමිති ශාලාව අසළ පැති බැම්ම බැඳීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.රුක්මන් අනුර පියරත්න මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.කේ.එම්.අනීස් මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.රුක්මන් අනුර පියරත්න මැතිතුමා**

පද්මසිරි මන්ත්‍රීතුමා දන්නවා ඇති මෙම බැම්ම කඩාගෙන ගොස් පස්ටිකක් දමාලා තිබෙන්නේ.මෙයට ලොකු මුදලක් යන බවත් පවසන ලදි.ශ්‍රමදාන මට්ටමින් කරනවා නම් මම ලොකු ගල් ප්‍රමාණයක් ලබා දීම සිදු කරන බවත්,එකට පස් අවශ්‍යයි.එම නිසා පස් ලබා ගැනිමට කටයුතු කරන ලෙසත් පවසන ලදි..ශ්‍රමදානයක් මගින් පස් දැමීම සිදු කළ හැකි බව පවසන ලදි.ඇස්තමේතු සකස් කර සිදු කරනවා නම් ලක්ෂ 25 ක් වැනි විශාල මුදලක් වියදම් වන බවත් සඳහන් කරන ලදි.එම නිසා මේ ගැන බලා කටයුතු කරන ලෙස ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.රුක්මන් අනුර පියරත්න මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.පී.පද්මසිරි මැතිතුමා**

රුක්මන් මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ යෝජනාව කාලෝචිත යෝජනාවකි.මෙම මාර්ගය සංවර්ධන කිරිම සිදු කලේ1991 දී පමණය.මාකඩවල මාර්ය නමින්ය. නමුත් එම මාර්ගයේ කොන්ක්‍රීට් අතුරා ප්‍රතිසංස්කරණය කළාට පැති බැම්ම සකස් කර නැති බව පවසන ලදි.පසුගිය කාලවකවානුවලදී මෙම මාර්ගයේ කෙළවර සංවර්ධනය වී ඇති නමුත් පැති බැම්ම සඳහා අවදානය යොමු කර නොමැත.මෙම යෝජනාව කාලෝචිතයි.මීට වසර 10 උඩ දී මතක් කළා නම් හොඳ බව මම මතක් කර සිටින බවත්, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.පී.පද්මසිරි මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මන්ත්‍රීතුමා ලබන සතියේ දවසක තැන පරීක්ෂා කර බැලිම සිදු කරමු යැයි පවසන ලදි.ලොකු මුදලක් යන වැඩක් වන නිසාය.අපේ බැකෝ යන්ත්‍රය ද අලුත්වැඩියා කිරිමට ඇති බැවින් මේ සඳහා උදව් කිරිමට බලන බවත් ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
අදාළ යෝජනාව ක්‍රියාත්මක කිරිමට අනුමත කිරිම තීරණය විය.

**ii.** ගංගොඩ මාකඩ මාර්ගය හා කිරියාතැන්න මාර්ග දෙක සම්බන්ධ කර සංවර්ධනය කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.රුක්මන් අනුර පියරත්න මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටිකිරි බංඩා තෙන්නකෝන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.රුක්මන් අනුර පියරත්න මැතිතුමා**

මෙම මාර්ගයෙන් රඹුක්කන බල සීමාව අවසන් වෙයි.මාවනැල්ල ප්‍රාථමික පාසලෙන් ඒහා පැත්තෙන් ඇත.80 m ක ප්‍රමාණයක් ශ්‍රමදාන මට්ටමින් මාර්ගය කපා සකස් කර ඇත.රඹුක්කන බල සීමාවේ තිබෙන නිසා පසුගිය කාලයේ මුදල් වෙන් කර ගල කඩා අඩි 20 ක පළල මාර්ගයක් සකස් කර ඇත.මානැල්ල සභාවට අයිති 80 m ප්‍රමාණයක් තිබෙනවා.එය ශ්‍රමදාන මට්ටමින් කපා ඇත.වැසි දිනවල මෙය සෝදා ගෙන ගොස් ඇති බවත්,බැද්දවෙල මධ්‍යම බොහෙත් ශාලාව ,මාකෙහෙල්වල තැපැල් කාර්යාලය,බැද්දවල ප්‍රාථමික විද්‍යාලය මාවනැල්ල පසු කර යාමට පුළුවන.එම නිසා සංවර්ධන කිරිමට පවතින්නේ 80 m ක ප්‍රමාණයක්ය. එම ප්‍රමාණය ඇත්තේ රඹුක්කන සිමාව තුළය.එම කොටස සංවර්ධනය කිරිමට ඇත්තේ ගල ඉවත් කර පස් පුරවාය. රඹුක්කන ප්‍රාදේශීය සභාවට අයත් 80 m ක ප්‍රමාණයක් පමණයි සංවර්ධනය කිරිමට ඇත්තේ ඒ නිසා ඔබතුමාගේ කාරුණික අවදානය යොමු කර යම්කිසි මුදලක් වෙන් කර දෙන්නනේ නම් හොඳ බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.රුක්මන් අනුර පියරත්න මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ජී.එල්.සරත් කුමාර මැතිතුමා**

පියරත්න මන්ත්‍රිතුමා ඉදිරිපත් කළ යෝජනාව කාලෝචිත යෝජානවකි. ගංගොඩ ඉහළ මාකඩ වල දුෂ්කර ප්‍රදේශයකි.මාර්ගය සංවර්ධන වී තිබුණත්.මාකඩ වල සංවර්ධන කර ඉහළ මාකඩ වල මාර්ගය සම්බන්ධ වුණොත්,මාවනැල්ලට ඉතා කෙටි මාර්ගයක් වන බව ප්‍රකාශ කරන ලදි.සැහෙන කාලයක සිට මෙම මාර්ග දෙක සම්බන්ධ කිරිමට කටයුතු කළ බවත්,මාවනැල්ල ප්‍රාදේශිය සභාවටත් රඹුක්කන ප්‍රාදේශීය සභාවටත්

සීමාවේ තිබෙන බවත් ස්ථානිය පරීක්ෂාවක් කර මෙය සංවර්ධනය කිරිමට ඔබතුමාගේ අවධානය යොමු කර ලෙස ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ජී.එල්.සරත් කුමාර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
අදාළ යෝජනාව ක්‍රියාත්මක කිරිමට අනුමත කිරිම තීරණය විය.

**(ඊ)11.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.රුක්මන් අනුර කුමාර මැතිතුමා**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.රුක්මන් අනුර කුමාර මැතිතුමා ලෙස සටහන් ඇති නමුත් එය ගරු උපසභාපති ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා ලෙස නිවැරදි විය යුතු බවට ගරු සභාපතිතුමා විසින් පවසන ලදි.

i. පානීය ජලය ලබාදීමට ජල බවුසර් සේවාව නැවත ක්‍රියාත්මක කිරිම සඳහා රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඇති,එහි දැනට භාවිත නොකරන බවුසරය සහ ට්‍රැක්ටරය ඉල්ලා සිටිම සුදුසු බවට ගරු උපසභාපති ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු උපසභාපති ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා**

අපේ ප්‍රාදේශීය සභාවට අයිතිව කලින් ජල බවුසර් දෙකක් තිබිලා තිබෙනවා.එම බවුසර් දෙකක් මේ වෙලාවේ හැටියට පානිය ජලය ලබා දීමට නොහැකි තත්වයක ඇත.අපි ඒ ගැන විමසිමක් කළ විට එම බවුසර් දෙකක පාවිච්චි කිරිමට නොහැකි තත්වයේ තිබෙන්නේ දැන ගැනිමට හැකිවිය.මහජනතාව ඉල්ලුම් කර තිබෙනවා. පානිය ජලය ලබා දෙන්න ලෙසට අපේ බවුසර් දෙකක් පාවිච්චි කිරිමට නොහැකි නිසා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තිබෙනවා පාවිච්චි නොකරන ලද බවුසර්යක් සහ ට්‍රැක්ටර් රථයක් එම බවුසර් එක සහ ට්‍රැක්ටර් රථයක් ලබා ගැනිම සුදුසු බවත් පවසන ලදි.දැන් යෝජනා වෙලා තිබෙනවා පළාත් පාලන ආයතන යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල තිබෙන බවුසර් සහ ට්‍රැක්ටර් ආසන්නයේ තිබෙන පළාත් පාලන ආයතනයට ලබා දෙන ලෙසට, ඒ අතරතුර තමා අපේ පැත්තේනුත් සභාවට ඉදිරිපත් කර සම්මත කර ඉල්ලීමක් කරන එක හොඳ බවත් පවසන ලදි.එම නිසා මේ යෝජනාව ඉදිරිපත් කළ බවත්,මේ සේවාව ඉදිරියට කර ගෙන යාම හැකි බවත් ගරු උපසභාපති ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.රුක්මන් අනුර පියරත්න මැතිතුමා**

ගරු උපසභාපතිතුමා ගෙන එන ලද යෝජනාව කාලෝචිත යෝජනාවකි.මම මේ සඳහා අදහසක් හා සංශෝධනයක් ඉදිරිපත් කිරිමක් කරන්නම්.අපිට ජල බවුසර් සේවාව හොඳය. මහජනතාවට කරදරයක් වුණ අවස්ථාවක සභාවට ඇවිත් ජල බවුසර් එකක් ගැන කථා කරන්නේ.එන ජනතාව අපහසුතාවයට පත් වෙනවා.ගරු සභාපතිතුමනි,අපි බවුසරයට මුදල් මෙතනින් ගන්නවා අරගෙන අදාළ පුද්ගලයා යන්නට ඕනෑ අදාළ වතුර ලීටර් ප්‍රමාණය ලබා ගැනිමට කෑගල්ල ජල සම්පාදන මණ්ඩලයට ගොස් බිල්පත ගෙනවිත් දුන්නට පසුව තමා මෙහෙන් මුදල් බැදීමක් සිදු වන්නේ. ගරු උපසභාපතිතුමාගේ යෝජනාවට අදහසක් ලෙස ඉදිරිපත් කරන්නම් මොක ද ජනතාවටත් ප්‍රයෝජනවත් වෙනවා.අපට සභාවේ මුදල් වලින් සතියකට වතුර ලීටර් 40,000 ක් වත් සභාවෙන් ලබා ගෙන ජලය සම්බන්ධ විෂයට ඇතුළත් කර ලීටර් 4000 ක් සන්තකයේ තබා ගෙන ජල බවුසර් අවශ්‍ය වන පුද්ගලයාට කෑගල්ලට යන්නේ නැතිව එකට යන මුදල බවුසර් කුලිය මං

හිතන්නේ රු350.00 ක් 400.00 ජල සම්පාදනයට ගෙවන්නට වේ.ඒ මුදල අපේ සභාවට ගෙවලා ලබා ගැනිමට පුළුවන් බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.රුක්මන් අනුර පියරත්න මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
අපි ජල බවුසර් ඉල්ලීම ක්‍රියාත්මක කරමු.කාර්මික කම්ටුවට භාර දී ඒකට වාර්තාවක් ලබා දෙන ලෙසට ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.
තීරණය -
අදාළ යෝජනාව ක්‍රියාත්මක කිරිමට අනුමත කිරිම තීරණය විය.

ii. කණුගොල්ල වසමේ ඇති "පරපේ සායනය" ප්‍රාථමික සෞඛ්‍ය සේවා මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය කිරිම සුදුසු බවට ගරු උපසභාපති ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ඒ.සුසාන්ත විමලරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු උපසභාපති ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා**
දැනට භාවිතයේ තිබෙන "පරපේ සායනය" නමින් සායනක් විදහට පත්වාගෙන යන්නේ නරබැද්දා හේන කියන මෙම ප්‍රාදේශීය සභාවට අයත් සුසාන භූමියකට වෙන් වූ කොටසක තමා මෙම සායනය පවත්වාගෙන යනු ලබන්නේ.එම සායනයේ වහලය ගැලවී ඇත.ඒ අය මතක් කරන්නේ වහලට සකස් කිරිමටය.නමුත් වහලය සකස් කර සායනය පවත්වාගෙන යනවාට වඩා හොඳයි.නව රජය යෝජනාවක් ගෙන තිබෙනවා ප්‍රාථමික සායන 2000 ක් ස්ථාපිත කිරිමට.ඒ අනුව අපට පුළුවන් මේ ගොඩනැගිල්ල සංවර්ධනය කිරිමට, මධ්‍ය ආණ්ඩුවේ ක්‍රියාවලිවට මෙයට සම්බන්ධ කර ගැනිම සුදුසු බවත්,මහජනතාවගේ විශේෂ අවශ්‍යතා ඉටු කර ගැනිමට පුළුවන් වන බවත්,ප්‍රාථමික මධ්‍යස්ථානයක් ලෙස වැඩි දියුණු කිරිම සුදුසු බව ගරු උපසභාපති ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
මෙය අපේ දේපලක් බැවින් යෝජනාව භාර ගන්නා බවත්,අයවැයෙන් ප්‍රමුඛතාවයක් ලැබිලා ඇති බවත්,මෙම යෝජනා සියල්ලම කෙරෙහි අවධානය යොමු කරන බවත්, ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.
තීරණය -
අදාළ යෝජනාව ක්‍රියාත්මක කිරිමට අනුමත කිරිම තීරණය විය.

**(ඊ)12.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.පී.දසනායක මැතිතුමා**

i. රඹුක්කන ප්‍රාදේශීය සභාවට අයත් මාරාගහ මුල වත්ත මාර්ගය සෝදා පාළුවට ලක් වීම නිසා ඉතාමත් අබලන් තත්වයකට පත් වී ඇති බැවින් එම මාර්ගය සංවර්ධනය කිරිම සුදුසු බවට ගරු

ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.පී.දසනායක මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු උපසභාපතිතුමා විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.පී.දසනායක මැතිතුමා**

මෙම මාර්ගය කිරිවත්දෙණිය මාර්ගයේ ඉහළ ගොස් මයික්‍රෝෆ්ලෝරා ආයතනය අසල මාර්ග කොටසයි. කිසිම දවසක සංවර්ධන වී නොමැති මාර්ගයකි.සෝදා පාළුවට ලක් වී අබලන් තත්වයේ ඇත.එම නිසා මෙම මාර්ගය සංවර්ධය කිරිම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.පී.දසනායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

එම යෝජනාව පිළිබඳ සලකා බලන බවට ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

අදාළ යෝජනාව ක්‍රියාත්මක කිරිමට අනුමත කිරිම තීරණය විය.

ii. පින්නවල ජාතික පාසල අසලින් දිවෙන හඳගම මාර්ගයේ ඉහළ කොටස සංවර්ධනය කිරිම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.පී.දසනායක මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සී.සරත් කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.පී.දසනායක මැතිතුමා**

පින්නවල ජාතික පාසල අසලින් දිවෙන හඳගම මාර්ගයේ ඉහළ කොටස කැඩී ඇති බවත්,මීටර් 100 ක පමණ ප්‍රමාණයක් සංවර්ධන වී ඇත ඉතිරිය සංවර්ධනව වී නොමැති බවත් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.පී.දසනායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

එම යෝජනාව පිළිබඳ සලකා බලන බවට ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

අදාළ යෝජනාව ක්‍රියාත්මක කිරිමට අනුමත කිරිම තීරණය විය.

iii. රඹුක්කන පොදු වෙළඳපළ I සහ II අදියර ගොඩනැඟිලි වල දුර්වල වී ඇති ස්ථාන පිළිසකර කිරිම සහ සනීපාරක්ෂණ පහසුකම් ලබාදීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.පී.දසනායක මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ඩබ්.එන්.සුරංජනී සෝමදාස මැතිතුමිය විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.පී.දසනායක මැතිතුමා**

මෙම යෝජනාවේ දුර්වල වී ඇති ස්ථාන අබලන් වී ඇති ස්ථාන ලෙසත්, සනීපාරක්ෂණ පහසුකම්, සනීපාරක්ෂක පහසුකම් ලෙසත් නිවැරදි විය යුතු බවට පවසන ලදි.මේ සම්බන්ධයෙන් පැහැදිලි කිරිමක් කරනවා නම් පොදු වෙළඳපළෙහි පළමු අදියරය ලෙස පරණ වෙළඳ සංකීර්ණයත්,දෙවන අදියරය ලෙස ඉදිරිපස ඇති වෙළඳපළ සංකීර්ණයත් හැදින්වේ.පරණ වෙළඳපළ සංකීර්ණයේ විශාල ප්‍රමාණයක් අබලන් තත්වයේ ඇත.ප්‍රතිසංස්කරණ කටයුතු කලින් සභාව විසින් සිදුකර ගෙන ගියත් ඒ එක්කම මහ නතර වීමක් සිදු විය.එහි බිත්ති කැඩී ගොස් ඇත.එය සංවර්ධන කර තීන්ත අලේප කිරිම සුදුසු කළ යුතු බව පවසන ලදි. දෙවන අදියරයෙහි වහලයේ උළු ගලවා අමානෝ සීට් සවි කළත් සවි කළ දා සිට තෙමෙන බවත්,පසුගිය සභාවන් වලින් ඉල්ලීම් කළත් එය ඉෂ්ට වුයේ නැති බව පවසන ලදි.ඒ වගේ වෙළඳපළ සංකීර්ණයේ වැඩි ප්‍රමාණයක් වැඩ කරන්නේ කාන්තාවන්ය.එම නිසා කඩසාප්පු වලට අවශ්‍ය සනීපාරක්ෂක පහසුකම් එම ගොඩනැගිල්ලට අදාළව ලබා දිමට ඉල්ලීම් සිදු කළත් එය ප්‍රතික්ෂේප විය.ඒ අනුව නැවත මෙම යෝජනාව ඉදිරිපත් කළ බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.පී.දසනායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මෙම යෝජනාව හොඳයි. පොදු වෙළඳපළ සංකීර්ණයේ පහසුකම් සීමිත ප්‍රමාණයක් ඇති බවත්,ක්ලීන් ශ්‍රී ලංකා වැඩ සටහනට අනුව බස් නැවතුම් පොළ සංවර්ධනය වෙනවා.තවම මේ සඳහා ප්‍රතිපාදන වෙන් වී නොමැති බවත්,අවශ්‍යතාවය අනුව ප්‍රතාපාදන ලබා ගැනිම සඳහා සාකච්ඡා කළ බවත්,මෙය නාගරික සංවර්ධන අධිකාරිය මඟින් සිදු කිරිම යෝජනා වි ඇති බැවින් මෙම යේජනාව ගැන ද සලකා බලන බවට ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

අදාළ යෝජනාව ක්‍රියාත්මක කිරිමට අනුමත කිරිම තීරණය විය.

**(ඊ)13.ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

සභා අරමුදලින් පහත සඳහන් (i) සිට (xiv) දක්වා යෝජනා වල සඳහන් ගෙවීම් සිදු කිරිම සුදුසු බවට සංශෝධන සහිතව ගරු සභාපතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ඉදිරිපත් කළ සංශෝධනයන්ට යටත්ව ගරු උපසභාපතිතුමා විසින් ස්ථිර කරන ලදි.

i. බතඹුරය ගොවි සංවිධානය - රු24,250.00
   (ආයුර්වේද රෝහල අසල සිට නාගවනාරාමය පන්සල දක්වා මාර්ගය කොන්ක්‍රීට් කිරිම සඳහා වන රඳවුම් මුදල ගෙවීම)

ii. පින්නවල ග්‍රාමීය වැඩිහිටි කමිටු සංවිධානය - රු24,250.00
   (පින්නවල ,පනම්පිටිගොඩවත්ත මාර්ගයේ මහේෂ් මහතාගේ නිවස අසල සිට කන්ද කොටස කොන්ක්‍රීට් කිරිම සඳහා වන රඳවුම් මුදල ගෙවිම.)

iii. H.M.I.J.කුරුකුලසූරිය - රු93,060.00
(කොම්පෝස්ට් ව්‍යාපෘතියේ ගොඩගැසී ඇති කසල වෙනත් ස්ථානයකට බැහැර කර තුනී කිරීම සඳහා පස්දමා වසා දැමීම ගිය රු74,910.00 ක මුදල H.M.I.J.කුරුකුලසූරිය යන අයට ගෙවීම.මෙම යෝජනාවේ පස්දමා වසා දැමීම ස්කැවේටර් යන්ත්‍රය සඳහා ගිය රු74,910.00 ක මුදල ප්‍රමාණවත් නොවන බැවින් රු93,060.00 ක් ලෙස නිවැරදි විය යුතු බවට යෝජනා කරන ලදී.)

iv. H.M.I.J.කුරුකුලසූරිය - රු765,600.00
(කොම්පෝස්ට් ව්‍යාපෘතියේ ගොඩගැසී ඇති කසල වෙනත් ස්ථානයකට බැහැර කිරීමට ටිපර් රථයට අදාළ රු713,400.00 ක මුදල H.M.I.J.කුරුකුලසූරිය යන අයට ගෙවීම. මෙම යෝජනාවේ ටිපර් රථයට වෙන මුදල ප්‍රමාණවත් නෙවන බැවින් එම මුදල රු765,600.00 ක් ලෙස නිවැරදි විය යුතු බවට යෝජනා කරන ලදී.)

v. සී/ස රඹුක්කන විවිධ සේවා සමුපකාර සමිතිය - රු151,690.41
(ගංගොඩ සමගි මාවත සංවර්ධනය කිරීමේ කර්මාන්තය වෙනුවෙන් ලද රු151,690.41ක රැඳවුම් මුදල ගෙවීම.)

vi. වලල්ගොඩ ග්‍රාම සංවර්ධන සමිතිය - රු47,486.97
(වලල්ගොඩ ශ්‍රී වර්ධනාරාම විහාර මාර්ගය සංවර්ධනය කිරීමේ කර්මාන්තයට අදාළව අතරැදි මුදල ගෙවීම.)

vii. kegalle Distributors (pvt)Ltd - රු105,420.00
(ආදාහනාගාරය වෙත 37.5 kg ලිට්රෝ ගෑස් සිලින්ඩර් 06 ක් වෙළඳපල මිල ගණන් යටතේ මිල දී ගැනීමට හා ගෙවීම් කිරීම සඳහා)

A.K.W.පුෂ්ප කුමාර,ලීලා ස්ටෝර්ස් - රු105,420.00
(ආදාහනාගාරය වෙත 37.5 kg ලාෆ් ගෑස් සිලින්ඩර් 06 ක්, වෙළඳපල මිල ගණන් යටතේ මිල දී ගැනීමට හා ගෙවීම් කිරීම සඳහා)

viii. ආපදා ණය ගෙවීම
- S.P.K.විජේරත්න මිය -රු250,000.00
- D.M.T.N.දසනායක මිය -රු250,000.00

(40% ණය සීමාව ඉක්මවා නැත./සේවක ණය ගිණුමේ ප්‍රමාණවත් මුදලක් පවතී.)

ix. එම්.එල්.ටයර් වර්ක්ස් -( P.G.L.C.කුමාර) - රු2000.00
(ZA -0191 අංක දරණ බැකෝ යන්ත්‍රය ක්‍රියාකිරීමේදී ඇති වූ හුලං බැසීම නිසා ඉදිරිපස දකුණු රෝදයේ ටියුබයේ පැච් එකක් සහ ටයරයේ පැච් එකක් දැමීම වෙනුවෙන් මුදල ගෙවීම.)

x. එම්.එල්.ටයර් වර්ක්ස් -( P.G.L.C.කුමාර) - රු600.00
(RW -9992 අංක දරණ ටේලර් රථයේ වම්පස රෝදයේ හුලං බැසීම නිසා පැච් දැමීම වෙනුවෙන් මුදල ගෙවීම.)

xi. එම්.එල්.ටයර් වර්ක්ස් -( P.G.L.C.කුමාර) - රු1250.00
(ZA -0191 අංක දරණ බැකෝ යන්ත්‍රය ක්‍රියාකිරිමේදී හුලං බැසීමක් හේතුවෙන් ඉදිරිපස වම් රෝදයේ පැච් දැමීම වෙනුවෙන් මුදල ගෙවීම.)

xii. එම්.එල්.ටයර් වර්ක්ස් -( P.G.L.C.කුමාර) - රු1250.00
(ZA -0191 අංක දරණ බැකෝ යන්ත්‍රය ක්‍රියාකිරිමේදී ඉදිරිපස දකුණු රෝදයේ හුලං බැසීම නිසා එම රෝදය සඳහා පැච් දැමීම වෙනුවෙන් මුදල ගෙවීම.)

xiii. වන් වේ ටයර් සෙන්ටර් ඇන්ඩ් වීල් එලයිමන්ඩ්( මාවනැල්ල පාර,රඹුක්කන) - රු450.00
(RW -9023 අංක දරණ ටේලර් රථයේ දකුණු පස රෝදයේ හුලං බැසිමක් නිසා එම රෝදය සඳහා පැච් දැමීම වෙනුවෙන් මුදල ගෙවීම.)

xiv. එම්.එල්.ටයර් වර්ක්ස් -( P.G.L.C.කුමාර) - රු1250.00
( ZA -0191 අංක දරණ බැකෝ යන්ත්‍රය ක්‍රියාකිරිමේදී ඉදිරිපස දකුණු රෝදයේ හුලං බැසීමක් සිදු විම නිසා එම රෝදය සඳහා පැච් එකක් දැමීම වෙනුවෙන් මුදල ගෙවීම.

අදාළ ගෙවීම් සහිත යෝජනා ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
ඉහත ගෙවීම් අනුමත කිරිම තීරණය විය.

**(ඊ).II.යථාපරිදි කල් දී නොමැති යෝජනා**

**(ඊ).II.01**

කිරිවල්ලාපිටිය විජයමන්නාහේන ආදාහනාගාර පෝරණුවේ අත්‍යවශ්‍ය අලුත්වැඩියා හා සේවා කටයුතු සිදු කිරිම සඳහා අප සභාවේ ලියාපදිංචි ආයතනයක් වන No 865,Dr danister Da Silva Mawatha,Baseline Road,Colambo 09 ,ලිපිනයේ ස්ථාපිත R R Construction (pvt)Ltd.වෙතින් එවන ලදි රු134,347.50 ක් වටිනා දළ වැය ඇස්තමේන්තුව අනුමත කිරිම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු උපසභාපතිතුමා විසින් ස්ථිර කරන ලදි.

අදාළ යෝජනා ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
රු134,347.50 ක් වටිනා දළ වැය ඇස්තමේන්තුව අනුමත කිරිම තීරණය විය

**(ඊ).II.02**

මාවනැල්ල දිසා අධිකරණයේ පැවති නඩු අංක 1119 දරණ නඩුවේ සමත කොන්දේසි අනුව නඩුවට අදාළ මාර්ගයේ ප්‍රවේශ කොටස්,කාණු සහ සිමෙන්ති බැම්මේ ඉදිකිරීම් කටයුතු වතුර ගලා බසිනා බට යෙදීම ආදිය ප්‍රා/සභා අරමුදල් යොදවා සිදුකර දීමට එකඟ වී ඇත.ඒ අනුව බෝක්කු බට යොදා මාර්ගය සැකසීමට පිළියෙල කරන ලදි.රු120,000.00 ක වටිනාකමකින් යුතු ඇස්තමේන්තුව 2025.05.27 දින පැවති ප්‍රතිපත්ති හා තීරණ ගැනිමට සහයවීමේ කමිටුව වෙත ඉදිරිපත් කරන ලදි.එහිදී නඩුවට හේතු වූ කාරණය,සමත කොන්දේසි සඳහා තීරණ ගත් නිලධාරින් හා සභිකයන් පිළිබඳ සවිස්තර තොරතුරු සමඟ එම ඇස්තමේන්තුව නැවත ඉදිරිපත් කරන ලෙස දන්වන ලදි.ඒ අනුව එම ඇස්තමේන්තුව නඩුවට අදාළ තොරතුරු සමඟ අනුමත කිරිම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු උපසභාපතිතුමා විසින් ස්ථිර කරන ලදි.

අදාළ යෝජනා ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

රු120,000.00 ක වටිනාකමකින් යුතු ඇස්තමේන්තුව අනුමත කිරිම තීරණය විය.

**(ඊ).II.03**

කසල කළමණාකරණ මධ්‍යස්ථානයේ කටයුතු කාර්යක්ෂමව පවත්වා ගැනිම අනිවාර්ය වුවකි.නමුත් අනුමත කාර්ය මණ්ඩලයේ සෞඛ්‍ය කම්කරු සංඛ්‍යාව එකී කාර්යයට ප්‍රමාණවත් නොවුයෙන් ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතිය මත මාස තුනෙන් තුනට සේවය බණ්ඩනය වන ආකාරයට සේවකයන් තිදෙනෙකු යොදවා ගැනිම 2025.04.28 දින සිට සිදුකර ඇත.මෙම සේවකයින් තිදෙනා අතුරින් එක් අයෙකු දැනට මියගොස් ඇති අතර ඉතිරි සේවකයින් දෙදෙනා අදාළ කාර්යයේ නිරත කරවීම මේ වන විට සිදුකර ඇත.ඔවුන් දෙදෙනා සේවයේ යොදවාගත් මුල් ගිවිසුම් සේවා කාලය 2025.07.28 දිනෙන් අවසන්ව ඇති බැවින් ඔවුන්ගේ සේවා කාලය නැවත මාස තුනකින් දීර්ඝ කර ගැනිම සිදුකළ යුතුවේ.න්‍යාය පත්‍රයට ඇතුළත් නොකළ මෙම යෝජනාව ක්‍රියාත්මක කිරිමක් සිදු නොකළහොත් කසල කළමණාකරණයේ කාර්යක්ෂමතාවය අඩුවීම ජනතා සුබසිද්ධියට සෘජුව බලපාන්නක් බැවින් ඒ කෙරෙහි අවධානය යොමුකර හසිදි යෝජනාවක් ලෙස ඉදිරිපත් කිරිමත්, කසල කළමණාකරණයේ යොදවා ඇති පහත නම් සඳහන් සේවකයින් දෙදෙනාගේ ගිවිසුම් කාලය 2025.07.28 දින සිට 2025.10.28 දින දක්වා මාස 03 ක කාලයකින් දීර්ඝ කර ගැනීමටත්, එම කාලය සඳහා ඔවුන් වෙත දෛනිකව රු1500.00 ක දීමනාවක් ගෙවීමට සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු උපසභාපතිතුමා විසින් ස්ථිර කරන ලදි.

- ඒ.ඩී.ගුණරත්න මයා
- ආර්.ඩී.එස්.ප්‍රදීප් කුමාර මයා

අදාළ යෝජනා ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

දෛනිකව රු1500.00 ක දීමනාවක් ගෙවීම අනුමත නිරිමට තීරණය විය.

**(ඊ).II.04**

ජාතික කියවීමේ මාසය 2025 සඳහා සකස් කරන ලද වැඩ සටහනේ යෝජිත ව්‍යාපෘතිය අනුමත කිරිම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු උපසභාපතිතුමා විසින් ස්ථිර කරන ලදි.

අදාළ යෝජනා ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
ජාතික කියවීමේ මාසය 2025 වැඩ සටහනේ යෝජිත ව්‍යාපෘතිය අනුමත කිරිම තීරණය විය.

**(ඊ).II.05**

සභාව සතු PC 073428 අංක දරණ Toshiba වර්ගයේ ෆෝටෝ කොපි යන්ත්‍රය වසරක කාලයක් සඳහා එනම් 2025.09.27 සිට 2026.09.26 දක්වා අලුත්වැඩියා හා සේවා නඩත්තු කටයුතු සිදු කර ගැනිම වෙනුවෙන් ගිවිසුම් ගත වීමට අදාළ එම යන්ත්‍රයේ මෙරට අලෙවි නියෝජිත,සේවාකරු හා ආනයනකරුවන් වන නො: 90,යුනියන් පෙදෙස ,කොළඹ 02,ලිපිනයේ ස්ථාපිත John Keells Office Automation (pvt)Ltd.ආයතනය වෙත රු20,091.86 ක මුදල ගෙවීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු උපසභාපතිතුමා විසින් ස්ථිර කරන ලදි.

අදාළ යෝජනා ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
රු20,091.86 ක මුදල John Keells Office Automation (pvt)Ltd.ආයතනය වෙත ගෙවීම අනුමත කිරිම තීරණය විය.

**(ඊ).II.06**

ආදාපාන හීනාබෝව,අඹනැල්ල මාර්ගය පිළිබඳ පවත්නා ගැටළුව පිළිබඳ ඉදිරි කටයුතු සිදු කිරිමට අවශ්‍ය මුලික පිඹුරු අංක I /24 /4 දරණ පිඹුර හා එහි කැබලි අංක 106 ට අදාළ Tenament ලැයිස්තුව ,මිනින්දොරු දෙපාර්තමේන්තුවෙන් ලබා ගැනිමට විෂය නිලධාරි W.A.තිළිණ මධුසංඛ මයා පුද්ගලිකව වියදම් කළරු1416.00 ක මුදල ගෙවීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු උපසභාපතිතුමා විසින් ස්ථිර කරන ලදි.

අදාළ යෝජනා ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
විෂය නිලධාරි W.A.තිළිණ මධුසංඛ මයාට රු1416.00 ක මුදල ගෙවීම අනුමත කිරිම තීරණය විය.

**(ඊ).II.07**

විදුලි සෝපානය වසරක කාලයක් සඳහා එනම් 2025.07.19 සිට 2026.07.18 දක්වා අලුත්වැඩියා හා සේවා නඩත්තු කටයුතු සිදු කර ගැනීම වෙනුවෙන් ගිවිසුම් ගත වීමට අදාළව නො:464,03,04,05,මහල් පාර,කොළඹ -03 ලිපිනයේ ස්ථාපිත A.G.Melco Elevator Company Lanka(Private)Limited.ආයතනයට රු3,94,444.72 ක මුදල ගෙවීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු උපසභාපතිතුමා විසින් ස්ථිර කරන ලදි.

අදාළ යෝජනා ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

රු3,94,444.72 ක මුදල A.G.Melco Elevator Company Lanka(Private)Limited. ආයතනය වෙත ගෙවීම අනුමත කිරිම තීරණය විය.

**(ඊ).II.08**

PC 073428 අංක දරණ ෆෝටෝ කොපි යන්ත්‍රය අලුත්වැඩියා හා නඩත්තු සේවා කටයුතු සිදු කිරිම වෙනුවෙන් එම යන්ත්‍රයේ මෙරට අලෙවි නියෝජිත,සේවාකරු හා ආනයනකරුවන් වන නො:90,යුනියන් පෙදෙස,කොළඹ 02,ලිපිනයේ ස්ථාපිත John Keells Office Automation (pvt)Ltd. ආයතනයට රු52,042.16 ක මුදල ගෙවීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු උපසභාපතිතුමා විසින් ස්ථිර කරන ලදි.

අදාළ යෝජනා ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

රු52,042.16 ක මුදල John Keells Office Automation (pvt)Ltd. ආයතනය වෙත ගෙවීම අනුමත කිරිම තීරණය විය.

**(ඊ).II.09**

2024 වර්ෂයේ සභා අරමුදල් යටතේ ඉටුකළ රඹුක්කන සතිපොළ ගොඩනැගිල්ලේ වැසි ජල බස්නා පිලි අලුත්වැඩියා කිරිම ව්‍යාපෘතියට අදාළ 10% රැඳවුම් මුදල වන රු45,489.60 ක මුදල පුබුදු වැඩිහිටි සමිතිය වෙත ගෙවීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු උපසභාපතිතුමා විසින් ස්ථිර කරන ලදි.

අදාළ යෝජනා ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

10% රැඳවුම් මුදල වන රු45,489.60 ක මුදල පුබුදු වැඩිහිටි සමිතිය වෙත ගෙවීම අනුමත කිරිම තීරණය විය.

**(ඊ).II.10**

2025 ජුලි මස 01 දින සිට 28 දින දක්වා අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතියට අදාළ කම්කරුවන් සඳහා රු102,480.00 ක දින වැටුප් ගෙවීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු උපසභාපතිතුමා විසින් ස්ථිර කරන ලදි.

අඩුකිරීම් එකතුව -රු91500.00
රා.සේ.අ.අරමුදල 12% -රු10980.00

අදාළ යෝජනා ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -
අදාළ කම්කරුවන් සඳහා රු102,480.00 ක දින වැටුප් ගෙවීම අනුමත කිරිම තීරණය විය.

**(ඊ).II.11**

කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යෙද වූ විශ්‍රාමික කාර්මික නිලධාරි K.A.S.D.කළුආරච්චි මයාගේ 2025 ජුනි මස දීමනාව වන රු63,325.00 ක මුදල ගෙවීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් යෝජනාව කළ අතර එම යෝජනා ගරු උපසභාපතිතුමා විසින් ස්ථිර කරන ලදි.

අදාළ යෝජනා ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -
2025 ජුනි මස දීමනාව වන රු63,325.00 ක මුදල ගෙවීම අනුමත කිරිම තීරණය විය.

**(ඊ).II.12**

2025 ජුලි මස සභික දීමනාව වන රු495,000.00 ක මුදල ගෙවීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු උපසභාපතිතුමා විසින් ස්ථිර කරන ලදි.

මුදල් භාරකරු -රු491,000.00
අඩු කිරීම් එකතුව -රු4000.00

අදාළ යෝජනා ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -
2025 ජුලි මස සභික දීමනාව වන රු495,000.00 ක මුදල ගෙවීම අනුමත කිරිම තීරණය විය.

**(ඊ).II.13**

වැරැල්ලපත ජල කණුවෙහි ගෙවිය යුතු මුළු මුදල වන රු5978.66 ක මුදල ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයට ගෙවීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු උපසභාපතිතුමා විසින් ස්ථිර කරන ලදි.

අදාළ යෝජනා ඒකමතිකව සහා සම්මත විය.
තීරණය -
අදාළ රු5978.66 ක මුදල ගෙවීම අනුමත කිරිම තීරණය විය.

**(ඊ).II.14**

රඹුක්කන අශෝක ක්‍රීඩාංගනයට අයත් ජල බිල්පතේහි 2025.03.26 දින සිට 2025.04.26 දින දක්වා බිල්පත නොලැබීම නිසා එම බිල්පතේහි මුදල වන රු52,852.20 ක් ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයට ගෙවීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් යෝජනාව කළ අතර එම යෝජනා ගරු උපසභාපතිතුමා විසින් ස්ථිර කරන ලදි.

අදාළ යෝජනා ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

අදාළ රු52,852.20 ක මුදල ගෙවීම අනුමත කිරිම තීරණය විය.

**(ඊ).II.15**

බැකෝ යන්ත්‍රයේ මිල ගණන් වෙනස් කිරිම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු උපසභාපතිතුමා විසින් ස්ථිර කරන ලදි.

- අනිවාර්ය පැය 2 ක් සඳහා -රු10,000.00
- ඉන්පසු වැඩිවන සෑම පැයකටම -රු4500.00
- කාලය උපරිම පැය 50 දක්වා

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

ඊට වඩා වැඩි වු කාලය සඳහා සලකා බැලිමක් සිදු කරන බවට ගරු සභාපතිතුමා පවසන ලදි.

අදාළ යෝජනා ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

මිල ගණන් වෙනස් කිරිම අනුමත කිරිම තීරණය විය.

**(ඊ).II.16**

**01.**පලොල්ගහ මුල හන්දිය සිට හල්පිටිය දක්වා යන අතුරු මාර්ගය සංවර්ධනය කිරිම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනා ගරු උපසභාපතිතුමා විසින් ස්ථිර කරන ලදි.
(රු500,000.00)(මහජන ඉල්ලීම් පදනම් කරගත් සංවර්ධන යෝජනා -සභා අරමුදල්)
02.බොලගම කනත්ත පාර කැඩී ඇති බොක්කුව අලුත්වැඩියා කිරිමට යෝජනා කරමි.(රු425,000.00)
(මහජන ඉල්ලීම් පදනම් කරගත් සංවර්ධන යෝජනා -සභා අරමුදල්)

අදාළ යෝජනා ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

අදාළ සංවර්ධනය යෝජනා කිරිමට අනුමත කිරිම තීරණය විය.

## (ඊ).II.17

ඉඹුල්ගස්දෙණිය පුස්තකාලයේ අනතුරුදායක මහෝගනී ගස් ඉවත් කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කළ අතර ඉදිරිපත් කළ සංශෝධන අනුව එම යෝජනාව ගරු උපසභාපතිතුමා විසින් ස්ථිර කරන ලදි.
අනතුරුදායක මහෝගනී ගස් ලෙස සටහන් වී ඇති නමුත් එය අනතුරුදායක මහෝගනී ගස් තුනක් ලෙස සංශෝධනය විය යුතු බවත්,එම ගස් දිරා පත් වී ඇති බව ද ගරු සභාපතිතුමා විසින් පවසන ලදි.

අදාළ යෝජනා ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
අනතුරුදායක මහෝගනී ගස් තුන ඉවත් කිරීම අනුමත කිරීම තීරණය විය.

## (ඊ).II.18

පළාත් පාලන ප්‍රදේශවල සංචාරක යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ වැඩසටහන හා ක්ලීන් ශ්‍රී ලංකා වැඩසටහන යටතේ නාගරික ප්‍රදේශවල පොදු මහජනතාව හා සංචාරකයින් සඳහා සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම වැඩ සටහන යටතේ රඹුක්කන නගරයේ පොදු වැසිකිළිය ඉදිකිරීම සඳහා රු19,700.00 ක මුදල අනුමත කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු උපසභාපතිතුමා විසින් ස්ථිර ස්ථිර කරන ලදි.(මේ සඳහා මුදල් ප්‍රතිපාදන පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය මඟින් ලබා දේ.)

අදාළ යෝජනා ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
පොදු වැසිකිළිය ඉදිකිරීම සඳහා රු19,700.00 ක මුදල අනුමත කිරීම තීරණය විය.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

නිල මුදා සකස් කිරීමට සියල්ල සුදානම් බවත්,කිහිපයක් ලබාදුන් බවත්,පවසන ලදි.විස්තර ලබාදීම ආකෘති පත්‍රයක් ලබා දී ඇත.එහි අවශ්‍ය තොරතුරු දමා සහතික කර දෙන ලෙසත්,නවක මන්ත්‍රීතුමන්ලාත් විස්තර සඳහන් කරන ලෙස පවසන ලදි.නවක මන්ත්‍රීතුමන්ලා හා මන්ත්‍රීතුමන්ලා තමන් පිළිබඳ පොඩි හඳුන්වා දීමක් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එල්.වානු සිසිර කුමාර මැතිතුමා**

මම කුඩාගම කොට්ඨාශය නියෝජනය කරන බවත්,සමගි ජනබලවේගයෙන් මන්ත්‍රීවරයකු ලෙස ප්‍රාදේශීය සභාවට පත් වු බවත් ප්‍රකාශ කරන ලදි.මා මෙය අවස්ථාවක් කර ගන්නවා මා වෙනුවෙන් ඡන්දය ලබාදුන් නොදුන් සියලුම දෙනාට ස්තූතිය පුද කිරීමට බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එල්.වානු සිසිර කුමාර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ජී.ජයතිස්ස මැතිතුමා**

මම මෙවර ප්‍රාදේශීය සභාවට පත් වුයේ වැලිගමුව කාලාපයෙන්ය.මම ඩබ්.ජී.ජයතිස්ස,මම මේක අවස්ථාවක් කර ගන්නවා මට මෙතැනට පැමිණෙන්නට සහය දුන් පක්ෂයේ සියලුම දෙනාටත්, උදවු කළ සියලුම දෙනාටත් ස්තූති කිරීමට.මම සභාපතිතුමාගෙන් ඉල්ලා සිටින්නේ අපි විපක්ෂයේ වුණත් අපගේ වැඩ කටයුතු වලට ඔබතුමාට පූර්ණ සහයෝගය ලබා දෙන බවට පවසන ලදි.ඒ වගේම සභාවේ ඉදිරි වැඩ කටයුතු සඳහා

මාගේ සහයෝගය ලබා දෙන බවත්, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ජී.ජයතිස්ස මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී ඩබ්.ජී.කරුණාවති මැතිතුමිය**

ගරු සභාපතිතුමනි,මම නාරංබැද්ද කොට්ඨාශයෙන් සමගි ජනබල වේගයෙන් සභාවට පැමිණි බවත්,පක්ෂ භේදයකින් තොරව ඔබ සියලුම දෙනා සමඟ සහයෝගයෙන් සියලු වැඩ කටයුතු වලට මුහුණ දීමට සූදානම් වන බවත්, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී ඩබ්.ජී.කරුණාවති මැතිතුමිය විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී එම්.ආර්.එන්.එම්.ජයසුන්දර මැතිතුමිය**

මෙය අපගේ ප්‍රථම සභාවාරය නිසා මා ප්‍රථමයෙන්ම අවස්ථාවක් කර ගන්නවා 2025 වර්ෂයේ පළාත් පාලන මැතිවරණයෙන් ප්‍රාදේශීය සභාවට තේරීපත් වූ සභාපතිතුමාටත්,උපසභාපතිතුමාටත්,ඒ වගේම සභාවේ සියලුම මන්ත්‍රීතුමන්ලාටත්,මාගේ සුභාසිංශනය පළ කිරීමට,ඒ වගේම මම ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමාගේ නායකත්වයෙන් යුතු සමගි බල වේගය නියෝජනය කරමින් දැලිවල කලාපය තුළින් මා රඹුක්කන ප්‍රාදේශීය සභාවට තේරීපත් වුණ බව ප්‍රකාශ කරන ලදි.මා පිළිබඳ යම් හැඳින්වීමක් කරනවා නම් මම කැළණිය විශ්ව විද්‍යාලයේ ශාස්ත්‍රවේදී උපාධිධාරිණියක්,මානව සම්පත් කළමණාකරණ ඩිප්ලෝමාධාරිණියක් වගේම උපදේශන ඩිප්ලෝමාධාරිණියක් වෙනවා.ඒ වගේම කැළණිය විශ්ව විද්‍යාලයේ පශ්චාත් උපාධිය හදාරමින් සිටින බවත් පවසන ලදි.මාගේ උපරිම සහයෝගය ලබා දීමත්, මේ මන්ත්‍රීතුමන්ලා සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමට බලාපොරොත්තු වෙන බව ද ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී එම්.ආර්.එන්.එම්.ජයසුන්දර මැතිතුමිය විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටිකිරි බංඩා තෙන්නකෝන් මැතිතුමා**

මම ටී.එම්.ටී.බී.තෙන්නකෝන්,මම ඉදිරිපත් කරනවා මගේ නම මම ඒ ආකාරයට සඳහන් කරන ලෙසට,මා 1991 පළමුව ප්‍රාදේශීය සභාවට පැමිණියේ.පසුව මම නියෝජ්‍යනායකතුමා එහි මන්ත්‍රීධුරයෙන් මම ඉවත් කළා.එක්සත් ජාතික පක්ෂයේ නායකතුමා සජිත් ප්‍රේමදාස නායකතුමා මට නැවත මන්ත්‍රීධුරයක් ලබා දුන්නා.මම කොට්ඨාශයක් නියෝජනය කළේ නැත.ලැයිස්තුවෙන් පැමිණි බව පවසන ලදි.අද මම අනේක වාරයක් ස්තුතිවන්ත වෙනවා පක්ෂයේ නායක තුමාට එතුමා දුන් පොරොන්දු ඉෂ්ට කළා. පොරොන්දු දෙන එක දේශපාලනයේ ගොඩක් අය සිදු කරන දෙයක් හැබැයි ඉෂ්ට නොකරයි.තමුන්නාන්සේලාට අමුතුවෙන් පැවසීමට අවශ්‍ය නැත.දැන් තිබෙන නායකත්වය, රජය මහජනතාවට ලබාදුන් පොරොන්දු ඉෂ්ට කර නැත.මම ආඩම්භරයෙන් කියනවා අපේ නායකතුමා කීව ගමන් පොරොන්දු ඉෂ්ට කළා.ඒ නිසා මම මන්ත්‍රීවරයෙක් බවට පත් වුණා.මම සාධාරණය,යුක්තිය වෙනුවෙන් සටන් කළ පුද්ගලයෙක්ය.වැඩ කරන මිනිසෙක්.ඒ අනුව තමා මම ප්‍රකාශ කළේ.සභාපතිතුමනි,තමුන්නාන්සේලාගේ කටයුතු වලදී උපරිමයෙන් සහයෝගය දෙනවා.ඇත්ත මොකන්ද ඇත්තත් එක්ක සිටිනවා.බොරුව මොකක්ද ඒකට විරුද්ධ වෙනවා යනුවෙන් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී. බී.තෙන්නකෝන් මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

බොහොම ස්තුතියි, මන්ත්‍රීතුමන්ලාට මම හිතන්නේ තෙන්නකෝන් මන්ත්‍රීතුමාට අපිට පියෙක් වගේ නායකත්වය ලබා දිමට පුළුවන්. ඒ අනුව ප්‍රාදේශීය සභාවේ සියලුම මන්ත්‍රීතුමන්ලාට ඔවදන් ලබා දීම හැකියාව ඇත.ඔබතුමාගේ සේවය බණ්ඩය වී ඇත.රීතිවල තිබෙනවා සේවය බණ්ඩය වූ විට කොතැනටද යන්නේ කියලා. සභාවේ වැඩ කිරීමට ජොෂ්ඨත්ව අවශ්‍ය නොවන බව පවසන ලදි.

අවසානය
අද දින සභාවේ වැඩ කටයුතු සාර්ථක කර ගැනිමට සහය ලබා දුන් ආණ්ඩුපක්ෂයේ ගරු උපසභාපතිතුමා ප්‍රමුඛ පක්ෂ විපක්ෂ ගරු මන්ත්‍රීවරුන් ,ගරු මන්ත්‍රීවරියන්ටත් සභාවේ ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයටත්,මාධ්‍ය වේදීන්ටත් ස්තූතිය පුද කරමින් සභාවේ වැඩ කටයුතු ප.ව 1.40 ට පමණ අවසන් කරන ලදි.

ආර්.එම්.එස්.එස්.බී.රත්නායක
සභාපති,
රඹුක්කන ප්‍රාදේශීය සභාව,